# වාර්ෂික වාර්තාව
# 2012

CCB

## පොල් වගා කිරීමේ මණ්ඩලය

"කප්තුරු පියස"
428/9, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය





# දැක්ම

ශ්‍රී ලංකාව ලෝකයේ වඩාත්ම කාර්යක්‍ෂම පොල් නිෂ්පාදකයා කරවීම.

# මෙහෙවර

ශ්‍රී ලංකාව දේශීය පරිභෝජන ඉල්ලුම සහ අපනයන අවශ්‍යතාවය සපුරාලමින්, ස්වයංපෝෂිත තත්ත්වය ළඟා කර ගැනීම පිණිස ඵලදායී උපදේශන හා ව්‍යාප්ති සේවාවක් මඟින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමත්, පොල් ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම තුළින් පොල් වගාකරුවාට ඉහළ ජීවන මට්ටමක් සාක්ෂාත් කරවීම අපගේ මෙහෙවර වේ.



**පොල් වගා කිරීමේ මණ්ඩලය**

# අන්තර්ගතය


හැඳින්වීම ............................................................ 02

පොල් වගාකිරීමේ මණ්ඩලය ගැන සැකෙවින් ............... 04 - 08

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සුවිශේෂී කාර්යයන් ....... 09 - 11

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යුහය ................................ 12

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය ....... 13

අධ්‍යක්ෂ මණ්ඩලය 2012.................................................. 14

සභාපතිතුමාගේ පණිවිඩය......................................... 15 - 18

පොල් සංවර්ධන වැඩසටහන - 2012 ......................... 19 - 40

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති කටයුතු ........... 41 - 48

ආදර්ශ පොල් උයන් ................................................ 49 - 54

මානව සම්පත් කළමනාකරණය ............................... 55 - 57

ගිණුම්කරණය ......................................................... 58 - 62

අභ්‍යන්තර විගණනය ................................................ 63 - 66

විගණකාධිපතිගේ වාර්තාව ....................................... 67 - 75

විගණකාධිපතිගේ වාර්තාව ගැන පැහැදිලි කිරීම ............ 76 - 84

දමිළ පරිවර්තනය .................................................... 85 - 171

ඉංග්‍රීසි පරිවර්තනය ................................................ 172 - 255

# වාර්ෂික වාර්තාව - 2012

2012 ජනවාරි මස 01 වෙනි දින සිට 2012 දෙසැම්බර් 31 වෙනි දින දක්වා කාලය තුළ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය මෙම වාර්තාවට ඇතුළත් කොට ඇත.

## හැදින්වීම

1971 අංක 46 දරණ පොල් සංවර්ධන ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ ඇති බලතල අනුව 1972 මාර්තු 03 වෙනි දින නිකුත් කරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව පොල් වගාකිරීමේ මණ්ඩලය ස්ථාපිත කරන ලදී. දිවයිනේ පොල් වගාව සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර වඩාත් විධිමත්ව හා ඵලදායිතාවයෙන් යුක්තව සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 18 ක්, පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන 02 ක්, තවාන් 38 ක්, ආදර්ශ පොල් උයන් 12 ක් හා බීජ නිෂ්පාදන ඒකකය කින් සමන්විත වේ.

පොල් වගාකිරීමේ මණ්ඩලය, 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ අංක 01 යටතේ දිවයිනේ පොල් වගාවේ සංවර්ධනය අරමුණු කොට වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් 1972 මාර්තු මස 30 වෙනි දින ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයකින් පිහිටුවනු ලැබීය.

එකී පනතේ ප්‍රකාරව මණ්ඩලයේ කාර්ය භාරය පහත දැක්වෙන අයුරු අර්ථ දක්වා ඇත.

- පොල් වගා කළ ඉඩම්වල ඵලදාව වර්ධනය කිරීම හා එලෙස වර්ධනය කිරීමේලා සහාය වීම.
- ඉඩම්වල පොල් වගාකිරීම, ඒවා වගාකිරීම වැඩිදියුණු කිරීම හා විධිමත් කිරීමට සහාය වීම.
- (තෘණ ඇතුළුව)වෙනත් වගාවන්ගෙන් අතුරු වගාව සඳහා සුදුසු පොල් වගා කළ ඉඩම් තෝරා ගැනීම හා එකී ඉඩම්වල අතුරු වගා වැඩපිළිවෙල වැඩි දියුණු කිරීම, මෙහෙයවීම, පවත්වාගෙන යාම සහ පවත්වාගෙන යාමට සහාය වීම.
- පොල් වගා කළ ඉඩම්වල සත්ත්ව පාලනය වැඩි දියුණු කිරීම හා විධිමත් කිරීම, ඊට සහාය වීම හා එහි නියුක්ත වීම.
- පොල් වගාකළ ඉඩම්වල පොල් හා වෙනත් බෝග වැවීම සම්බන්ධයෙන් නිසි වගා ක්‍රම විස්තර කිරීම, ජනප්‍රිය කිරීම, වැඩි දියුණු කිරීම හා මෙහෙයවීම.
- පොල් කර්මාන්තයට සහාය වීම, උපදේශක හා ව්‍යාප්ති සේවකයින් පුහුණු කිරීම.

# ඉලක්ක

- පොල් පරිභෝජනය කරන්නන්ගේ හා සැකසුම්කරුවන්ගේ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් වන ලෙස ගෙඩි ඵලදාවේ තිරසාරභාවය තහවුරු කිරීම සඳහා පොල් ගස් ගහණය වැඩි කිරීම.
- සත්ත්ව පාලන/ අතුරු බෝග විවිධාංගීකරණය හරහා පොල් ඉඩම්වල ඵලදායීතාවය හා ගොවිපළ ආදායම වැඩි කිරීම.
- පොල් වගා සහ සුළු හා මධ්‍ය පරිමාණ පොල් ආශ්‍රිත කර්මාන්ත කෙරෙහි යොමු කරනු වස් කුඩා ඉඩම් හිමියන් ප්‍රජා මූල සංවිධානය ඔවුන් සඳහා රැකියා අවස්ථා ජනිත කර දිළිඳුකම පිටු දැකීම.
- රටේ ආහාරමය හා කර්මාන්ත ඉල්ලුම සපුරාලීම සඳහා 2016 වන විට වාර්ෂික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3650 දක්වා ඉහළ නැංවීම.
- පොල් වගාකිරීමේ මණ්ඩලයේ සියලු පොල් වතු ආදර්ශ පොල් උයන් තත්වයට පත් කිරීම හා ලාභය 2016 වන විට 20%කින් වැඩි කිරීම.

# අරමුණ

- ශ්‍රී ලංකාව තුළ තිරසාර පොල් වගාවක් ස්ථාපනය කිරීම
- පොල් ඉඩම් සඳහා සුදුසු අතුරුබෝග වගාකිරීමෙන් පොල් ඉඩම්වල උපයෝගීතාවය ඉහළ දැමීම.
- කප්රුක පුරවර වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීම.
- කාබනික හා අකාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- පොල් ඉඩම් තුළ පාංශු හා ජල සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම.
- පලිබෝධ හා රෝගවලින් පොල් වගාවට වන හානිය අඩු කිරීම.
- පොල් වගාකරුවන්ගේ කුසලතා සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන්, වගාකරුවන් දැනුවත් කිරීම සඳහා යොදා ගැනීම.
- ඉල්ලුම් පදනම් කරගත් ව්‍යාප්ති සේවාවන් පවත්වාගෙන යාම සහ උසස් තත්ත්වයේ යෙදවුම් ලබාදීම.
- ගෘහස්ථ පරිභෝජනයට, පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ට හා විදේශීය වෙළඳපලට අවශ්‍ය වන පොල් ප්‍රමාණය රට තුළ නිෂ්පාදනය කිරීම.

# පොල් වගාකිරීමේ මණ්ඩලය ගැන සැකවින්...

## ප්‍රධාන කාර්යාලය

පොල් වගාකිරීමේ මණ්ඩලය,
කජ්රුැක පියස,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
දුරකථන - 0115 639833, 0115 548998, 0115 549504
ෆැක්ස් - 0115 549507
විද්‍යුත් තැපෑල - ccb@sltnet.lk
වෙබ් අඩවිය - coconut.gov.lk

## පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයන්

ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය
බැණ්ඩියමුල්ල,
ගම්පහ.
033-3333037

කළුතර ප්‍රාදේශීය කාර්යාලය
නාගොඩ,
කළුතර.
034-2222732

රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය
නව නගරය,
කෙළින් වීදිය,
රත්නපුරය.
045-2228561

මාරවිල ප්‍රාදේශීය කාර්යාලය
මුදුකටුව,
මාරවිල.
032-2254237

මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය
හුලංදාව දකුණ,
මොණරාගල.
055-2276058

අම්පාර ප්‍රාදේශීය කාර්යාලය
ධර්මපාල මාවත,
කච්චේරිය ඉදිරිපිට,
අම්පාර.
063-2222477

මාතර ප්‍රාදේශීය කාර්යාලය
කච්චේරි සංකීර්ණය,
මාතලේ.
066-2222047

මාතර ප්‍රාදේශීය කාර්යාලය
අංක 331/9,
අනගාරික ධර්මපාල මාවත,
නුපේ,
මාතර.
041-2222060

යාපනය ප්‍රාදේශීය කාර්යාලය
අංක 595/ 10,
නාවලර් පාර,
නල්ලූර්,
යාපනය.
021-2226014

කුලියාපිටිය ප්‍රාදේශීය කාර්යාලය
අංක 20,
පන්නල පාර,
කුලියාපිටිය.
037-2281169

කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය
නුවර පාර,
කරඬුපන,
කෑගල්ල
035-2222120

ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය
ලබුදූව,
අක්මීමන,
ගාල්ල.
091-2234501

කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය
වෑහර,
කුරුණෑගල.
037-2222534

අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය
111 පියවර,
දහයියාගම හන්දිය,
අනුරාධපුරය.
025-2222543

හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලය
අංක 27,
තංගල්ල පාර,
හම්බන්තොට.
047-2220144

පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය
නව නගරය,
පොළොන්නරුව
027-2222377

මඩකළපුව ප්‍රාදේශීය කාර්යාලය
මයිලම්බවේලි,
තන්නමුනෙයි,
මඩකළපුව
065-2240103

ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය
පුල්මුඩේ පාර,
කුඹුරුප්පිඩ්ඩි,
ත්‍රිකුණාමලය.
026-3207044

## පොල් සංවර්ධන නිලධාරී කොට්ඨාශ 225ක්

පොල් සංවර්ධන නිලධාරීන් 325 ක්

## පොල් පැළ තවාන් 38

වල්පිට පොල් පැළ තවාන,
වල්පිට,
කොටදෙණියාව.
033-2272559

කිරිඳිවැල පොල් පැළ තවාන
කිරිඳිවැල.
033-2267704

එරමිණිගොල්ල පොල් පැළ තවාන
හිරිවඩුන්න.
035-2265806

මත්තමගොඩ පොල් පැළ තවාන
මත්තමගොඩ,
කනන්තොට.
035-2289105

කොරොස්දූව පොල් පැළ තවාන
කොරොස්දූව,
වාද්දූව.
038-2295126

ඉබ්බාගමුව පොල් පැළ තවාන
තෝරයාය,
ඉබ්බාගමුව.
037-2235776

දොඩම්ගස්ලන්ද පොල් පැළ තවාන
බලවත්තල වත්ත,
දොඩම්ගස්ලන්ද.
037-2252625

වාරියපොළ පොල් පැළ තවාන
වාරියපොළ.
037-2267691

නිකවැරටිය පොල් පැළ තවාන
නිකවැරටිය.
037-3988035

වෙන්නෝරුව පොල් පැළ තවාන
මුතුගල වත්ත,
වෙනනෝරුව.
037-2249836

පොල්ගහවෙල පොල් පැළ තවාන
සෙරපිස් වත්ත, කෑගල්ල පාර,
පනලිය, පොල්ගහවෙල.
037-2244367

දියදොර පොල් පැළ තවාන
පහළ දියදොර.
037-2282537

බිංගිරිය පොල් පැළ තවාන
ප්‍රසන්නගම,
බිංගිරිය.
032-2246425

හෙට්ටිපොළ පොල් පැළ තවාන
මලගනේ,
හෙට්ටිපොළ
037-2291332

කන්දෙටිය පොල් පැළ තවාන
කන්දෙටිය,
මාකඳුර, ගෝනවිල
031-2299938

කිරිමැටියාන පොල් පැළ තවාන
කිරිමැටියාන,
ලුණුවිල.
031-2257504

විල්පොත පොල් පැළ තවාන
විල්පොත,
බත්තුළුඔය.
032-5671077

අට්ටවිල්ලුව පොල් පැළ තවාන
අට්ටවිල්ලුව,
පුත්තලම.
032-5670793

මැදමුලන පොල් පැළ තවාන
මැදමුලන,
වීරකැටිය.
047-2246359

ඇඹිලිපිටිය පොල් පැළ තවාන
තුංකම,
ඇඹිලිපිටිය.
047-2230569

වැලිගම පොල් පැළ තවාන
පාතේගම,
වැලිගම.
041-2252336

බද්දේගම පොල් පැළ තවාන
පෙඩ්රූවත්ත,
හල්පතොට,
බද්දේගම.
091-2292745

ලබුදූව පොල් පැළ තවාන
ලබුදූව,
අක්මීමන.
091-2234501

පල්ලෙකැලේ පොල් පැළ තවාන
පල්ලෙකැලේ,
කෙන්ගල්ල.
081-5740595

උහන පොල් පැළ තවාන
පාලම් කඳවුර,
උහන.
063-2632167

පරාක්‍රම සමුද්‍රය පොල් පැළ තවාන
රිවඩ් අලුවිහාරේ උද්‍යානය.
පොළොන්නරුව.
027-2224304

උල්හිටිය පොල් පැළ තවාන
උල්හිටිය,
ගිරාඳුරුකෝට්ටේ.
027-2179230

කලාවැව පොල් පැළ තවාන
කලාවැව,
විජිතපුර.
025-2264194

හඳපානාගල පොල් පැළ තවාන
ඇතිලිවැව,
හඳපානාගල.
055-2274665

වැලිපිටිය පොල් පැළ තවාන
වැලිපිටිය වත්ත,
නන්නපුරාව.
055-2265720

මයිලම්බවේලි පොල් පැළ තවාන
මයිලම්බවේලි,
වෙන්කලඩි,
තන්නමුනෙයි.
065-2240924

කුඹුරුප්පිඩ්ඩි පොල් පැළ තවාන
ප්‍රධාන පාර,
කුඹුරුප්පිඩ්ඩි,
ත්‍රිකුණාමලය.
026-3207042

අච්චුවේලි පොල් පැළ තවාන
විසාවිලාන්පාර,
අච්චුවේලි,
යාපනය

වල්ලිපුනම් පොල් පැළ තවාන
වල්ලිපුනම්,
පුදුකුඩිඉරුප්පු.

අලම්පිල් පොල් පැළ තවාන
අලම්පිල්,
මුලතිව්.

මහයාය පොල් පැළ තවාන
මකඳුර,
ගෝනවිල.

මයුරපුර පොල් පැළ තවාන
හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලය
අංක 27,
තංගල්ල පාර,
හම්බන්තොට.
047-2220144

කිලිනොච්චි පොල් පැළ තවාන
පන්නාණ්කන්ඩි,
කිලිනොච්චිය.

## ආදර්ශ බීජ පොල් උයන් 12

මහයාය ආදර්ශ පොල් උයන
මාකඳුර,
ගෝනවිල.
031-2299781

ඩේසිවැලි ආදර්ශ පොල් උයන
මාවතගම.
037-3379418

රන්දෙණිය ආදර්ශ පොල් උයන
වාරියපොළ.
037-4923041

ලේනව ආදර්ශ පොල් උයන
හිරියාල,
ලේනව.
037-4924189

බෝපිටිය ආදර්ශ පොල් උයන
කු/ බෝපිටිය.
037-2288601

නාගන්සෝල ආදර්ශ පොල් උයන
වන්නි,
රස්නායකපුර.
037-3975050

ගර්ට්ලන්ඩ් ආදර්ශ පොල් උයන
නාඹිරිත්තන්කඩවර,
වැලිපැන්නගහමුල්ල.
037-4930928

කොහොඹාන ආදර්ශ පොල් උයන
ගොනාගොල්ල.
063-3632186

කොරෙයි ආදර්ශ පොල් උයන
තිරුක්කෝවිල්.
063-3694530

මුන්දලම ආදර්ශ පොල් උයන
මුන්දලම.
032-2224201

පාසිකුඩා ආදර්ශ පොල් උයන
කල්කුඩා
065-3659028

පලෙයි ආදර්ශ පොල් උයන
පලෙයි
021-3201380

## පුහුණු මධ්‍යස්ථාන 02 ක්

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය
බණ්ඩිරිප්පුව වත්ත,
ලුණුවිල.
031-2255048

දක්ෂිණ ලංකා පොල් සංවර්ධණ පුහුණු මධ්‍යස්ථානය
මැදමුලන,
වීරකැටිය.
047-2257534

## ස්ථිර කාර්ය මණ්ඩලය 925ක්

| | |
|---|---|
| සාමාන්‍යාධිකාරී | 01 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 04 |
| සහකාර සාමාන්‍යාධිකාරී | 08 |
| ප්‍රාදේශීය කළමනාකරුවන් හා | |
| විෂයභාර කළමනාකරුවන් | 36 |
| සහකාර කළමනාකරුවන් | 82 |
| භාෂා පරිවර්ථකයින් | 02 |
| කළමනාකරණ සහකාර | |
| (තාක්ෂණික) | 365 |
| කළමනාකරණ සහකාර | |
| (තාක්ෂණික නොවන) | 276 |
| ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් | 151 |

| | |
|---|---|
| **බීජ නිෂ්පාදන ඒකකයක්** | බීජ නිෂ්පාදන ඒකකය<br>අංක 19,<br>තම්මිට පාර,<br>මීගමුව.<br>031-2226119 |
| **පොල් සංස්කෘතික උද්‍යානයක්** | පොල් සංස්කෘතික උද්‍යානය,<br>පාසිකුඩා ආදර්ශ පොල් උයන,<br>කල්කුඩා.<br>065-2050224 |
| **නිලධාරී නිවාස** | අනුරාධපුරය නිලධාරී නිවාසය,<br>අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය,<br>පොල් වගාකිරීමේ මණ්ඩලය,<br>111 පියවර, දහයියාගම හන්දිය,<br>අනුරාධපුරය.<br>025-3243554<br><br>බෝපිටිය නිලධාරී නිවාසය,<br>බෝපිටිය ආදර්ශ පොල් උයන,<br>කු/ බෝපිටිය.<br>037-2288601<br><br>පලෙයි නිලධාරී නිවාසය,<br>පලෙයි ආදර්ශ පොල් උයන<br>පලෙයි.<br>021-2050013<br><br>හඳපානාගල නිලධාරී නිවාසය,<br>හඳපානාගල පොල් පැළ තවාන,<br>වෙහෙරයාය.<br>055-2274665<br><br>පාසිකුඩා නිලධාරී නිවාසය,<br>පාසිකුඩා ආදර්ශ පොල් උයන,<br>කල්කුඩා.<br>065-2050224<br><br>කතරගම සහ නිලාවේලි හි නිල නිවාස ඉදිවෙමින් පවතී. |
| **කප්තුරුපාය සල්පිල්** | මහයාය ආදර්ශ පොල් උයන<br>මාකඳුර,<br>ගෝනවිල.<br>031-2299781<br><br>පොල් වගාකිරීමේ මණ්ඩලය,<br>කප්රුක පියස,<br>ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>බත්තරමුල්ල.<br>0115 639833<br><br>අම්පාර, බෝපිටිය හා ඩේසිවැලි ප්‍රදේශයන්හි කප්තුරුපාය නව අලෙවිසැල් ඉදිවෙමින් පවතී. |

# පොල් වගාකිරීමේ මණ්ඩලයේ සුවිශේෂී කාර්යයන්

| | |
|---|---|
| ජාත්‍යන්තර පොල් දිනය | 2012 වර්ෂයේදී ජාත්‍යන්තර පොල් දිනය සමරමින් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් අරලියගහ මන්දිරයේ දී පැවති ජනහමුවේදී සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරමින් 6,000කට ආසන්න පොල් වගාකරුවන් පිරිසක් කප්රුක සමිති හරහා අගනුවර වෙත කැඳවා ගෙන ඒමට හා ඔවුන්ට අවශ්‍ය සියළුම පහසුකම් ලබාදීමෙන් හා සංවිධානය කිරීමෙන් අපගේ ශක්තිය විදහා පෑමට අපට හැකිවිය. |
| දැයට කිරුළ ප්‍රදර්ශණයේ දී 04 වන ස්ථානය | 2012 වසරේ අනුරාධපුර ඔයාමඩුවේ දී පැවති දැයට කිරුළ ප්‍රදර්ශණයේ දී නව අමාත්‍යාංශය ජයග්‍රහණයේ මාවතට යොමු කරවමින්, සමස්ථ ප්‍රදර්ශනයේ 04 වන ස්ථානය ලබාදීමට අවශ්‍ය පුරෝගාමී වැඩ කොටස ඉටු කරන ලදී. |
| රුපියල් මි. 123 ක ශුද්ධ ලාභයක් රාජ්‍ය මුදල් ප්‍රවාහයට | ඉහළ කළමනාකරණ තත්ත්වයන් යටතේ පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් ආදර්ශ පොල් උයන්වලින් මෙම වර්ෂය තුළ රුපියල් මිලියන 123ක පමණ ශුද්ධ ලාභයක් ලබා එය රාජ්‍ය මුදල් ප්‍රවාහයට එක් කිරීමට හැකි විය. |
| නව බඳවා ගැනීමේ පටිපාටිය අනුමතයි | වසර ගණනාවක් පුරා අනුමත නොවී පැවති ආයතනයේ නව බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරවා ගැනීම මඟින් 50%කට ආසන්න පුරප්පාඩු පිරවීම ආරම්භ කිරීම. |
| පොල් පැළ මිලියන 9ක නිෂ්පාදනයක් | වර්ෂ 2016 දී පොල් පැළ මිලියන 32ක වේගවත් ඉලක්කයක් කරා යෑම අරමුණු කර ගනිමින් ඉතිහාසයේ ප්‍රථම වරට වාර්තා ගත ඉලක්කයක් සඳහා වාර්ෂික පොල් පැළ මිලියන 9ක් නිෂ්පාදනය හා බෙදාහැරීම. |
| වැලිගම පොල් කොළ කුණුවීමේ රෝග කළමනාකරණය | වැලිගම පොල් කොළ කුණුවීමේ රෝග කළමනාකරණ වැඩසටහන යටතේ 2008 වර්ෂයේ සිට මේ දක්වා ඉවත් කරන ලද මුළු පොල් ගස් ප්‍රමාණයට වඩා ඉහළ අගයකින් යුත් රෝගී පොල් ගස් 80,000ක් පමණ ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට මෙම වර්ෂයේදී හැකිවිය. |
| කප්රුක පුරවර වැඩසටහන | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු ඇමතිතුමාගේ සංකල්පයකට අනුව ආරම්භ කරන ලද කප්රුක පුරවර වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 36ක් කප්රුක පුරවර බවට පත් කෙරුණු අතර, ඒ හරහා සමස්ථ පොල් වගාකරුවන්ගේ හා |

කර්මාන්තකරුවන්ගේ එකමුතුවෙන් ඇති කළ කප්රුක ප්‍රජා සමිති ගණන 1,768කි.

**පොල් සංවර්ධන නිලධාරී තනතුරු 325 ක්**

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු ඇමතිතුමාගේ උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් 160ක්ව තිබූ පොල් සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව 325ක් දක්වා වූ මට්ටමට ගෙන ඒම සහ ඒ යටතේ පොල් සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම ආරම්භ කිරීම.

**ප්‍රජා පොල් පැළ තවාන්**

ජාතික මට්ටමින් කප්රුක පුරවර පොල් වගාකරුවන්ට ආර්ථික ප්‍රතිලාභ ලබාදීම අරමුණු කොට නව සංකල්පයකට යොමු වෙමින් ප්‍රජා පොල් පැළ තවාන් ආරම්භ කර පොල් වගාකරුවන්ට රුපියල් මිලියන 56.064ක ප්‍රතිලාභයක් ලබාදීමට හැකිවීම.

**ජාලගත මෙහෙයුම් පද්ධතියක්**

නිලධාරීන්ගේ කාලය, ශ්‍රමය සහ වියදම අවම කරමින් මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන්වල දෛනික සවිස්තරාත්මකව තොරතුරු අන්තර්ජාලය ඔස්සේ දීප ව්‍යාප්තව රැස් කරමින්, පසුවිපරමකින් ද සමන්විත වූ ජාලගත මෙහෙයුම් පද්ධතියක් ස්ථාපනය කිරීමට දායක වීම.

**යන්ත්‍රෝපකරණ සහ කාර්යාලයීය උපකරණ**

මණ්ඩලයේ සියළුම ප්‍රාදේශීය කාර්යාල, ආදර්ශ පොල් උයන් සහ තවාන්වලට අඩුපාඩු වූ යන්ත්‍රෝපකරණ සහ කාර්යාලයීය උපකරණ බෙදා දී, ඒ තුළින් මණ්ඩලයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීත්වය ඉහළ නැංවීම අරමුණ කර ගනිමින්, ට්‍රැක්ටර් 12ක්, ට්‍රැක්ටර් ට්‍රේලර් 19ක්, අත් ට්‍රැක්ටර් 4ක් සහ යතුරුපැදි 4ක් ද විද්‍යුත් උපකරණ වශයෙන් පරිගණක 20ක්, ෆැක්ස් යන්ත්‍ර 12ක්, ෆොටෝ කොපි යන්ත්‍ර 10ක්, මාධ්‍ය උපකරණ 07ක්, රැගෙන යා හැකි පරිගණක දත්ත ගබඩා තැටි 10ක් (External storage), හෙඩ් ෆෝන් 15, ප්‍රොජෙක්ෂන් ස්ක්‍රීන් 15ක්, වෙබ් කැම් 15, යූ.පී.එස් 11ක්, බහුවිධ පරිගණක මුද්‍රණ යන්ත්‍ර 09ක් හා කැමරා 10ක් ද බෙදා දෙන ලදී.

**නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය හා ඒකාබද්ධ කොට නව ප්‍රාදේශීය කාර්යාලයක්**

උතුරු පළාත තුළ එක් ප්‍රාදේශීය කාර්යාලයක් ලෙස එතෙක් පැවති යාපනය ප්‍රාදේශීය කාර්යාලයට අයත් මුලතිව් දිස්ත්‍රික්කය, යුද්ධය අවසන් වී සාමය උදාවීමත් සමගම නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය හා ඒකාබද්ධ කොට නව ප්‍රාදේශීය කාර්යාලයක් බිහි කිරීමේ පුරෝගාමී කටයුත්තක් ආරම්භ කිරීම. ඒ අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුඹුරුප්පිඩි ප්‍රදේශයේ නව ප්‍රාදේශීය කාර්යාලය විවෘත කරන ලදී.

**අලුත් අවුරුද්දට පහසු මිලට මාළු පොල් අලෙවිය**

සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය සැමරීම සඳහා මහජනතාවගේ පොල් අවශ්‍යතාවයන් සපුරාදීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ඒකාබද්ධව රටපුරා දියත් කෙරුණු අවුරුදු පොලවල් හරහා පහසු මිලට මාළු පොල් අලෙවිය සිදු කිරීම.

| | |
|---|---|
| මයිටා විලෝපික අභිජනන විද්‍යාගාරයක් අම්පාරටත් | දිවයින පුරා පැතිර පවතින මයිටා පලිබෝධ උවදුර මර්ධනය කිරීම සඳහා මයිටා විලෝපික අභිජනන විද්‍යාගාර පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ අභිජනන විද්‍යාගාරය අම්පාර ප්‍රාදේශීය කාර්යාලයට අනුබද්ධව ආරම්භ කරන ලදී. |
| රතු කුරුමිණි පලිබෝධන ක්‍රමවේදය නව මඟකට | පෙරමෝන භාවිතයෙන් රතු කුරුමිණි පලිබෝධන ක්‍රමවේදය නව මඟකට යොමු කරමින් විශාල ප්‍රදේශයක් පුරා ආවරණය වන පරිදි රතු කුරුමිණි මර්ධන ව්‍යාපාරයක් පොළොන්නරුවේ මහවැලි කලාපයෙන් ආරම්භ කරන ලදී. |
| 2006 සිට 2011 දක්වා වාර්ෂික වාර්තා 2012 වර්ෂයේදී | විවිධ හේතූන් මත එළිදැක්වීමට නොහැකි වූ 2006 වසරේ සිට 2011 වසර දක්වා වාර්ෂික වාර්තා 2012 වර්ෂයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සභාගත කරන ලදී. |
| විශේෂිත වූ පොල් උයන් | පොල් වගාකිරීමේ මණ්ඩලය සතු වූ ආදර්ශ බීජ පොල් උයන්වලින් තෝරා ගත් විශේෂිත වූ පොල් උයනක් ලෙස ලේනව, ඩේසිවැලි, රන්-දෙණිය සහ නාගන්සෝල වතු භෞතිකව හා ඵලදායී ඒකක ලෙස වැඩිදියුණු කරන ලදී. |
| තොරතුරු මධ්‍යස්ථාන | රටපුරා සිටින පොල් වගාකරුවන් හට සහ පොල් ආශ්‍රිත නිපැයුම්ක-රුවන්ට ඉතා පහසුවෙන් සමස්ථ පොල් ක්ෂේත්‍රයේ තොරතුරු ලබා ගැනීමට ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන පිහිටුවීම ආරම්භ කරන ලදී. |
| නිලධාරී ආකල්ප, දැනුම සහ කුසලතා සංවර්ධනය | සමස්ථ කාර්යාලයීය මට්ටමේ නිලධාරීන් සහ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් පුහුණු කර, ඔවුන්ගේ ආකල්ප, දැනුම සහ කුසලතා සංවර්ධනය වැඩි කර, එතුළින් කාර්යක්ෂමතාවය සහ ඵලදායිත්වය ඉහළ නැංවීම පෙරදැරි කරගෙන පුහුණු අවස්ථාවන් ලබාදෙන ලදී. ඒ අනුව කළමනාකරණ සහකාර මට්ටමේ නිලධාරීන් පුහුණු 120ක් ද, තාක්ෂණික මට්ටමේ නිලධාරීන් 388ක් ද, පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන මඟින් පුහුණු කරන ලදී. |
| 2600 සම්බුද්ධත්ව ජයන්ති වැඩසටහන | 2600 සම්බුද්ධත්ව ජයන්ති වැඩසටහට සමගාමීව බෞද්ධ විහාරස්ථාන භූමිවල පොල් පැළ සිටුවීමේ වැඩසටහන තවදුරටත් පුළුල් කරමින් අනෙකුත් ආගමික මධ්‍යස්ථානවල ද පොල් පැළ සිටුවීම සිදුකරන ලදී. |

# පොල් වගාකිරීමේ මණ්ඩලය කාර්ය මණ්ඩල ව්‍යුහය



# පොල් වගා කිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය



# අධ්‍යක්ෂ මණ්ඩලය 2012

2012 වසරේදී මෙම මණ්ඩලයේ සභාපති වශයෙන් සරත් කීර්තිරත්න මහතා කටයුතු කළ අතර, පහත නම් සඳහන් අය අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් කටයුතු කරන ලදී.

| | | |
|---|---|---|
| 1. සරත් කීර්තිරත්න මහතා | - | සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය |
| 2. ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා | - | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිත |
| 3. මුදිතා අන්ද්‍රාහන්නදි මිය | - | මුදල් අමාත්‍යාංශයේ නියෝජිත |
| 4. එච්.ඒ.විමලසූරිය මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 5. මොන්ටේගු සරත්චන්ද්‍ර මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 6. මහාචාර්ය එච්. පී. එම්. ගුණසේන මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 7. රමල් අශෝක් සූරගේ මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 8. පූජ්‍ය ලංකාතිලක අරියධම්ම ස්වාමීන් වහන්සේ | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 9. කේ.ඩී.ජී. ප්‍රේමරත්න මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 10. යූ. මහින්ද සිල්වා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

# සභාපතිතුමාගේ පණිවිඩය



සරත් කීර්තිරත්න,
සභාපති,
පොල් වගා කිරිමේ මණ්ඩලය.

ලක් රජය විසින් ස්ථාපිත කරන ලද කැබිනට් අමාත්‍යාංශ අතුරින් කැපී පෙනෙන, සුවිශේෂී සහ ජනී ජනයාගේ තුඩතුඩ රැව්දෙන කාර්යය භාරයක් ඉටු කළ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ "කප්රුක නවෝදාව" සංයුක්ත සැලැස්මෙන් සන්නද්ධ වූ පොල් වගාකිරීමේ මණ්ඩලය 2012 වසරට පා නැඟුවේ මහත් අභිමානයෙන් යුක්තවය.

වසර 2016 දී පොල් ගෙඩි මිලියන 3,650 ක ඉලක්කයක් සමඟ පොල් ඉඩම් ඵලදායීත්වයෙන් ඉහළටම නංවමින් පොල් ඉඩමෙන් උපරිම ආදායම ලබා ගැනීම පෙරදැරිව මෙම වසරේ සංවර්ධන වැඩසටහන්, ව්‍යාපෘති වැඩසටහන් සහ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

කප්රුකට මහින්ද චින්තනයේ ලබැදියාව පුනර්ජීවනය කිරීම උදෙසා, කප්රුක සමිති සාමාජිකයන් දහස් ගණනින් අරලියගහ මන්දිර ශාලාව පිරී ඉතිරී යන සේ කැඳවා පොල් වගා සංවර්ධනයට රජයේ කැපවීම රාජ්‍ය නායකයාගේ මුවින්ම ප්‍රකාශ කිරීමට හැකිවීම, මෙම වසරේ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය සහ පොල් වගාකිරීමේ මණ්ඩලය එක්ව ලැබූ සුවිශේෂී ජයග්‍රහනයකි.

වසර 2016 වනවිට ශ්‍රී ලංකාව පුරා පොල් පැළ ලක්ෂ 320 ක් සිටුවීමේ යෝධ ඉලක්කය එහි කාලවකවානුවට පෙර සාක්ෂාත් කර ගැනීම උදෙසා මෙම වසර තුල පොල් පැළ මිලියන 9 ක්ම නිෂ්පාදනය කිරීමට හැකිවීම සිහිපත් කරන්නේ මහත් අභිමානයෙන් යුක්තවය. මේ සඳහා අප අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාගේ මඟපෙන්වීම යටතේ අනෙකුත් සහෝදර ආයතන ලබාදුන් නොමද සහයෝගයට ගෞරවය පුදකර සිටිමි.

තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පොල් වගාවේ සෑම අංශයක්ම සංවර්ධනය කිරීම අරමුණු කර ගත් "කප්රුක පුරවර" වැඩසටහන යටතේ 2012 වසරේ දී දිවයින පුරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 36 ක ග්‍රාම සේවා වසම් මට්ටමින් කප්රුක සමිති 1,768 ක් පිහිටුවමින්, ප්‍රජා තවාන් 594 ක් හරහා පොල් පැළ 2,700,000 ක් නිෂ්පාදනය කරමින්, කලාප සමිති චක්‍රීය අරමුදල් සඳහා රු. මිලියන 7 ක ශක්තියක් ලබා දෙමින්, ප්‍රාදේශීය කාර්යාල 15 ක තොරතුරු මධ්‍යස්ථාන ඇති කරමින්, සමිති සාමාජිකයන්ගේ ව්‍යාපාර ශක්තියට අත්වැලක් ලබාදීමට ඩිමෝ බට්ටා රථ 62 ක් ලබා දෙමින් කප්රුක පුරවර ඉහළට ඔසවා තබන්නට මෙම වසර තුල දී අපට හැකිවිය.

2011 වසරේ දී මෙන්ම "ඉසුරුමත් නිවහනක්, අසිරිමත් මව්බිමක්" නිර්මාණය කරන්නට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අත්වැලක් වූ අප දිවිනැඟුම වැඩසටහන යටතේ පොල් පැළ මිලියන 2.7 ක් ලංකාව පුරා සිටුවීමට මේ වසරේ දී හැකියාව ලැබුණි.

ආසියානු පැසිපික් පොල් ප්‍රජාවේ කිසිදු රටක ක්‍රියාත්මක නොවන පාසැල් ළමුන් මඟින් පොල් පැළ සිටුවීමේ වැඩසටහන වන "කප්රුකයි සිප්නැණයි" වැඩසටහනෙහි පොල් පැළ ලක්ෂ 3 ක ඉලක්කය අභිබවා පොල් පැළ 344,000 ක් 6 වසර පාසැල් ළමුන් අතර බෙදාදීමට පොල් වගාකිරීමේ මණ්ඩලය ක්‍රියාකරන ලදී.

ලංකාවේ පොල් ඉඩම් ප්‍රමාණය වර්ධනය කර ගැනීම හා තිබෙන පොල් ඉඩම් ප්‍රමාණය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කෙරෙන ප්‍රධාන වැඩසටහන වන නව/නැවත/යටි පොල් පැළ වගා වැඩසටහනේ වාර්ෂික ඉලක්කය වන අක්කර 18,000 ක ප්‍රමාණය අභිබවා අක්කර 20,000 ක ප්‍රගතියක් ලබා ගැනීමට හැකිවීම මෙම වසර තුල දී ලබා ගත් තවත් විශේෂ ජයග්‍රහණයකි.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ 3.5% ත් 4% ත් අතර අවම සඵල පොලී අනුපාතයන් සහිත හා ගෙවූ පොලිය ආපසු ගෙවනු ලබන "කප්රුක ආයෝජන" ණය වැඩසටහන මඟින් රු.මිලියන 112.6 ක ණය පොල් වගාකරුවනට ලබා දී අක්කර 2,169 ක් පොල් ආශ්‍රිත ගොවිපලවල් බවට පත් කිරීම මෙම වසර තුල දී සිදු විය.

මෙයට අමතරව ප්‍රජා භූමි පොල් පැළ සිටුවීමේ වැඩසටහන, පොල් ඉඩම් පුනරුත්ථාපන පොල් පැළ සිටුවීමේ වැඩසටහන, කාබනික පොහොර ප්‍රවර්ධන වැඩසටහන, ජල සැපයුම් පද්ධති වැඩසටහන සහ සංවර්ධන වැඩසටහන සාර්ථකව දියත් කරන ලදී.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවත් එක් ප්‍රධාන කර්තව්‍යයක් වන තාක්ෂණික දැනුම, උපදෙස් හා නිපුණතා ලබාදීමේ ව්‍යාප්ති වැඩසටහන ද මෙම වසරේ සාර්ථකව ක්‍රියාත්මක වූ අතර, ඒමඟින් දිවයින පුරා වැඩසටහන් 7,663 ක් පවත්වා සහ

පුද්ගලිකව වගාකරුවන් හමුවීම තුලින් පොල් වගාකරුවන් 346,804 කටම ව්‍යාප්ති සේවාවේ සේවය ලබා දී ඇත.

මෙයට අමතරව ලුණුවිල සහ මැදමුලන පිහිටි අපගේ පුහුණු මධ්‍යස්ථාන තුලින් පුහුණු වැඩසටහන් 111 ක් පවත්වා ඇති අතර, එමගින් බිහිවූ පොල් වගා දැනුම සහිත මානව සම්පතෙහි සංඛ්‍යාව 6,621 ක් වන අතර, ස්ථානීය පුහුණුවීම්වලට අමතරව මෙම මධ්‍යස්ථානවලින් පවත්වන ලද “අඛණ්ඩ පුහුණු වැඩසටහන, රාජ්‍ය නිලධාරීන් පුහුණු වැඩසටහන, පාසැල් පුහුණු වැඩසටහන, ග්‍රාමීය නිලධාරි පුහුණු වැඩසටහන , ජනප්‍රසාදය දිනාගත් පුහුණු වැඩසටහන්” අතර විය.

පොල් වගාවේ මාරාන්තික රතු කුරුමිණි මර්ධනයේ පෙරමෝන භාවිතා නිර්දේශය යථාර්ථයක් බවට පත්කරමින් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ඇමතිතුමාගේ සංකල්පයට අනුව විශාල ප්‍රදේශයක පෙරමෝන් උගුල් ස්ථාපිත කිරීමේ උපායමාර්ගික වැඩසටහන සෙවනගල, රාජංගනය, පොළොන්නරුව, තඹුත්තේගම හා දෙහිඅත්තකණ්ඩිය යන ප්‍රදේශවල සාර්ථකව ක්‍රියාත්මක විය.

ශ්‍රී ලංකාවේ පොල් අස්වැන්නට 10% - 15% ප්‍රමාණයක බලපෑමක් ඇති කරමින් ලංකාව පුරා පැතිරී පවතින “මයිටා පලිබෝධ මර්ධනය” කිරීම සඳහා මයිටා විලෝපිත අභිජනන මධ්‍යස්ථාන 4 ක් අම්පාර, මුලතිව්, වාරියපොල සහ පලෙයි යන ස්ථානවල ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ අතර අම්පාර අභිජනන මධ්‍යස්ථානය විවෘත කරන ලදී.

සිරිලක දකුණු ප්‍රදේශයේ වැලිගම ආශ්‍රිතව පැතිරිගිය වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග කළමනාකරණ වැඩසටහන පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ නවමු ක්‍රමවේදය යටතේ තවදුරටත් ශක්තිමත්ව ක්‍රියාත්මක වූ අතර, එමගින් 2012 වසරේ ඉවත් කළ රෝගී ගස් ගණන 80,504 කි. මේ සඳහා රු.මිලියන 141 ක වන්දි මුදල් ප්‍රමාණයක් හානියට පත් වගාකරුවන් වෙත බෙදා දී ඇත.

කොළඹ නගරය අවට පොල් වගාකරුවන්ගේ සේවා අවශ්‍යතාවය සඳහා පිහිටා ඇති තොරතුරු ඒකකය මගින් නගරයේ සිටුවීම සඳහා පොල් පැළ 14,430 කට නිකුත් කර ඇති අතර, නාගරික ප්‍රජාවන්ගේ දෛනික පොල් අවශ්‍යතාවය සැපයීමට අනාගතයේ දි මෙය මනා පිටුවහල් වනු ඇත.

දැයට කිරුළ 2012 ජාතික ප්‍රදර්ශනයට සමගාමීව සුන්දර පරිසරය අභයගිරිය ස්ථූපයට මුහුණලා ඉදි කරන ලද කටුකැලියාව නිලධාරි සංචාරක නිවස පොල් වගාකිරීමේ මණ්ඩලයට දායාද කිරිමට හැකිවීම අපගේ තවත් සිහිනයක් මල්ඵල ගැන්වීමකි.

දේශීය පොල් ආශ්‍රිත නිෂ්පාදන ජනතාව අතර ජනප්‍රිය කිරීමේ සංකල්පයේ ආරම්භය සනිටුහන් කරමින් බත්තරමුල්ල කප්තුරුපාය 2012 වසරේ දී විවෘත කෙරෙනුයේ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ සුරතිනි.

2011 වසරේ දී මෙන්ම 2012 වසරේ දී ද අප වෙත ලැබුණු බොහෝ අභියෝග ජය ගන්නේ සේවක සංඛ්‍යාවෙන් අඩකටත් වඩා අඩු සංඛ්‍යාවක් යටතේ ඉතා අපහසුවෙනි. මෙම තත්වය මඟහැරවීම සඳහා අවශ්‍ය වන නව බඳවා ගැනීමේ පටිපාටිය මෙම වසර තුල අනුමත කරවා ගැනීම ලැබීම විශේෂතම ජයග්‍රහණයකි.

පොල් වගා තාක්ෂණය ප්‍රායෝගික අත්හදා බලමින් උසස් තත්ත්වයේ බීජ පොල් නිෂ්පාදනය සඳහා ආදර්ශමත් අයුරින් පවත්වා ගෙන යනු ලබන ආදර්ශ පොල් උයන් පොල් වගාකිරීමේ මණ්ඩලයේ සැගවුණු ශක්තියක් වන අතර, විශේෂයෙන් උතුරු නැගෙනහිර ඇතුළු අනෙකුත් ප්‍රදේශවල ආදර්ශ පොල් උයන්වල සංවර්ධන කාර්යන් වඩාත් වේගවත්ව සිදු කෙරිණි. 2012 වසර තුල දී රු.මිලියන 121 ක වාර්ථාගත ලාභයක් ලබා ගැනීමට හැකිවිය.

බොහෝ අභියෝග හමුවේ සුවිශේෂී ජයග්‍රහණයක් ලැබූ මෙම වසරේ වැඩසටහන සාර්ථක කර ගැනීම උදෙසා පොල් වගාකිරීමේ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලය මා වෙත ලබා දුන් සහයෝගයත්, අමාත්‍යාංශයට අනුබද්ධ සහෝදර ආයතනවල සභාපතිතුමන්ලා ඇතුළු කාර්ය මණ්ඩලය ලබාදුන් සහයෝගයත් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර ඇමතිතුමා එම ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය ලබාදුන් නොමඳ සහායත් ඉතා ඉහළින් අගය කරමි.



සරත් කීර්තිරත්න,

සභාපති,

පොල් වගාකිරීමේ මණ්ඩලය.

# 1. පොල් සංවර්ධන වැඩසටහන - 2012

පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම අනුව හා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද "කප්රුක නවෝදාව" ජාතික පොල් සංවර්ධන සැලැස්ම පරිදි 2012 වර්ෂයේදී පහත සඳහන් පොල් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

1. පොල් පැළ නිෂ්පාදන වැඩසටහන
2. කප්රුක පුරවර වැඩසටහන
3. දිවිනැගුම ගෙවතු වගා වැඩසටහන
4. කප්රුකයි සිප්ණැනයි වැඩසටහන
5. අක්කර 5 ට අඩු ඉඩම් සංවර්ධන වැඩසටහන
6. පූජා භූමි වැඩසටහන
7. පොල් ඉඩම් පුනරුත්ථාපන වැඩසටහන
8. කාබනික පොහොර ප්‍රවර්ධනය සඳහා පොල් ඉඩම්වල ගවගාල් ඉදිකිරීමේ සහනාධාර වැඩසටහන
9. පොල් ඉඩම්වල නල මගින් ජලය සැපයුම් පද්ධති ඉදිකිරීම
10. කප්රුක ණය ආයෝජන වැඩසටහන
11. විශේෂ වැඩසටහන

## 1.1 පොල් පැළ නිෂ්පාදන වැඩසටහන

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ නව දැක්ම හා නව සංයුක්ත සැලැස්ම අනුව 2016 වසර වන විට පොල් පැළ ලක්ෂ 320 ක් සිටුවීමේ දැවන්ත ඉලක්කය සපුරා ගැනීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් 2012 වර්ෂයේ දී පොල් පැළ නිෂ්පාදන ඉලක්කය වූ පැළ මිලියන 9 ක් නිෂ්පාදනය කිරීමට හැකිවීම ඉතා විශාල ජයග්‍රහණයකි. වසර 06ක් තුළ ඉටු කළ යුතු ඉලක්කය වසර



සංවර්ධන වැඩසටහන් සඳහා නිකුත් කිරීමට සූදානම් කර ඇති පොල් පැළ සමූහයක්



ජපන් උප අගමැතිතුමා අච්චුවේලි පොල් පැළ තවාන නිරීක්ෂණය කළ අයුරු

04ක් තුළදී, එනම් 2014 දී අවසන් කිරීමේ අභියෝගය ජය ගැනීමේ මූලික පියවර මෙයයි.

මෙම වැඩසටහන සඳහා අවශ්‍ය කරන බීජ පොල්, පොල් වගාකිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය, හලාවත වැවිලි සමාගම, කුරුණෑගල වැවිලි සමාගම, ජාතික පශු සම්පත් මණ්ඩලය, උසස් තත්ත්වයේ පුද්ගලික පොල් ඉඩම්වලින් බීජ පොල් තේරීමේ ක්‍රමවේදයට අනුව තෝරා ගන්නා ලද උසස් තත්ත්වයේ මව් ශාකවලින් ලබා ගන්නා ලදී.

මෙම බීජ තවාන් කොට ඉතා හොඳ පොල් පැළ තෝරා වගාකරුවන් වෙත නිකුත් කරනු ලබන්නේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ පොල් පැළ තවාන් 38 කින් , ආදර්ශ පොල් උයන් මගින් පාලනය වන පොල් පැළ තවාන් 12 කින් , පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවල පොල්පැළ තවාන් හා කප්රුක පුරවර වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ප්‍රජා පොල් පැළ තවාන්වලිනි.

මෙම සමස්ත වාර්ෂික පොල් පැළ නිෂ්පාදනයට අවශ්‍ය කරන බීජ පොල් මිලියන 12.8 ක් දිවයින පුරා පිහිටි තවාන් වෙත නිසි අවස්ථාවේදි බෙදා හරිමින් මෙම වැඩසටහන කළමනාකරණය කරන ලද්දේ මීගමුවේ පිහිටි බීජ පොල් නිෂ්පාදන ඒකකය මඟිනි.

මෙම බීජ පොල් ලබා ගැනීමේ වැඩසටහනේ දී උසස් තත්ත්වයේ බීජ පොල් තෝරා ගැනීම සඳහා බීජ පොල් ඒකකය මගින් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන ලදී.

මෙම නිෂ්පාදනය කළ පොල් පැළ මනා සැලසුම්කරණයක් තුළින් පොල් වගා සංවර්ධන වැඩසටහන් හරහා වගාකරුවන් වෙත නිකුත් කෙරුණු අතර අනෙකුත් පැළ සහනදායී මිල ගණන් වන, බිම් පැළයක් රු.75.00 කට ද බඳුන් පැළයක් රු.150.00 කට ද අලෙවි කරන ලදී. මෙම පොල් පැළ වගාකරුවන් වෙත නිකුත් කර ඇති ආකාරය සංවර්ධන වැඩසටහන් විස්තර කිරීමේ දී දක්වා ඇත.

## 1.1.2 පොල් වගාකිරීමේ මණ්ඩලයේ පොල් පැළ තවාන්

දිවයින පුරා මණ්ඩලය මඟින් පොල් පැළ තවාන් 38 ක් පවත්වා ගෙන යනු ලැබේ. මෙම තවාන් මඟින් නිෂ්පාදනය කරනු ලබන පොල් පැළ තත්ත්වයෙන් ඉහළ ගුණාත්මක මට්ටමකින් යුතු මනා පොල් පැළ වශයෙන් වගාකරුවන් වෙත ලබා දීම අරමුණ වේ. මෙම ක්‍රියාවලියේ දී පහත කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

- උසස් තත්ත්වයේ බීජ පොල් තෝරා ගැනීම
- තවාන් කළමණාකරණය
- උසස් තත්ත්වයේ පැළයක් නිෂ්පාදනය කිරීම



පොල් වගාකිරීමේ මණ්ඩලයේ අච්චුවේලි පොල් පැළ තවානේ දර්ශනයක්

පොල් වගාවේ වාර්ෂික පැළ අවශ්‍යතාවය අනුව අදාළ වර්ෂය සඳහා අවශ්‍ය බීජ පොල් ප්‍රමාණය තීරණය කරනු ලබයි. අනතුරුව එම බීජ පොල් දිවයින පුරා ඇති තවාන් අතර ඒවායේ පවතින තවාන් ධාරිතාවය, ශ්‍රම බලකායේ සුලභතාවය, පවත්නා යටිතල පහසුකම් සැළකිල්ලට භාජනය කිරීමෙන් පසු ඒ ඒ තවාන්වලට අදාළ බීජ පොල් ප්‍රමාණය බෙදා හැරීම සිදු කෙරේ. 2012 යල කන්නයේදී තවාන් හා ආදර්ශ පොල් උයන්වල ඇති තවාන් වෙත බීජ පොල් 2,725,849 ක් හා මහ කන්නයේදී බීජ පොල් 5,787,624 ක් වශයෙන් වර්ෂය සඳහා මුළු බීජ පොල් 5,713,473 ක් යවන ලදී.

දිවයින පුරා අප මණ්ඩලය සතු ප්‍රාදේශීය කාර්යාල 18 ක් පවතින අතර , එම ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයට අයත් තවාන්වල පැළ නිෂ්පාදනය පහත පරිදි වේ.

# පොල් පැළ තවාන්වල පැළ නිෂ්පාදනය හා නිකුත් කිරීම
# (2012.12.31 වන දින දක්වා)

| දිස්ත්‍රික්කය / ප්‍රාදේශීය කාර්යාලය | තවානේ නම | පැළ නිෂ්පාදනය | | පැළ නිකුත් කිරීම | |
|---|---|---|---|---|---|
| | | බිම් පැළ | බඳුන් පැළ | බිම් පැළ | බඳුන් පැළ |
| රත්නපුර දිස්./ රත්නපුර ප්‍රා.කා. | ඇඹිලිපිටිය | 62,600 | 57,671 | 45,845 | 45,419 |
| කුරුණෑගල දිස්./ කුරුණෑගල ප්‍රා.කා. | නිකවැරටිය | 55,615 | 67,060 | 71,817 | 50,341 |
| | වෙන්නරුව | 37,696 | 42,133 | 39,564 | 26,274 |
| | වාරියපොල | 50,666 | 28,523 | 52,279 | 26,140 |
| | පොල්ගහවෙල | 47,160 | 53,695 | 38,035 | 19,707 |
| | දොඩම්ගස්ලන්ද | 23,142 | 94,168 | 19,074 | 29,861 |
| | ඉබ්බාගමුව | 140,715 | 104,578 | 147,305 | 81,096 |
| කුරුණෑගල දිස්./ කුලියාපිටිය ප්‍රා.කා | කන්දෙටිය | 64,909 | 47,953 | 63,543 | 28,017 |
| | දියදොර | 60,247 | 30,005 | 62,403 | 26,044 |
| | මහයාය | 87,912 | 48,714 | 73,799 | 20,759 |
| | හෙට්ටිපොළ | 64,890 | 46,240 | 41,502 | 18,199 |
| | බිංගිරිය | 58,487 | 91,205 | 62,773 | 52,972 |
| මාතලේ, මහනුවර, නුවරඑළිය දිස්./ මාතලේ ප්‍රා.කා | පල්ලෙකැලේ | 51,246 | 51,017 | 47,648 | 38,249 |
| ගාල්ල දිස්./ ගාල්ල ප්‍රා.කා | බද්දේගම | 75,960 | 44,545 | 70,499 | 34,176 |
| | ලබුදූව | | 16,017 | | 11,164 |
| කෑගල්ල දිස්./ කෑගල්ල ප්‍රා.කා | එරමිණිගොල්ල | 60,273 | 25,443 | 58,043 | 20,567 |
| | මත්තමගොඩ | 63,669 | 20,060 | 60,263 | 13,157 |
| ගම්පහ දිස්./ ගම්පහ ප්‍රා.කා | කිරිදිවැල | 118,888 | 24,096 | 80,658 | 11,615 |
| | වල්පිට | 60,159 | 46,889 | 58,952 | 26,099 |
| හම්බන්තොට දිස්./ හම්බන්තොට ප්‍රා.කා | මැදමුලන | 134,298 | 40,250 | 105,564 | 24,524 |
| | මයුරපුර | 4,760 | | 4,760 | |
| කළුතර දිස්./ කළුතර ප්‍රා.කා | කොරොස්දූව | 94,559 | 56,439 | 89,964 | 38,970 |
| යාපනය දිස්./ යාපනය ප්‍රා.කා | අච්චුවේලි | 167,371 | - | 158,715 | - |
| | කිලිනොච්චි | 96,532 | | 54,968 | |
| | අලම්පිල් | 120,828 | 4,800 | 50,978 | 1,052 |
| | වල්ලිපුරම් | 96,118 | | 5,170 | |
| අනුරාධපුරය දිස්./ අනුරාධපුරය ප්‍රා.කා | කලාවැව | 68,177 | 49,185 | 55,157 | 29,762 |
| පොළොන්නරුව දිස්./ පොළොන්නරුව ප්‍රා.කා | උල්හිටිය | 92,878 | 27,255 | 78,503 | 7,956 |
| | පරාක්‍රම සමුද්‍රය | 99,908 | 48,091 | 82,448 | 17,800 |
| මඩකලපුව දිස්./ මඩකලපුව ප්‍රා.කා | මයිලම්බවැලි | 111,597 | 19,632 | 95,483 | 18,066 |
| ත්‍රිකුණාමලය, මුලතිව් දිස්./ ත්‍රිකුණාමලය ප්‍රා.කා | කුඹුරුප්පිඩි | 124,392 | 5,530 | 124,392 | 5,530 |
| මොණරාගල දිස්./ මොණරාගල ප්‍රා.කා | හඳපානාගල | 195,073 | 22,678 | 74,012 | 14,561 |
| | වැලිපිටිය | 44,640 | 20,639 | 42,605 | 4,612 |
| පුත්තලම දිස්./ මාරවිල ප්‍රා.කා | කිරිමැටියාන | 63,444 | 74,654 | 63,018 | 48,929 |
| | අට්ටවිල්ලුව | 38,454 | 35,674 | 34,966 | 25,976 |
| | විල්පොත | 63,129 | 73,144 | 47,973 | 54,838 |
| අම්පාර දිස්./ අම්පාර ප්‍රා.කා | උහන | 105,498 | 25,025 | 105,498 | 28,000 |
| මාතර දිස්./ මාතර ප්‍රා.කා | වැලිගම | - | 23,302 | - | 4,860 |
| **එකතුව** | | 2,905,890 | 1,466,310 | 2,368,176 | 905,292 |

## 1.1.3 ආදර්ශ පොල් උයන්වල පොල් පැළ නිෂ්පාදනය.

පොල් පැළ නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ජාතික පොල් ඵලදා ඉලක්කය 2016 වර්ෂයේ දී ගෙඩි මිලියන 3650 දක්වා වැඩිකිරීම අරමුණු කරගෙන මණ්ඩලයේ සියලු ආදර්ශ පොල් උයන් තුළ පොල් පැළ නිෂ්පාදනය කිරීම මෙම වසර තුළදී සිදු කරන ලදී.

| ආදර්ශ පොල් උයන | තවානේ නම | පැළ නිෂ්පාදනය | | පැළ නිකුත් කිරීම | |
|---|---|---|---|---|---|
| | | බිම් පැළ | බඳුන් පැළ | බිම් පැළ | බඳුන් පැළ |
| බෝපිටිය | බෝපිටිය | 46,536 | 55,350 | 46,536 | 50,958 |
| ඩෙසිවැලි | ඩෙසිවැලි | 123,959 | 56,494 | 79,211 | 24,227 |
| ගර්ට්ලන්ඩ් | ගර්ට්ලන්ඩ් | 114,746 | 47,386 | 101,986 | 34,683 |
| කොහොඹාන | කොහොඹාන | - | 138,373 | 18,062 | 12,880 |
| කොරෙයි | කොරෙයි | 69,138 | 30,498 | 62,468 | 18,910 |
| ලේනව | ලේනව | 104,041 | 96,592 | 82,864 | 77,000 |
| මහයාය | මහයාය | 218,045 | 35,548 | 156,208 | 29,154 |
| මුන්දලම | මුන්දලම | 13,350 | 14,000 | - | 10,026 |
| නාගන්සෝල | නාගන්සෝල | 40,110 | 18,985 | 52,121 | 13,269 |
| රන්දෙනිය | රන්දෙනිය | 114,598 | 88,895 | 88,050 | 27,501 |
| පාසිතුඩා | පාසිතුඩා | 87,566 | 30,453 | 34,819 | 7,535 |
| පලෙයි | පලෙයි | 211,360 | 2,148 | 9,330 | 1,271 |
| **එකතුව** | | **1,143,449** | **614,722** | **731,655** | **307,414** |

## 1.1.4 ප්‍රජා පොල් තවාන් පිහිටුවීම

කප්රුක පුරවර ප්‍රජා පොල් තවාන් මඟින් පොල් පැළ නිෂ්පාදනය කරනු ලබන්නේ එම ප්‍රදේශයෙන්ම තෝරා ගන්නා ලද උසස් තත්වයේ බීජ පොල් මඟින්ය. 2012 වර්ෂයේ යල හා මහ දෙකන්නය සඳහා ලබාගත් බීජ පොල් ප්‍රමාණය 4,195,315 කි. මෙම ව්‍යාපෘතිය මඟින් කප්රුක පුරවර තුළ පිහිටි තිරසාරව පොල් ඉඩම් පවත්වාගෙන ගිය ඉඩම්හිමියෝ තම පොල් අස්වැන්න බීජ පොල් වශයෙන්



විකිණීමෙන් ඉහළ ආදායමක් ලබාගත්හ. එසේම ප්‍රජා පොල් තවාන් මගින් 2012 වර්ෂයේදී නිෂ්පාදිත පොල් පැළ 2,803,221ක් සඳහා බීජ තවාන් කිරීම හා නඩත්තු සඳහා පොල් පැළයකට රුපියල් 20 බැගින් වැයකර පොල් වගාකිරීමේ මණ්ඩලයේ සහනාධාර වගා වැඩසටහන සඳහා යොදා ගන්නා ලදී. බීජ පොල් තවාන් කිරීම හා නඩත්තුව වෙනුවෙන් රුපියල් මිලියන 56.064 ක මුදලක් ප්‍රජා බීජ පොල් පැළ තවාන්කරුවන්ට ගෙවන ලදී. මේ තුළින් තම පොල් ඉඩම නිසි ආකාරව පවත්වාගෙන යන ඉඩම් හිමියන් හා ප්‍රජා පොල් පැළ තවාන් හිමියන්ට අතිරික්ත ආදායමක් ලබා ගැනීමේ අවස්ථාව උදාවිය. මේ අනුව පොල් වගාවට නැඹුරු වූ ජනතාවට රුපියල් මිලියන 56.064 ක ආදායමක් ලැබීමට හැකිවිය.

## කප්රුක පුරවර ප්‍රජා පොල් තවාන් මගින් පොල් පැළ නිෂ්පාදනය

| දිස්ත්‍රික්කය | තවාන් කළ බීජ ප්‍රමාණය | 2012 දෙසැම්බර් 31 දක්වා නිකුත් කළ පැළ ප්‍රමාණය | 2013 ජනවාරි සහ පෙබරවාරි නිකුත් කළ හැකි පැළ ප්‍රමාණය | නිකුත් කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| කොළඹ | 142,720 | 91,965 | 8,055 | 70% |
| කළුතර | 53,875 | 34,753 | 3,850 | 72% |
| මාතලේ | 114,025 | 50,278 | 29,540 | 70% |
| අනුරාධපුරය | 129,430 | 50,021 | 34,108 | 65% |
| ගම්පහ | 471,777 | 309,892 | 25,327 | 71% |
| කෑගල්ල | 122,022 | 40,910 | 44,505 | 70% |
| කුලියාපිටිය | 493,198 | 282,744 | 58,770 | 69% |
| මහනුවර | 55,509 | 34,202 | 4,655 | 70% |
| බදුල්ල | 159,320 | 15,777 | 64,078 | 50% |
| පුත්තලම | 343,965 | 198,809 | 32,085 | 67% |
| මඩකළපුව | 148,957 | 44,985 | 23,446 | 46% |
| රත්නපුරය | 131,450 | 65,101 | 26,914 | 70% |
| හම්බන්තොට | 228,693 | 117,970 | 42,115 | 70% |
| මොණරාගල | 369,758 | 124,524 | 101,302 | 61% |
| මාතර | 54,309 | 34,201 | 4,640 | 72% |
| ගාල්ල | 140,570 | 98,367 | 1,142 | 71% |
| අම්පාර | 212,834 | 105,730 | 43,254 | 70% |
| පොලොන්නරුව | 119,906 | 55,665 | 28,270 | 70% |
| ත්‍රිකුණාමලය | 37,906 | 27,725 | 0 | 73% |
| යාපනය | 53,100 | 27,965 | 564 | 54% |
| කුරුණෑගල | 482,009 | 287,050 | 50,356 | 70% |
| වව්නියාව | 20,000 | 0 | 14,000 | 70% |
| කිලිනොච්චි | 20,000 | 0 | 7,000 | 35% |
| මුලතිව් | 90,000 | 0 | 45,000 | 50% |
| එකතුව | 4,195,315 | 2,098,634 | 692,976 | 66.5% |

කප්රුක පුරවර තුළ පොල් වගා වැඩසටහන යටතේ 2012 වර්ෂය සඳහා වගාකිරීමට ලබා දී ඇති ඉලක්කය පැළ මිලියන 3 ක් වූ අතර ඒ යටතේ පැළ 1,599,679ක් වගාකරුවන්ට නිකුත් කරන ලදී.

## 1.1.5. සමස්ථ පොල් පැළ නිෂ්පාදනය




*පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රතිපාදන මත පොල් වගාකිරීමේ මණ්ඩලය වෙනුවෙන් හලාවත වැවිලි සමාගම සහ කුරුණෑගල වැවිලි සමාගම සතු වතුවල ඉහත පොල් පැළ සංඛ්‍යාව නිෂ්පාදනය කරන ලදී.

| පොල් පැළ තවාන | බිම් පැළ | බඳුන්ගත පැළ | එකතුව |
|---|---|---|---|
| පොල් පැළ තවාන් | 2,905,890 | 1,466,310 | 4,372,200 |
| ආදර්ශ පොල් උයන් | 1,143,449 | 614,722 | 1,758,171 |
| ප්‍රජා පොල් පැළ තවාන් | 2,803,221 | - | 2,803,221 |
| *හලාවත වැවිලි සමාගමෙන් ලබාගත් පැළ | 491,080 | - | 491,080 |
| *කුරුණෑගල වැවිලි සමාගමෙන් ලබාගත් පැළ | 312,136 | - | 312,136 |
| එකතුව | 7,655,776 | 2,081,032 | 9,736,808 |

## 1.1.6 පොල් පැළ නිකුත් කිරීම. (2012.01.01 – 2012.12.31 දක්වා)






## 1.2 කප්රුක පුරවර වැඩසටහන

කප්රුක පුරවර වැඩසටහන 2012 වසරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 36 ක් තුළ ක්‍රියාත්මක කරන ලදී. මෙහි ප්‍රධාන සහ මූලික වැඩසටහන වශයෙන් දිවයින පුරා ග්‍රාම සේවා වසම් පදනම් කරගනිමින් ප්‍රාථමික සමිති 1768 ක් ස්ථාපනය කරන ලදී. මෙම ප්‍රාථමික සමිති එකතු කර කලාප සමිති 129 ක් පිහිටුවන ලදී. මෙසේ පිහිටුවන ලද ප්‍රාථමික සමිති සඳහා බල ගැන්වීමේ වැඩසටහන් 36 ක් සිදු කරන ලද අතර එමගින් ප්‍රදේශයේ පවතින පොල් කර්මාන්තය ආශ්‍රිත ගැටලු හඳුනා ගන්නා ලදී. එම ගැටලු විසඳීම සඳහා පහත දැක්වෙන වැඩසටහන් කප්රුක පුරවර 36 ක් තුළ ක්‍රියාත්මක කරන ලදී.



පොල් පැළ අවශ්‍යතාවය විසඳීම සඳහා කප්රුක පුරවර තුළම ප්‍රජා පොල් පැළ තවාන් 594 ක් ආරම්භ කරන ලද අතර මේ සඳහා නොමිලේ බීජ 4,195,315 ක් තවාන්කරුවන්ට ලබා දෙන ලදී. මෙම ප්‍රජා පොල් පැළ තවාන් වලින් පොල් පැළ 2,710,078 ක ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී. මෙම පොල් පැළ පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් විවිධ වැඩසටහන් සඳහා යොදා ගන්නා ලද අතර කප්රුක පුරවර ගෙවතු වැඩසටහන සඳහා 1,599,679 ක් බෙදා දෙන ලදී. කප්රුක සමිතිවල සාමාජිකයින්ගේ පොල් වතුවල ඵලදායිතාවය වැඩි කර ගැනීම උදෙසා කලාප මට්ටමින් ආදර්ශ උයන් 98 ක් දිවයින පුරා පිහිටුවන ලදී.

දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල 15ක තොරතුරු මධ්‍යස්ථානය බැගින් ස්ථාපනය කරන ලද අතර එම මධ්‍යස්ථානවලට මිලියන 08 ක් වටිනා විද්‍යුත් උපකරණ ලබා දෙන ලදී. 2013 වසරේ මෙම මධ්‍යස්ථාන නැණසල මධ්‍යස්ථාන හරහා අන්තර්ජාලය සමඟ සම්බන්ධ කිරීමට බලාපොරොත්තු වේ. මෙමගින් කප්රුක සමිති සාමාජිකයින්ට පොල් ආශ්‍රිත කර්මාන්තය පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබා ගත හැකි වේ. චක්‍රීය අරමුදල ආරම්භ කිරීම සඳහා කලාප සමිති 37 ක් සඳහා රු.7,035,000.00 ක මුදලක් ලබා දුන් අතර මෙම මුදල් මගින් ප්‍රාථමික සමිති සඳහා ක්ෂුද්‍ර ණය වැඩසටහනක් ආරම්භ කරන ලදී.

කප්රුක සමිති සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් රාශියක් පොල් පර්යේෂණ ආයතනය හා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මගින් සංවිධානය කරන ලදී. මෙහිදී ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මගින් කප්රුක සමිති භාණ්ඩාගාරිකවරුන් 2249 කට වැඩසටහන් 53 මගින් ණය කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබා දෙන ලදී. එසේම පොල් පර්යේෂණ ආයතනය මගින් ගොවි පාසල් ක්‍රමවේදය පිළිබඳව කප්රුක සමිති සාමාජිකයින් 540 කට පුහුණු වැඩසටහන් 12ක් මගින්



පොල් ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ලංකා බැංකුව හරහා අඩු පොලී යටතේ ඩිමෝ බට්ටා රථ 62 ක්



*කප්රුක පුරවර තුළ පොල් ආශ්‍රිත කර්මාන්තයන්හි යෙදී සිටින්නන්ට තම නිෂ්පාදන සඳහා ප්‍රචාරණයක් සහ වෙළඳපොළක්*

ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන ලදී.

මීට අමතරව පොල් ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ලංකා බැංකුව හරහා අඩු පොලී යටතේ ඩිමෝ බට්ටා රථ 62 ක් ලබා දෙන ලදී. එසේම වන සත්ව හානිය වළක්වා ගැනීම සඳහා අඩු මිල ගණන් යටතේ වායු රයිෆල් තුවක්කු 600 ක් ලබා දෙන ලදී.

කප්රුක සමිති සාමාජිකයින්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා භෝග සායන ඇතුළත් පොල් ආශ්‍රිත කර්මාන්ත ප්‍රදර්ශන දිවයින පුරා කප්රුක පුරවර 09 ක් තුළ පවත්වන ලදී. මෙමගින් කප්රුක පුරවර තුළ පොල් ආශ්‍රිත කර්මාන්තයන්හි යෙදී සිටින්නන්ට තම නිෂ්පාදන සඳහා ප්‍රචාරණයක් සහ වෙළඳපොළක් ලබා දෙන ලදී.

පොල් ආශ්‍රිත සංචාරක වැඩසටහන් යටතේ කප්තුරුපාය අලෙවි මධ්‍යස්ථානයක් ප්‍රධාන කාර්යාලයේ විවෘත කළ අතර ඩේසිවැලිවත්තේ ඉදිකෙරන කප්තුරුපායෙහි වැඩකටයුතු ආරම්භ කරන ලදී.

# කප්රුක පුරවර ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ප්‍රගතිය -1

| ප්‍රාදේශීය කාර්යාලය | | ප්‍රාථමික සමිති පිහිටුවීම | කලාප සමිති පිහිටුවීම | චක්‍රීය අරමුදල සඳහා මුදල් ලබා දීම | |
|---|---|---|---|---|---|
| | | ප්‍රගතිය (සමිති ගණන) | ප්‍රගතිය (සමිති ගණන) | කලාප සමිති ගණන | ලබා දුන් අරමුදල් ප්‍රමාණය (රු.) |
| 1 | කුරුණෑගල | 130 | 10 | 5 | 1,050,000.00 |
| 2 | කුලියාපිටිය | 144 | 12 | 4 | 780,000.00 |
| 3 | ගම්පහ | 361 | 25 | - | - |
| 4 | මාරවිල | 80 | 7 | - | - |
| 5 | කෑගල්ල | 78 | 6 | - | - |
| 6 | රත්නපුර | 89 | 8 | - | - |
| 7 | කළුතර | 125 | 9 | 8 | 1,665,000.00 |
| 8 | ගාල්ල | 55 | 4 | - | - |
| 9 | මාතර | 83 | 3 | 4 | 720,000.00 |
| 10 | හම්බන්තොට | 105 | 7 | 5 | 900,000.00 |
| 11 | මොණරාගල | 136 | 11 | 3 | 555,000.00 |
| 12 | මාතලේ | 114 | 8 | 3 | 405,000.00 |
| 13 | අනුරාධපුරය | 38 | 3 | - | - |
| 14 | පොළොන්නරුව | 28 | 2 | - | - |
| 15 | මඩකලපුව | 39 | 3 | 3 | 585,000.00 |
| 16 | අම්පාර | 33 | 3 | 2 | 375,000.00 |
| 17 | යාපනය | 92 | 6 | - | - |
| 18 | ත්‍රිකුණාමලය | 38 | 2 | - | - |
| **එකතුව** | | **1,768** | **129** | **37** | **7,035,000.00** |

# කප්රුක පුරවර ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ප්‍රගතිය – 2

| ප්‍රාදේශීය කාර්යාලය | ක්ෂේත්‍ර ආදර්ශණ පිහිටුවීම ප්‍රගතිය | බීජ පොල් තවාන් සංඛ්‍යාව | තවාන් කළ මුළු බීජ ප්‍රමාණය | පොල් පැල නිකුත් කිරීම ප්‍රගතිය | අඩු පොලී යටතේ ලබා දුන් ලොරි රථ සංඛ්‍යාව | ලබා දුන් වායු රයිෆල් සංඛ්‍යාව | භෝග සායන හා කර්මාන්ත ප්‍රදර්ශන පැවැත්වීම |
|---|---|---|---|---|---|---|---|
| කුරුණෑගල | 5 | 65 | 482,009 | 193,476 | 2 | 52 | 1 |
| කුලියාපිටිය | 13 | 54 | 493,198 | 248,999 | 10 | 22 | 1 |
| ගම්පහ | 0 | 28 | 471,777 | 134,925 | 2 | 51 | |
| මාරවිල | 8 | 39 | 343,965 | 91,167 | | 10 | |
| කෑගල්ල | 4 | 28 | 122,022 | 46,960 | 3 | 27 | |
| රත්නපුර | 10 | 14 | 131,450 | 51,306 | | 21 | |
| කළුතර | 16 | 31 | 196,577 | 72,479 | 4 | 156 | 1 |
| ගාල්ල | 5 | 11 | 140,570 | 68,200 | 1 | 20 | |
| මාතර | 2 | 14 | 54,309 | 63,454 | 9 | 30 | 1 |
| හම්බන්තොට | 5 | 33 | 228,693 | 44,731 | 9 | 20 | 1 |
| මොණරාගල | 11 | 117 | 529,078 | 177,670 | 12 | 46 | 1 |
| මාතලේ | 4 | 38 | 169,534 | 85,435 | 8 | 25 | 1 |
| අනුරාධපුරය | 5 | 28 | 129,430 | 45,334 | | 20 | |
| පොළොන්නරුව | 2 | 24 | 119,906 | 40,649 | 2 | 60 | |
| මඩකලපුව | 2 | 10 | 148,957 | 76,557 | | 20 | 1 |
| අම්පාර | 5 | 33 | 212,834 | 45,129 | | 20 | 1 |
| යාපනය | 1 | 13 | 93,100 | 46,441 | | | |
| ත්‍රිකුණාමලය | 0 | 14 | 127,906 | 69,246 | | | |
| **එකතුව** | **98** | **594** | **4,195,315** | **1,602,158** | **62** | **600** | **9** |

## 1.3 දිවිනැගුම ගෙවතු වගා වැඩසටහන

ශ්‍රී ලංකාවේ ගෘහ ආර්ථික ඒකක දශ ලක්ෂයක් නගා සිටුවා එම ගෘහ ඒකක ස්වයංපෝෂිත කරමින් රට සංවර්ධනය කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් දියත් කරන ලද පැළ වගාකිරීමේ වැඩසටහනට පොල් වගාකිරීමේ මණ්ඩලය ඉහළම දායකත්වය ලබා දෙන ලදී. මෙය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ විශේෂ ඇගැයීමකට ලක් වූ අතර, 2012 වසර තුළදී දිවිනැගුම වැඩසටහන සඳහා නිකුත් කරන ලද පොල් පැළ ප්‍රමාණය 2,821,407 කි. එය දිවි නැගුම යටතේ පොල් පැළ නිකුත්කිරීමේ ඉලක්කය වූ පැළ මිලියන 4 ට සාපේක්ෂව 71% ක ප්‍රගතියකි.

දිවිනැගුම වැඩසටහන යටතේ නිකුත් කරනු ලබන පොල් පැළවල වටිනාකම, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කරනු ලබන අතර ඉලක්කගත මුදල රු.මිලියන 300 කි. මෙම වැඩසටහන යටතේ පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දක්වා පොල් පැළ ප්‍රවාහනය කිරීම සහ පොල් පැළ විද්‍යානුකූලව සිටුවීම හා රැකබලාගැනීම



සම්බන්ධව පැළ ලාභී වගාකරුවන් දැනුවත් කිරීම සිදුකරනු ලබයි. මේ සඳහා 2012 වර්ෂයේ පැළ ප්‍රවාහන වියදම ලෙස පොල් වගාකිරීමේ මණ්ඩලය රු.මිලියන 13.74 ක් වැයකර ඇත.

දිවිනැගුම වැඩසටහනෙහි වැඩිම ප්‍රගතිය කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය මගින් පෙන්වූ අතර මුළු ප්‍රගතියට සාපේක්ෂව එහි ප්‍රගතිය 15.98 % කි. පිළිවෙලින්, පුත්තලම, මොණරාගල, මාතලේ ප්‍රාදේශීය කාර්යාලය මගින් දෙවන , තුන්වන හා සිව්වන ලෙස ප්‍රගතිය වාර්තා කර ඇත.



# 1.4 කප්රුකයි - සිප්ණැනයි වැඩසටහන



පොල් සංවර්ධන හා ජනතා සංවර්ධන ගරු අමාත්‍ය ඒ. පී. ජගත් පුෂ්පකුමාර මැතිතුමාගේ සංකල්පයක් මත 2012 වසරේදී මෙම වැඩසටහන යටතේ දිවයිනේ සෑම පළාතක්ම ආවරණය වන පරිදි ගෙවත්තේ පොල් පැළ 1 - 2 දක්වා වගාකිරීමට ප්‍රමාණවත් භූමියක් සහිත 6 වසරේ ඉගෙනුම ලබන සිසුන් වෙත නොමිලේ පොලි බෑග් පොල් පැළ ලබාදෙන ලදී.

පොල් පැළ නිකුත් කිරීමත් සමඟම පැළයේ වර්ධනය සටහන් කිරීම සඳහා වාර්තා පොතක්ද නිකුත් කරනු ලබයි. මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වනුයේ පාසැල් සිසුන්ට පොල් වගාව පිළිබඳ උනන්දුවක් ඇති කිරීමත්,පාසල් දරුවන් රටේ ආර්ථික සංවර්ධන හා ජාතික නිෂ්පාදනයේ පාර්ශවකරුවන් බවට පත්කිරීමත්, ගෙවත්තෙහි පොල් පැළයක් සිටුවීම හා එය මනාව රැකබලා ගැනීම තුළින් දරුවන් ඇතුලුව දෙමව්පියන් තුළ ද පොල් වගාව පිළිබඳව උනන්දුවක් ඇතිකිරීමත්, ගෘහස්ථ මාළු පොල් අවශ්‍යතාව ගෙවත්තෙන්ම සපුරාගැනීමත්ය.

6 වසරේ ඉගෙනුම ලබන සිසුවෙකු පොල් පැළ ලබා ගැනීමෙන් වසර 5 කට පසු උසස් පෙළ අධ්‍යාපන වරම ලැබීමේ කඩඉමට පැමිණීමත් සමගම පොල් පැළය ද ඵලදරණ වයසට පැමිණේ. මෙම වැඩසටහන යටතේ වසර 5 කට පසු ඉතාම සාර්ථකව පොල් පැළ නඩත්තු කළ සිසු - සිසුවියන් සඳහා දිස්ත්‍රික්ක මට්ටමේ තේරීමකට ලක් කර උසස් පෙළ

**කප්රුකයි - සිප්ණැනයි වැඩසටහනේ ප්‍රාදේශීය කාර්යාල අනුව පැළ නිකුත් කිරීමේ ප්‍රගතිය**



අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්වයක් පිරිනැමේ. පොල් වගාව සඳහා පාසල් සිසුන්ගේ දායකත්වය ඇතිව පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන ආසියානු පැසිපික් පොල් ප්‍රජා ජාත්‍යන්තර සමුළුවේ ද විශේෂ ඇගයීමකට ලක් වී ඇත.

2012 වර්ෂය තුළ ප්‍රාදේශීය කාර්යාලය වෙත මෙම වැඩසටහන සඳහා ලබාදෙන ලද සමස්ථ ඉලක්කය පොල් පැළ 300,000 ක් විය. මෙම වැඩසටහන යටතේ පාසැල් 4141 ක් හා සිසුන් 174,818 වෙත පොල් පැළ 343,881 නොමිලේ නිකුත් කර ඇත. ඉලක්කයට සාපේක්ෂව සමස්ථ ප්‍රගතිය 114.6% කි. කප්රුකයි සිප්ණැනයි වැඩසටහන සඳහා මූල්‍ය ඇස්තමේන්තුව රු.මි. 59.00 ක් වූ අතර 2012 වර්ෂයේදී රු.මි. 59.90 ක මූල්‍ය වියදමක් මෙම වැඩසටහන සඳහා දරා ඇත.

## 1.5 අක්කර 05ට අඩු පොල් වගා සහනාධාර වැඩසටහන

අක්කර ¼ සිට අක්කර 5 දක්වා වූ ඉඩම්වල පොල් වගාකිරීමට මෙම සහනාධාරය ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ යටතේ වගාකරුවනට අවශ්‍ය පොල් පැළ දෙනු ලබන්නේ ද නොමිලේය. පැළ නිකුත් කිරීමට පෙර පැළ සිටුවීම හා නඩත්තුව පිළිබඳ උපදෙස් ලබාදී සියලු වගාකරුවන් විද්‍යාත්මක පොල් වගාව පිළිබඳව දැනුවත් කරනු ලැබේ.

2012 වර්ෂයේදී මෙම වැඩසටහනේ ඉලක්කය අක්කර 18,000 ක් වුවද අක්කර 20,076 ක ප්‍රගතියක් ලබා ඇත. ඒ සඳහා පොල් පැළ 1,284,886 ක් නොමිලේ නිකුත් කර ඇත. භෞතික ඉලක්කයට සාපේක්ෂව 111.5 % ක ප්‍රගතියක් ලබා ඇත. මෙම වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය රු. මි. 97.96 ක් වේ.



පොල් යටි වගාව




## පොල් නව/නැවත /යටි වගා වැඩසටහනේ ප්‍රගතිය



## 1.6 පූජා භූමිවල පොල් වගාකිරීමේ සහනාධාර වැඩසටහන





2011 වර්ෂයේදී 2600 වන ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර එමඟින් පන්සල් සතු ඉඩම්වල පොල් වගාකිරීමට දායක විය. 2012 දී පන්සල් ඇතුලුව අනිකුත් සිද්ධස්ථාන (කතෝලික දේවස්ථාන, හින්දු කෝවිල්, මුස්ලිම් දේවස්ථාන) සතු ඉඩම්වල පොල්පැළ වගාකිරීමට ද මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. පූජා භූමි වැඩසටහන යටතේ පොල් පැළ 25,000 ඉලක්කයක් පමණක් ලබා දෙන ලද අතර එම ඉලක්කය ඉක්මවමින් පොල් පැළ 25,887 වසර තුලදී නිකුත් කර ඇත. භෞතික ඉලක්කයට සාපේක්ෂව අත්කර ගත් ප්‍රගතිය 103.54 % කි. මේ සඳහා රු. මි. 2.125 ක මූල්‍ය ඇස්තමේන්තුවක් ලබාදෙන ලද අතර මූල්‍ය වියදම රු.මි. 2.031 කි. ප්‍රස්ථාරය මගින් පූජා භූමි වැඩසටහන වැඩ සටහනේ ප්‍රගතිය දක්වා ඇත.



## 1.7 පොල් ඉඩම් පුනරුත්ථාපන සහනාධාර වැඩසටහන

2012 වර්ෂයේදී ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව පුනරුත්ථාපන සහනාධාර වැඩසටහන යටතේ පවත්නා පොල් වගාවේ පාළු සිටුවීම සඳහා නොමිලේ පැළ ලබා දෙන ලදී. ඒ අනුව 2012 වසරේදී නිකුත් කර ඇති පැළ ප්‍රමාණය පාළු සිටුවීම සඳහා ඉලක්කගත පැළ ප්‍රමාණය 400,000 විය. වර්ෂය තුළදී මෙම වැඩසටහන යටතේ අත්කරගත් ප්‍රගතිය පැළ 236,631 කි. මේ සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය දැරූ වියදම රු.මි. 17.71 කි.

ප්‍රස්ථාරය මගින් පොල් ඉඩම් පුනරුත්ථාපන සහනාධාර වැඩසටහනේ ප්‍රගතිය දක්වා ඇත




## 1.8 කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා පොල් ඉඩම්වල ගවගාල් ඉදිකිරීමේ සහනාධාර වැඩසටහන

පොල් වගාව සඳහා කාබනික පොහොර යෙදීම ප්‍රචලිත කිරීමත් පාංශු ගුණාංග දියුණුකර පොල් ඵලදාව වැඩි කිරීමත්, රටේ කිරි නිෂ්පාදනය වැඩිකිරීමට දායකවීමත් අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.



ක්‍රමානුකූලව ඉදිකල ගවගාලක්

පොල් ඉඩම් තුළ එළ ගවයන් හෝ මීගවයන් පාලනය කිරීම සඳහා ක්‍රමානුකූල ගවගාලක් ඉදිකිරීමට මේ යටතේ රු. 25,000/- ක මුදල් සහනාධාරයක්

ලබාදෙන ලදී. අක්කර ½ ට වැඩි පොල් ඉඩමක් ඇති ගවයන් දෙදෙනෙකුවත් සිටින ගොවියෝ මෙම සහනාධාරය ලැබීමට සුදුස්සෝ වූහ. ගොම සහ මුත්‍ර එකතු කිරීමේ පහසුකම් සහිතව පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් ලබාදෙනු ලබන සැලැස්මට අනුව ගවගාල සම්පූර්ණයෙන් ඉදිකර ගවගාලේ වූ ගොම හා ගව මුත්‍ර පොල් වගාවට යෙදීම අනිවාර්යෙන්ම නිසි පරිදි ඉටුකළ වගාකරුවනට පමණක් මූල්‍ය සහනාධාරයක් ලබාදෙන ලදී.

2012 වසරේදී ගවගාල් 141 ක් දිවයින පුරා ඉදිකර ඇති අතර මේ සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් රුපියල් මිලියන 2.875 ක සහනාධාරයක් වගාකරුවන්ට ලබාදී ඇත.



ක්‍රමානුකූලව ඉදිකල ගොම හා මුත්‍ර එකතු කිරීමේ වල



කාබනික පොහොර යෙදීම

## 1.9 පොල් ඉඩම් සඳහා නල මගින් ජලය සැපයුම් පද්ධති ඉදිකිරීම සඳහා වූ සහනාධාරය

පොල් වගාවේ වර්ධනය හා අස්වැන්නට ඍජුවම ජලය බලපායි. පොල් පර්යේෂණ ආයතනයේ අඩු වියදම් ජල සම්පාදන ක්‍රමයක් ලෙස නිර්දේශිත නල මගින් ජලය සැපයීම ප්‍රවර්ධනය නල ජල සහනාධාර වැඩසටහනින් අපේක්ෂා කෙරේ.

වියළි කාලගුණික තත්වයන් පවතින මාරවිල, කුරුණෑගල, කුලියාපිටිය, හම්බන්තොට, මොණරාගල, අම්පාර, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, අනුරාධපුරය, යාපනය, මඩකලපුව හා මාතලේ ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශවල මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් නිර්දේශිත ආකාරයට ජල නල පද්ධති ඉදිකිරීම සඳහා අක්කරයකට රු. 8000/- ක් බැගින් වන පරිදි උපරිම වශයෙන් අක්කර 5 දක්වා වූ ඉඩම් ප්‍රමාණයක නලජල පද්ධති ඉදිකිරීම සඳහා සහනාධාර මුදලක් මෙම වැඩසටහන මගින් ලබාදේ.

2012 වර්ෂයේදී පොල් ඉඩම්වල නල මගින් ජලය සැපයුම් පද්ධති පොල් ඉඩම් අක්කර 750ක ප්‍රදේශයක ඉදිකර ඇති අතර ලබා දී ඇති සහනාධාර ප්‍රමාණය රු.මි. 2.181 කි.

## 1.10 කප්රුක ණය ආයෝජන වැඩසටහන

මෙම වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ, පොල් වගාකරුවන් සහනාධාර මත යැපීම ක්‍රමානුකූලව ඉවත් කරමින්, ඔවුන්ගේ පොල් ඉඩම උපරිම ඵලදායීත්වයෙන් යුතුව සංවර්ධනය කිරීමට අවශ්‍ය තාක්ෂණික සහයෝගය සහ ප්‍රතිපාදන ලබා දීමය. පොල් වගාකිරීමේ මණ්ඩලය පුද්ගලික හා රාජ්‍ය බැංකු සමග ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. ණය ලබාගත් වගාකරුවන් එම ණය ඵලදායි ලෙස හා ගිවිසගත් ව්‍යාපෘති සඳහා යොදවන්නේ ද යන්න පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිළධාරින් විසින් නිරතුරුව පරික්ෂා කෙරේ.

මෙම වැඩසටහන යටතේ අඩු පොලී අනුපාතයක් යටතේ ණය නිකුත් කෙරෙන අතර වගාකරුවනට වාර්ෂිකව පොලී සහනයක් ද ලබාදේ. ඒ අනුව වගාකරුවන් බැංකුවට ගෙවූ පොලියෙන් පළමු වසරේ 100% ක් ද දෙවන වසරේ 50% ක්ද වන අයුරින් පොලියෙන් කොටසක් වගාකරුවනට පොල් වගාකිරීමේ මණ්ඩලයෙන් ලබාගැනීමේ හැකියාවක් ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වාර්ෂික සඵල පොලී අනුපාතය ව්‍යාපෘතිය අනුව 3.5% - 4% ක ඉතා අඩු අගයක් ගනී. කප්රුක ආයෝජන ණය වැඩසටහන වැවිලි ක්ෂේත්‍රයේ මෙන්ම සමස්ත කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ද මෙම ආකාරයට ක්‍රියාත්මක වන එකම සහන ණය වැඩසටහනයි.

පොල් වගාව, අතුරු බෝග වගාව, සත්ත්ව පාලන, වාරි ජල සැපයීම, යාන්ත්‍රික උපකරණ ලබා ගැනීම ආදී ව්‍යාපෘති 11 කට මෙම වැඩසටහන යටතේ ණය ප්‍රතිපාදන ලබා දීම සිදු කෙරේ.

මෙම වැඩසටහන යටතේ 2012 වසර තුළදී පොල් වගාකරුවන් 378 ක් සඳහා අක්කර 2169 සංවර්ධනයට රු. මිලියන 112.16 ක ණය බැංකු මගින් නිකුත් කර ඇත. මෙම වසරේ අක්කර 2750 ක ඉලක්කයට සාපේක්ෂව අත්කරගෙන ඇති ප්‍රගතිය 78.87% කි. එසේම වගාකරුවන් සඳහා රු.මිලියන 7.30 ක පොලී සහන ගෙවා ඇත.

***ප්‍රාදේශීය කාර්යාල වශයෙන් කප්රුක - ආයෝජන ණය වැඩසටහනේ ප්‍රගතිය***



# 1.11 විශේෂ වැඩසටහන්

## 1.11.1 ජාත්‍යන්තර පොල් දිනය සැමරීම

ජාත්‍යන්තර පොල් දිනය නිමිත්තෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ පැවති ජාත්‍යන්තර පොල් දින සැමරුම් උත්සවයේදී පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් 06 ශ්‍රේණියේ පාසල් දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක කෙරෙන "කප්රුකයි සිප්නැණයි" අධ්‍යාපනික වගා වැඩසටහන යටතේ තෝරාගත් පාසල් සිසුන් 5 දෙනෙකුට අතිගරු ජනාධිපතිතුමන් විසින් පොල් පැළ හා වාර්තා පොත් බෙදා දෙන ලදී.



අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් සිසුවියකට පොල් පැළයක් හා වාර්තා පොතක් ලබාදුන් අවස්ථාව

කප්රුක ණය ආයෝජන වැඩසටහන සංකේතවත් කරමින් කප්රුක ආයෝජන ණය පොලී සහන හිමියන් තිදෙනෙකුට චෙක්පත් ප්‍රදානය කිරීම ද ජනාධිපතිතුමාගේ සුරතින් සිදුකෙරුණි.

එසේම කප්රුක පුරවර වැඩසටහන යටතේ දිවයිනේ හොඳම ප්‍රජා පොල් පැළ තවාන්කරුවන් තිදෙනා තෝරාගෙන ඔවුන් වෙනුවෙන් සමරු තිළිණ සහ චෙක්පත් ප්‍රදානය කිරීම ද ජාත්‍යන්තර පොල් දින සැමරුම් උත්සවයේදී සිදුවිය.



හොඳම ප්‍රජා පොල් පැළ තවාන්කරුවාට සමරු තිළිණ සහ චෙක්පත් ප්‍රදානය කිරීම

## 1.11.2 දැයට කිරුළ 2012 සංවර්ධන වැඩසටහනට සමගාමීව කටුකැලියාව නිලධාරී නිවස්නය සකස් කිරීම

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ හා පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිලධාරීන්ගේ රාජකාරී චාරිකා පහසුව සඳහා අනුරාධපුරය, කටුකැලියාවේ ඉදිකෙරුණු නිලධාරී නිල නිවස්නය 2012 අනුරාධපුරය දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව විවෘත කෙරුණි.



## 1.11.3 කප්තුරුපාය අලෙවිසැල



දේශීය පොල් ආශ්‍රිත නිෂ්පාදන මහජනතාව අතර ප්‍රචලිත කිරීමේ හා පොල් කර්මාන්තකරුවා සංවර්ධනය කිරීමේ අරමුණින් යුතුව කෙරෙන වැඩසටහන් මාලාවේ ආරම්භක කප්තුරුපාය පොල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිසැල, බත්තරමුල්ලේ ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පොල් වගාකිරීමේ මණ්ඩල ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී 2012 ඔක්තෝබර් 25 වන දින පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරුණි.
පොල් ආශ්‍රිතව සිදුකෙරෙන ගුණාත්මක නිෂ්පාදන පහසු මිලට මහජනතාවට සැපයීමත්, පොල් වගාකරුවන්ගේ හා පොල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදකයින්ගේ අභිවෘද්ධියත් කප්තුරුපාය අලෙවිසැල් ආරම්භ කිරීමේ මූලික අරමුණයි.
මෙම කප්තුරුපාය අලෙවිසැල, පොල් වගාකිරීමේ මණ්ඩලයේ සුභසාධක සමිතිය මඟින් ක්‍රියාත්මක කෙරේ.

## 1.11.4 දැයට කිරුළ සංවර්ධන වැඩසටහනේ සිවි වන ස්ථානය හිමිකර ගැනීම

2012 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන අනුරාධපුර ඔයාමඩුව ප්‍රදේශය පවත්වන ලදී. මෙම වැඩසටහනට පොල් පර්යේෂණ ආයතනය, පොල් සංවර්ධන අධිකාරිය, කුරුණෑගල වැවිලි සමාගම හා හලාවත වැවිලි සමාගම ආදී පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින සහෝදර ආයතන සමඟ එක්ව අක්කර 2ක භූමි ප්‍රමාණයක පොල් වගාව පිළිබඳව අධ්‍යාපනික ආදර්ශන සහිතව පොල් වගාවක ආකර්ශනීය ප්‍රදර්ශන භූමියක් සකස් කෙරුණි. මෙම ප්‍රදර්ශනයේ මූලිකත්වය පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් දැරූ අතර සමස්ථ ප්‍රදර්ශනයේ සිවි වන ස්ථානය පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයට හිමිකර දීමට අප සමත්විය. මෙම ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව අදාල ප්‍රදේශයේ කප්රුක පුරවර වැඩසටහන, ප්‍රජා පොල් පැළ තවාන් වැඩසටහන, සහනාධාර පොල් පැළ වගා වැඩසටහන, කප්රුකයි සිප්නැණයි ශිෂ්‍යත්ව වැඩසටහන, දිවි නැගුම වැඩසටහන, සම්බුද්ධත්ව ජයන්ති වැඩසටහන හා පොල් කර්මාන්ත පුහුණු වැඩසටහන යනාදී සංවර්ධන වැඩසටහන් රුපියල් මිලියන 37.256ක වටිනාකමකින් යුතුව නිමකර ඇත.



# 2. පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති කටයුතු




පොල් වගාකිරීමේ මණ්ඩලයෙන් ලබා දෙන විවිධ සහනාධාරයන්, ණය යෝජනා ක්‍රමයන්, සේවාවන්, සම්පත් ලබාදීම්, තාක්ෂණය ලබාදීම් පිළිබඳ සියළු කටයුතු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ද සම්බන්ධීකරණය කරමින් පොල් වගාකරුවා වෙතට පත් කිරීමේ කාර්යභාරය හා තාක්ෂණික තොරතුරු හුවමාරුව ව්‍යාප්ති සේවාවට අයත් වේ.

මේ සඳහා ප්‍රධාන කාර්යාලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති සහ සංවර්ධන) හරහා ග්‍රාමීය මට්ටමේ පොල් සංවර්ධන නිලධාරී දක්වා ක්‍රියාත්මක වන උපදේශාත්මක ව්‍යාප්ති සේවයක් ක්‍රියාත්මක වේ.

ඒ පහත ආකාරයටය සමස්ථ සංයුක්ත සැලැස්මට අනුකූලව, වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම හා අදාළ සංවර්ධන සැලැසුම් මෙන්ම ඒ සඳහා අවශ්‍ය වන මූල්‍ය බෙදාහැරීමේ සැලැස්මද සැලසුම් අංශය මඟින් සකස් කෙරෙන අතර, එය ව්‍යාප්ති හා සංවර්ධන අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ එකඟතාවය හා අධීක්ෂණය යටතේ සිදු කෙරේ. ඊට අනුකූලව සියළු තොරතුරු ලිඛිත චක්‍රලේඛ අනුසාරයෙන් ප්‍රාදේශීය කාර්යාල වෙත

යැවෙන අතර, ප්‍රාදේශීය කළමනාකරුවන් විසින් තම බල ප්‍රදේශය තුළ සංවර්ධන හා ව්‍යාප්ති වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මේ සඳහා තාක්‍ෂණික නිලධාරීන් වශයෙන් සහකාර ප්‍රාදේශීය කළමනාකරුවෝ හා ගොවිපල සැලසුම් නිලධාරීහු ප්‍රාදේශීය කළමනාකරුට සහාය වෙති. ඔවුන්ගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ වාර්ෂිකව හා මාසිකව පොල් සංවර්ධන නිලධාරීන්ගේ හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ව්‍යාප්ති කටයුතු සංවිධානය කෙරෙන අතර, මේ සඳහා අවශ්‍ය පූර්ණ සහයෝගය, සම්පත් ලබාදීම හා මඟපෙන්වීම පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයහි විෂයානුබද්ධ නිලධාරීන්ගෙන් හා මාධ්‍ය අංශය මඟින් සිදු කෙරේ.

2012 ව්‍යාප්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාප්ති ජාලයේ ගොවිජන ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරියා වන පොල් සංවර්ධන නිලධාරී කාර්යාල 160 ක් ක්‍රියාත්මක වූ අතර, මේ සඳහා නිලධාරීන් 130කගේ සේවය ලබාදුනි. එසේම මේ සඳහා ග්‍රාමීය මට්ටමේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ නියෝජිතයන් වන ක්ෂේත්‍ර නිලධාරීන් 39 දෙනෙකුගේ සහාය පොල් සංවර්ධන නිලධාරීන්ට ලැබුණු අතර ප්‍රාදේශීය කාර්යාලවල සියලු වැඩසටහන් මෙම නිලධාරීන් හරහා ක්ෂේත්‍රයේ දී ක්‍රියාවට නැංවිය.



ක්ෂේත්‍ර ආදර්ශන වැඩමුළුවක්

මේ අනුව 2012 වර්ෂයේ දී ප්‍රාදේශීය කාර්යාල 18 මඟින් පොල් වගාකරුවන්ගේ ඒක පුද්ගල හමුවීම් 50,815 ක් සිදු කර ඇති අතර, කණ්ඩායම් සාකච්ඡා, ආදර්ශන, ක්ෂේත්‍ර දින, ගොවි පුහුණු පංති ආදී කණ්ඩායම් ව්‍යාප්ති ක්‍රම 7,663 ක් මඟින් වගාකරුවන් 295,989 දෙනෙකුට ව්‍යාප්ති සේවා පහසුකම් ලබා දෙන ලදී. මේ මඟින් ඒක පුද්ගල හා කණ්ඩායම් යන දෙවර්ගය මඟින්ම පොල් වගාකරුවන් 346,804 කට

2012 දි ව්‍යාප්ති සේවාව ලබා දී ඇත.

කෘෂිකාර්මික සංවර්ධන ආයතනයක ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන් එකිනෙකට බද්ධව හා එකිනෙකට සමගාමීව ක්‍රියාත්මක වන්නකි. විශේෂයෙන්ම තාක්‍ෂණික කාර්ය මණ්ඩල අඛණ්ඩව පුහුණු කොට තාක්‍ෂණික දැනුමෙන් පෝෂණය කළ යුතු අතර, පුහුණුකරුවන් පුහුණු කිරීම පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයකි. මෙයට අමතරව සෘජුවම පොල් වගාකරුවන් පොල් වගාකිරීමේ මණ්ඩලයේ පුහුණු මධ්‍යස්ථාන තුළ පුහුණු කිරීම හෝ ක්ෂේත්‍රයේ දී පුහුණු කිරීම සිදු කෙරේ. මේ සඳහා ප්‍රධානම මධ්‍යස්ථානය වශයෙන් ලුණුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය සහ දකුණු ලක පොල් වගාකරුවන් සඳහා දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය ද ක්‍රියාත්මක වේ.

## 2.1 පුහුණු වැඩසටහන්

### 2.1.1 පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය - ලුණුවිල



පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධානම පුහුණු මධ්‍යස්ථානය ලුණුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය වන අතර, මෙහි ප්‍රධානම කාර්යයක් වනුයේ වාර්ෂික පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමයි. අභ්‍යන්තර තාක්‍ෂණික නිලධාරීන්, බාහිර ආයතන නිලධාරීන් සහ වගාකරුවන් ආදී විශාල සංඛ්‍යාවකට න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබා දෙන අතර, 2012 වසරේ දි මෙවැනි පුහුණු වැඩසටහන් 97 ක් පවත්වා පුද්ගලයන් 5550 කට දැනුම හා නිපුණතාවයක් ලබා දී පොල් වගාවේ තාක්ෂණික යෙදවුම් මෙහෙයවීම පිළිබඳ ආකල්ප වෙනසක් ඇති කර ඇත.
ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ඉහතින් දක්වා ඇති ආකාරයට සිදු කළ සංවර්ධන වැඩසටහන් පාදක කරගත් ව්‍යාප්ති / පුහුණු වැඩසටහන්වලට අමතරව ලුණුවිල පුහුණු මධ්‍යස්ථානය මඟින් ද ප්‍රාදේශීය කාර්යාලවලට සම්පත් දායකත්වය ලබා දෙමින් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කෙරිණ. අඛණ්ඩ පුහුණු වැඩසටහන, පාසැල් වැඩසටහන, රාජ්‍ය නිලධාරී වැඩසටහන, ග්‍රාමීය නිලධාරි පුහුණු වැඩසටහන යන වැඩසටහන් මෙයට අයත් වේ.

### 2.1.2 අඛණ්ඩ පුහුණු වැඩසටහන

ලුණුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ නිලධාරීහු ක්ෂේත්‍රයේදී වගාකරුවන්ගේ ප්‍රායෝගික අවශ්‍යතා හඳුනා ගනිමින් ඊට සරිලන පුහුණු වැඩසටහන් පැවැත්වීම අඛණ්ඩ පුහුණු වැඩසටහන් වශයෙන් හඳුන්වයි. මෙම වර්ෂයේදී මෙවැනි වැඩසටහන් 37 ක් දීප ව්‍යාප්තව පවත්වා ඊට සහභාගී වූ වගාකරුවන් 1868 දෙනෙකුගේ දැනුම හා නිපුණතාවය ලබාදීමට කටයුතු කර ඇත.

## 2.1.3 රාජ්‍ය නිලධාරී පුහුණු වැඩසටහන



රාජ්‍ය අංශයේ සහෝදර ආයතනවල නිලධාරීන් හට පොල් වගාව පිළිබඳ මූලික දැනුමක් ලබා ගෙන පුහුණු වැඩසටහන් 49 ක් පවත්වා ඇති අතර, ඊට සහභාගී වී ඇති සංඛ්‍යාව 3422 කි.

## 2.1.4 පාසැල් සිසු සිසුවියන්ගේ පුහුණු වැඩසටහන



ජාතික පාසැල් පද්ධතියේ උසස් පෙළ කෘෂිකර්මය හදාරනු ලබන සිසු සිසුවියන්ගේ පොල් වගා දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණින් පවත්වනු ලැබූ වැඩසටහන් 63 කින් පාසැල් සිසු සිසුවියන් 4280 කට තාක්ෂණික දැනුම ලබා දී ඇත.

## 2.1.5 ග්‍රාමීය නිලධාරී පුහුණු වැඩසටහන



ගම් මට්ටමින් ක්‍රියාත්මක වන විවිධ රාජ්‍ය අනුබද්ධිත හා රාජ්‍ය නොවන ග්‍රාමීය සංවිධානවල සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පුහුණු මධ්‍යස්ථානයේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වි ඇති අතර, මේ සඳහා පවත්වා ඇති වැඩසටහන් ගණන 54 ක් වන අතර, සහභාගී වි ඇති සාමාජිකයින් ගණන 2296 කි.

## 2.2 මැදමුලන දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය



ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ පොල් වගාකරුවන්ගේ දැනුම හා නිපුණතා වර්ධනය කිරීමේ අරමුණින් මැදමුලන ප්‍රදේශයේ දක්ෂිණ ලංකා පොල් පර්යේෂණ පුහුණු මධ්‍යස්ථානය පිහිටුවා ඇති අතර මේ මඟින් 2012 වසරේදී වැඩසටහන් 14 ක් පවත්වා ඇති අතර, එමඟින් පුහුණු කර ඇති වගාකරුවන් ගණන 1071කි.

# 2.3 රෝග හා පලිබෝධ මර්දන වැඩසටහන්

## 2.3.1 වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දන වැඩසටහන

ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ මාතර දිස්ත්‍රික්කයට අයත් වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් මුලින්ම වාර්තා වූ වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගී තත්ත්වය පසු කාලිනව ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කවලින්ද වාර්තා විය. වෛරසයකට බෝහෝදුරට සමාන පයිටොප්ලාස්මා ව්‍යාධිකාරකය මඟින් මෙම රෝගය ඇති කෙරෙන අතර දැනට ලෝකයේ කිසිදු රටක පයිටොප්ලාස්මා සඳහා නිසි ප්‍රතිකාරයක් සොයාගෙන නොමැත.

මෙම රෝගය හඳුනා ගැනීමෙන් පසුව පොල් පර්යේෂණ ආයතනය, ශාක ආරක්ෂක පනත ක්‍රියාත්මක කිරීමේ නෛතික බලධරයා වන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ එක්ව මාතර, හම්බන්තොට හා ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවා කොට්ඨාශ 408 ක් රෝග කලාප වශයෙන් නම් කරන ලදී.

එසේම රෝගය පිටතට බෝවීම වැලක්වීම සඳහා ගාල්ල දෙවට සිට හක්මන හරහා තංගල්ල දක්වා වන මාර්ගයක කී.මී.86 ක් දිග කි.මී. 3 පළල රෝග වැලක්වීමේ කලාපයක් නම් කරන ලදී. මෙම කලාපයේ සියළුම රෝගී ගස් ගලවා දමන අතර මෙම කලාපයේ මායිම්වලින් පිටට පොල් ගසෙහි කිසිදු ජීව ද්‍රව්‍යක් ගෙනයාම ශාක ආරක්ෂක පනත යටතේ තහනම් කරන ලදී. එසේම කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව මඟින් මෙම කුලයට අයත් අනෙකුත් බෝගයන් ප්‍රවාහනය සඳහා ද මෙම තහනම පනවා ඇත. මෙම රෝගය මුලිනුපුටා දැමීමේ අටියෙන් ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක තුළ ඉඩමෙන් ඉඩමට ගොස් ප්‍රති සමීක්ෂණයක් සිදුකළ අතර එහි දී රෝගී ගස් හා පැළ 344,000 ක් හඳුනා ගනු ලැබීණ. පොල් පර්යේෂණ ආයතනය විසින් දේශීය හා විදේශීය විශේෂඥවරුන්ගේන් සමන්විත විවිධාකාර වූ වැඩසටහන් හා උපදේශක සේවා මඟින් ලබාගත් තොරතුරු හා උපදෙස් අනුව රෝගී කලාපය තුළ සියලු රෝගී පොල් ගස් ගැලවීමට ද ආරම්භ කරන ලදී. මේ සඳහා පොල් වගාකරුවන්ට ගස් ඉවත්කිරිම වෙනුවෙන් වන්දි මුදලක් ගෙවන අතර අතුරුබෝග වගාව සඳහා විවිධ රාජ්‍ය ආයතන සමඟ එක්වී සහනාධාර ලබා දෙන ලදී.

2011 වසර තුළදී පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ පූර්ණ මඟපෙන්වීම යටතේ මෙම වැඩසටහන යටතේ රෝගී ගස් ඉවත් කිරීමේ සුවිශේෂී දැවැන්ත වැඩසටහනක් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයද සම්බන්ධ කර ගනිමින් දියත් කල අතර 2012 වසරේදී ද මෙම වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස හම්බන්තොට දිස්ත්‍රික්යේ හඳුනාගත් සියළුම රෝගී ගස් ඉවත් කිරීමට හැකි විය.



2012 වසර තුළ මෙම වැඩසටහන යටතේ ඉවත් කල සමස්ථ රෝගී ගස් සංඛ්‍යාව 80,504 කි. එසේම 2012 වර්ෂයේදී ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් පරිදි රෝගී ගස් ඉවත් කිරීමට කටයුතු නොකරනු ලබන වතුහිමියන්ගේ වතුවල එකී රෝගී ගස් සියල්ල සඳහා රසායනික ද්‍රව්‍යයක් එන්නත් කර ගස් විනාශ කිරීම ආරම්භ කරන ලදී. 2012 දී ඉවත් කල රෝගී ගස් සංඛ්‍යාව දිස්ත්‍රික්ක 03 ට අනුව පහත වගුවෙහි දක්වා ඇත.

| දිස්ත්‍රික්කය | ඉවත් කළ රෝගී ගස් ගණන | ගෙවීම් කල ගස් ගණන | ගෙවූ මුදල (රු.) |
|---|---|---|---|
| මාතර | 77,611 | 69,574 | 139,158,000.00 |
| ගාල්ල | 1,531 | 1,279 | 2,558,000.00 |
| හම්බන්තොට | 14 | 14 | 28,000.00 |
| **එකතුව** | **80,504** | **70,867** | **141,744,000** |

## 2.3.2 රතු කුරුමිණි කළමණාකරණ වැඩසටහන

පොල් වගාවට හානි කරන පලිබෝධයින් අතරින් මාරාන්තික හානි සිදු කරන පලිබෝධකයා රතු කුරුමිණියා වන අතර එල දැරීම ආරම්භ වන අවස්ථාවේ තිබෙන පොල් ගස් කිසිදු පූර්ව ලක්ෂණයක් නොදක්වා කඩාවැටීම මෙම පලිබෝධකයා නිසා සිදු වන අතර දැනට මෙම තත්ත්වය දිවයිනේ සෑම ප්‍රදේශයකින් පාහේ වාර්තා වී ඇත. ඒකාබද්ධ රතු කුරුමිණි පාලනය වැඩසටහන් යටතේ 2012 වසරේදී පෙරමොන් වයල්ස් 6625 ක් නිකුත් කරන ලද අතර ලුණුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් මෙහෙයවන ලද රතු කුරුමිණි ඒකාබද්ධ පලිබෝධ මර්දන වැඩසටහන් සංඛ්‍යාව 5 කි. රතු කුරුමිණි හානිය උපරිමව පැවති සෙවණගල, පොළොන්නරුව B කලාපය, රාජාංගනය, තඹුත්තේගම සහ දෙහිඅත්තකණ්ඩිය යන ප්‍රදේශවල ජාතික මට්ටමින් මෙම වැඩසටහන් පවත්වා ඇත. පෙරමොන් වයල්ස් නිකුත් කිරීම ඇතුළු ඒකාබද්ධ පලිබෝධ මර්දන වැඩසටහන සඳහා වැය කරන ලද සමස්ථ වියදම රු.මි.1.399 කි. 2012 වර්ෂයේදී මොනොක්‍රොටපස් රසායනය මෙරටට ගෙන්වීමේ තහනම නිසා මොනොක්‍රොටපස් ලීටර 33.3 ක් පමණක් වගාකරුවන් වෙත නිකුත් කර ඇත.

## 2.3.3 කළු කුරුමිණි කළමණාකරණ වැඩසටහන

කළු කුරුමිණියා පොල් පැළ වගාවට ප්‍රබලව හානි සිදු කරන අතර සමහර අවස්ථාවලදී පමණක් මාරාන්තික තත්ත්වයන්ද ඇති කරයි. එසේම පලිබෝධ තත්ත්වය ශ්‍රී ලංකාව පුරාම පාහේ පොල් පැළ වගාවට මෙන්ම වැඩුණු ගස් වලටද විවිධ ආකාරවලින් හානි සිදු කරනු ලබන පලිබෝධකයෙකි. මෙම කෘමියා මර්දනය සඳහා විවිධ නිර්දේශයන්ට අමතරව ජීව විද්‍යාත්මක මර්දනය යටතේ දිලීර හා වෛරස් වර්ග හඳුන්වා ඇති අතර ලුණුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් මෙම වැඩසටහන සඳහා මෙටරයිසියම් දිලීර පැකට් හරහා පොල් වගාකරුවන් වෙත නිකුත් කර ඇත. 2012 වර්ෂයේදී නිකුත් කරන ලද දිලීර මළු සංඛ්‍යාව 600 කි. එය ඉලක්කය වූ දිලීර මලු1800 ට සාපේක්ෂව 33.3 % ප්‍රගතියකි.

## 2.3.4 පොල් දළඹු කළමණාකරණ වැඩසටහන

පොල් දළඹු පලිබෝධ මර්දනය සඳහා ජෛව විද්‍යාත්මක මර්ධන ක්‍රමයක් ලෙස 2012 වසරේදී විලෝපික වයල්ස් නිකුත් කරන ලදී. ඒ අනුව 2012 වර්ෂය සඳහා නිකුත් කරන ලද විලෝපික වයල්ස් සංඛ්‍යාව 850 ක් වූ අතර එය ඉලක්කය වූ විලෝපික වයල්ස් 900 ට සාපේක්ෂව 94.44 % ක ප්‍රගතියකි. ඒ යටතේ වගා කරුවන් දැනුවත් කරමින් විලෝපික වයල්ස් නිකුත් කිරීමේ වැඩසටහන් පවත්වමින් රෝගය පලනය කරන ලද අක්කර ප්‍රමාණය 421 කි.

## 2.3.5 මයිටා හානි කළමණාකරණ වැඩසටහන

දිවයින පුරා පොල් ගස්වල පොල් එලදාවට සැලකිය යුතු හානියක් සිදු කරමින් පොල් ගෙඩිවල විකෘතිතාවයක් ඇති කරවන මෙම පලිබෝධ මර්දනය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් මයිටා පරපෝෂිත අභිජනන මධ්‍යස්ථාන ඇතිකරන ලද අතර එම මධ්‍යස්ථාන මගින් විලෝපික මයිටා මළු නිකුත් කරනු ලැබේ . ඒ යටතේ 2012 වර්ෂයේදී අම්පාර දිස්ත්‍රක්යේ මයිටා පරපෝෂිත අභිජනන මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදී. මුලතිව් දිස්ත්‍රක්යේද එක් මයිටා පරපෝෂිත අභිජනන මධ්‍යස්ථානයක් ස්ථාපනය කරන ලද නමුත් 2012 දී එය විවෘත කළ නොහැකි විය. තවද 2012 දී කුරුණෑගල වාරියපොළ සහ පලෙයි හි එක් මයිටා පරපෝෂිත අභිජනන මධ්‍යස්ථානයක් බැගින් තවත් මධ්‍යස්ථාන 2 ක් 2012 දි ඉදිකිරීම් ආරම්භ කර දැනට ඉදිකෙරෙමින් පවතී.

**මයිටා පරපෝෂිත අභිජනන මධ්‍යස්ථාන මගින් 2012.01.01-2012.12.31 දක්වා නිකුත් කරන ලද විලෝපික මයිටා මළු ප්‍රමාණය.**

| මධ්‍යස්ථානය | නිෂ්පාදනය කරන ලද විලෝපික මයිටා මළු | නිකුත් කරන ලද විලෝපික මයිටා මළු |
|---|---|---|
| මඩකලපුව | 6,788 | 3,743 |
| අම්පාර | 5,557 | 1,999 |
| හම්බන්තොට | 3,091 | 1,801 |
| හඳපානගල - මොණරාගල | 6,706 | 6,384 |
| ඩේසිවැලි - කුරුණෑගල | 8,454 | 1,650 |
| **එකතුව** | **30,596** | **15,577** |

## 2.4 ප්‍රකාශන



පොල් වගාව සඳහා ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් කප්රුක නමින් ද්වි භාෂාමය (සිංහල, දෙමළ) සඟරාවක කලාප 03ක් පසු ගිය වර්ෂයන්හි මෙන්ම මෙම වර්ෂයේදී ද නිකුත් කෙරිණ. එම සඟරාව තවදුරටත් පුළුල් කරමින් ලේක්හවුස් ආයතනය හරහා පුවත්පත් අතිරේකයක් මාසිකව භාෂා තුනෙන්ම ජනතාව වෙත බෙදාහැරීමට කටයුතු කර ඇත.




අත්පත්‍රිකා, පුහුණු ආධාරක, බැනර්, පෝස්ටර් ආදිය සකස් කර බෙදා හරිනු ලබන අතර, බෙදා හැර ඇති තාක්ෂණික අත්පත්‍රිකා සහ වෙනත් ප්‍රකාශන ගණන 474,975 ක් ව්‍යාපෘති වැඩසටහන් යටතේ ජනතාව දැනුවත් කිරීම සඳහා බෙදා දී ඇත.

## 2012 වර්ෂයේදී ප්‍රකාශිත අත් පත්‍රිකා

| | |
|---|---|
| පොල් පැළ සිටුවීම හා නඩත්තුව | 100,000 |
| රතු කුරුමිණි මර්ධනය | 47,000 |
| කළුකුරුමිණි මර්ධනය | 50,000 |
| ප්ලේසිස්පා මර්ධනය | 50,000 |
| පොල් දළඹු මර්ධනය | 30,000 |
| මයිටා හානිය | 50,000 |
| පොහොර භාවිතය | 42,000 |
| වෙනත් (කළු සුදු අත්පත්‍රිකා,ව්‍යාප්ති ලේඛන ආදිය) | 105,975 |



## 2.4.1 ප්‍රධාන කාර්යාලයීය ව්‍යාප්ති සේවය හා තොරතුරු ඒකකය

කොළඹ නගරය අවට සහ පිටපලාත්වල ඉඩම් හිමි නාගරික පදිංචි පොල් වගාකරුවන්ගේ දැනුම හා තාක්ෂණික සේවා පවත්වා ගෙන යාමේ අවශ්‍යතා ප්‍රධාන කාර්යාලීය තොරතුරු ඒකකය මඟින් ඉටුකෙරේ. මෙම තොරතුරු ඒකකය ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ පිහිටුවා ඇත. 2012 ප්‍රධාන කාර්යාලීය තොරතුරු ඒකකයයේ ප්‍රගතිය පහත සක්වා ඇත.

කාර්යාලය වෙත පැමිණි හා දුරකථන විමසීම් මඟින් තොරතුරුලබා ගත් සංඛ්‍යාව..6,804

බෙදා දුන් උසස් තත්ත්වයේ පොල් පැළ ගණන ...............................................14,430

වායු තුවක්කු නිර්දේශිත ලිපි ලබාදීම් සංඛ්‍යාව .......................................................565

අලෙවි කළ වායුතුවක්කු සංඛ්‍යාව ...........................................................................271

අලෙවි කළ මොනොක්‍රොටපොස් (රතු කුරුමිණි උවදුර සඳහා) මි.ලි. ....................3,100

බාහිර ව්‍යාප්ත වැඩසටහන් සහ ක්ෂේත්‍ර පරීක්ෂණ......................................................06

# 3 . ආදර්ශ පොල් උයන්

දිවයින පුරා පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් ආදර්ශ පොල් උයන් 12 ක් පාලනය කරනු ලැබේ. මෙම ආදර්ශ පොල් උයන් වලින් 08 ක් පොල් ත්‍රිකෝණයේ ද, 03 ක් නැගෙනහිර පළාතේ ද, 01 ක් උතුරු පළාතේ ද පිහිටා ඇත.

දිවයිනේ තිබූ ආරක්ෂක තත්ත්වය මත නැගෙනහිර පළාතේ කොරෙයි, පාසිකුඩා සහ යාපනය අර්ධද්වීපයේ පලෙයි ආදර්ශ පොල් උයන් වසර කිහිපයක සිට නිසි කළමනාකාරීත්වයක් නොපැවතුන ද, 2011 වර්ෂය වන විට මෙම සෑම ආදර්ශ පොල් උයනක්ම සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට හැකිවිය.

සෑම ආදර්ශ පොල් උයනක්ම පොල් වගාකරුවන්ගේ අවශ්‍යතා සපුරාලන කේන්ද්‍රීය මධ්‍යස්ථාන ලෙස කටයුතු කරනු ලැබේ. ඒ අනුව පොල් වගාව, විවිධ අතුරු බෝග වගාව, සත්ත්ව පාලනය වැනි විවිධ කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල යෙදෙමින් පොල් වගාකරුවන් හට වගාව පිළිබඳ තාක්ෂණික හා ප්‍රායෝගික දැනුම සහ අවබෝධය ලබාදෙමින් පොල් ඉඩමක උපරිම ඵලදායිතාවය ලබාගත හැකි ආදර්ශන ඒකක වශයෙන් නඩත්තු කරනු ලබයි.

එසේම පොල් වගාකිරීමේ මණ්ඩලය වාර්ෂික පොල් පැළ අවශ්‍යතාවය හඳුනාගෙන එම පැළ අවශ්‍යතාවයට අනුකූල වන සේ සමස්ථ පොල් පැළ නිෂ්පාදනය කිරීම සඳහා දිවයින පුරා තවාන් 38 ක් පවත්වාගෙනු ලබයි.

බීජ නිෂ්පාදන ඒකකය මගින් මෙම සංවර්ධන කාර්යයන්ට අදාළ සියළුම යෙදවුම් හා රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාවයන්ට අනුකූල වන සේ සැපයීම හා බෙදාහැරීම සිදු කරනු ලැබේ .

## 3.1 ආදර්ශ පොල් උයන් පාලන කටයුතු

දැනට මණ්ඩලය මඟින් පාලනය වන ආදර්ශ පොල් උයන් හා ආදර්ශ මධ්‍යස්ථාන පිළිබඳව විස්තර පහත දැක්වේ.

| ආදර්ශ පොල් උයනේ නම | පිහිටි ස්ථානය | දිස්ත්‍රික්කය |
|---|---|---|
| 01. නාගන්සෝල ආ.පො.උ. | රස්නායකපුර,නිකවැරටිය | කුරුණෑගල |
| 02. රන්දෙනිය ආ.පො.උ. | වාරියපොළ | කුරුණෑගල |
| 03. ලේනව ආ.පො.උ. | ලේනව, මැල්සිරිපුර | කුරුණෑගල |
| 04. බෝපිටිය ආ.පො.උ. | මාහොළව, බෝපිටිය | කුරුණෑගල |
| 05. ගර්ට්ලන්ඩ් ආ.පො.උ. | නාඹිරිත්තන්කඩවර, වැලිපැන්නගහමුල්ල | කුරුණෑගල |
| 06. මහයාය ආ.පො.උ. | මාකඳුර, ගෝනවිල (වයඹ) | කුරුණෑගල |
| 07. ඩේසිවැලි ආ.පො.උ. | ඉළුක්වෙල, වැඋඩ | කුරුණෑගල |
| 08. කොරෙයි ආ.පො.උ. | තිරුක්කෝවිල්. | මඩකළපුව |
| 09. පාසිකුඩා ආ.පො.උ. | කල්කුඩා,පාසිකුඩා | මඩකළපුව |
| 10. කොහොඹාන ආ.පො.උ. | ගොනාගොල්ල, අම්පාර | අම්පාර |
| 11. පලෙයි ආ.පො.උ. | පලෙයි | යාපනය |
| 12. මුන්දලම | මුන්දලම | පුත්තලම |

## 3.1.1 ආදර්ශ පොල් උයන්වල ඉඩම් පරිභෝජනය

| ආදර්ශ පොල් උයන | දිස්ත්‍රික්කය | ඉඩම් අක්කර ප්‍රමාණය | පොල් අක්කර ප්‍රමාණය | ඵලදරණ පොල් අක්කර ප්‍රමාණය | අනෙකුත් භෝග වගා කර ඇති අක්කර | පාරවල් ගොඩනැගිලි හා වැව් | පර්වත හා වන වගා අක්කර ගණන |
|---|---|---|---|---|---|---|---|
| නාගන්සෝල | කුරුණෑගල | 406 | 347.2 | 316 | 33 | 21 | 04 |
| රන්දෙනිය | කුරුණෑගල | 360 | 311 | 202 | 22 | 08 | 19 |
| ලේනව | කුරුණෑගල | 483 | 361 | 271 | 39 | 43.5 | 35 |
| බෝපිටිය | කුරුණෑගල | 142 | 104 | 74 | 33 | 07 | 08 |
| ගර්ට්ලන්ඩ් | කුරුණෑගල | 405 | 388 | 194 | 15 | 01 | 01 |
| මහයාය | කුරුණෑගල | 331 | 290 | 207 | 16 | 23 | 01 |
| ඩේසිවැලි | කුරුණෑගල | 306 | 295 | 221 | 101.7 | 05 | 06 |
| කොරෙයි | අම්පාර | 469 | 150 | 80 | 85 | 06 | 05 |
| පාසිකුඩා | මඩකළපුව | 238 | 64 | 47 | 34 | 10 | 10 |
| කොහොඹාන | අම්පාර | 154 | 102 | 82 | 40.2 | 07 | 4.75 |
| පලෙයි | කිළිනොච්චිය | 634 | 86 | 86 | 06 | 21 රූඩ 03 | 56 |
| මුන්දලම | පුත්තලම | 14.25 | 14.25 | 11 | - | - | - |

## 3.1.2 ආදර්ශ පොල් උයන්වල වාර්ෂික පොල් ඵලදාව - 2008 සිට 2012 දක්වා (පොල් ගෙඩිවලින්)

| ආදර්ශ පොල් උයන | 2008 | 2009 | 2010 | 2011 | 2012 | වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| නාගන්සෝල | 1104585 | 1232281 | 957441 | 978476 | 806573 | -17.57% |
| රන්දෙණිය | 810776 | 961879 | 699215 | 880477 | 769928 | -12.56% |
| ලේනව | 832615 | 888590 | 801933 | 978130 | 959772 | -1.88% |
| බෝපිටිය | 357212 | 388817 | 357679 | 327924 | 380707 | 16.10% |
| ගර්ට්ලන්ඩ් | 805005 | 885204 | 866933 | 656812 | 979484 | 49.13% |
| මහයාය | 708709 | 1138455 | 982891 | 910520 | 1064918 | 16.96% |
| ඩේසිවැලි | 833898 | 847441 | 815829 | 889008 | 1155594 | 29.99% |
| මුන්දලම | 80168 | 90993 | 81414 | 61884 | 70136 | 13.33% |
| කොහොඹාන | 224694 | 349698 | 96531 | 185903 | 400821 | 115.61% |
| කොරෙයි | 217174 | 252910 | 185200 | 192505 | 300970 | 56.34% |
| පාසිකුඩා | 92255 | 111208 | 86464 | 160409 | 277322 | 72.88% |
| පලෙයි | 0 | 0 | 0 | 110611 | 150589 | 36.14% |
| එකතුව | **6067091** | **7147476** | **5931530** | **6332659** | **7316814** | 15.54% |




## 3.1.3 යටි වගා / නව වගා සහ පුරප්පාඩු පැළ සිටුවීම - 2012 වර්ෂය.

| ආදර්ශ පොල් උයන | යටි වගාව පැළ ප්‍රමාණය | නව වගාව පැළ ප්‍රමාණය | පුරප්පාඩු පිරවීම |
|---|---|---|---|
| නාගන්සෝල | 420 | * | 300 |
| රත්දෙනිය | 690 | * | 186 |
| ලේනව | 640 | * | 1104 |
| බෝපිටිය | 898 | * | * |
| ගර්ට්ලන්ඩ් | 817 | * | 210 |
| මහයාය | * | * | 590 |
| ඩේසිවැලි | * | * | 210 |
| මුන්දලම | * | * | * |
| කොහොඹාන | 512 | 206 | * |
| කොරෙයි | * | * | 3775 |
| පාසිකුඩා | * | * | 1648 |
| පලෙයි | 1120 | 3335 | * |
| *මෙම වර්ෂයේ දී අදාල වගාවන්ගේ අවශ්‍යතාවයක් නොමැත. | | | |

## 3.1.4 පොහොර යෙදීම - 2012 වර්ෂය

| ආදර්ශ පොල් | පොහොර යෙදූ ඵලදරණ පොල් | පොහොර යෙදූ පැළ ගණන |
|---|---|---|
| නාගන්සෝල | 14133 | 2191 |
| රත්දෙනිය | 14096 | 1064 |
| ලේනව | 14259 | 4337 |
| බෝපිටිය | 5065 | 3171 |
| ගර්ට්ලන්ඩ් | 9384 | 5652 |
| මහයාය | 11599 | 2012 |
| ඩේසිවැලි | 13032 | 1347 |
| මුන්දලම | 750 | 53 |
| කොහොඹාන | 3951 | 1101 |
| කොරෙයි | 8451 | 667 |
| පාසිකුඩා | 4062 | 1525 |
| පලෙයි | 4165 | 6448 |

## 3.1.5 ආදර්ශ පොල් උයන්වල සත්ත්ව පාලන ව්‍යාපෘතිය - *2012.12.31 දිනට*

### I. ගව, එළු, බැටළු ආදී සතුන්

| ආදර්ශ පොල් උයන | වර්ගය | පටිටි වස්සන් | වස්සන් | දෙනුන් | වැස්සියන් | කරත්ත ගව |
|---|---|---|---|---|---|---|
| ලේනව | එළගව | 02 | 34 | 55 | 26 | - |
| ගර්ට්ලන්ඩ් | එළගව | 02 | 23 | 45 | 44 | - |
| | බැටළු | 02 | 32 | 31 | 45 | - |
| | මීගව | 01 | 03 | 03 | 01 | - |
| ඩේසිවැලි | එළගව | 01 | 02 | 06 | 02 | - |
| නාගන්සෝල | එළගව | - | - | - | - | 02 |
| | මීගව | 01 | 22 | 20 | 27 | 02 |
| | එළු | 02 | 42 | 31 | 41 | - |
| රත්දෙනිය | එළගව | - | 31 | 40 | 26 | 02 |
| | මීගව | 01 | 01 | 02 | 12 | 02 |
| කොහොඹාන | එළගව | 09 | - | 06 | 05 | - |
| කොරෙයි | එළගව | 05 | 14 | 14 | 12 | 02 |
| මහයාය | මීගව | 01 | 27 | 51 | 53 | 02 |
| | එළගව | - | - | - | - | 04 |
| පාසිකුඩා | එළගව | 01 | 06 | 04 | 03 | - |
| | මීගව | 01 | - | 09 | | - |

### ii. කුකුළු පාලනය

| ආදර්ශ පොල් උයන | බිත්තර දමන කිකිළියන් | තාරාවන් | ගිරිරාජ් කුකුළන් |
|---|---|---|---|
| ගර්ට්ලන්ඩ් | 600 | - | - |
| මහයාය | 713 | 43 | 32 |

## 3.1.6 රබර් වගාව

කුරුණෑගල, බෝපිටිය පිහිටි බෝපිටිය ආදර්ශ පොල් උයනේ අක්කර 22 රූඩ් 03 ක් පුරා පැතිරුණු තද පාෂාණ සහිත භූමි භාගයක රබර් වගාවක් පවතී. එයින් කිරිකපන අක්කර ප්‍රමාණය අක්කර 05 කි. 2012 වර්ෂයේ දී මෙම රබර් වගාවෙන් දුම් ගැසූ දාර රබර් ෂීට් (RSS) 6418 ක් නිෂ්පාදනය කර ඇත. මෙම ප්‍රමාණය කි.ග්‍රෑ.2847 කි. ඒ අනුව මෙම වර්ෂයේ රබර් ආදායම රු: 1,308,253.67 කි.

## 3.1.7 කප්තුරුපාය තාක්‍ෂණික උද්‍යානය

මාකඳුර ගෝනවිල පිහිටි මහයාය ආදර්ශ පොල් උයනේ, "කප්තුරුපාය" තාක්‍ෂණික මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති අතර, එම තාක්‍ෂණික මධ්‍යස්ථානය පොල් වගාකරුවන්ගේ සියලු අවශ්‍යතා සපුරාලන කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරනු ලැබේ. ඒ අනුව ආදර්ශ පොල් උයන මගින් නිෂ්පාදනය කරනු ලබන ගොවිපළ නිෂ්පාදන හා පොල් ආශ්‍රිත භාණ්ඩ අලෙවිය හා ප්‍රදර්ශනය, වගාකරුවන් සඳහා අවශ්‍ය කරන බීජ හා සියලු රෝපණ ද්‍රව්‍ය, කෘෂි රසායන ද්‍රව්‍ය මෙන්ම තාක්‍ෂණික දැනුම ලබාදෙන පොල් සංවර්ධන නිලධාරීවරයෙකුගේ කාර්යාලයක්, ආදර්ශ ගොවිපලක්, ළමා උද්‍යානයක් සහ ආපනශාලාවක් මෙම කප්තුරුපාය තාක්‍ෂණ මධ්‍යස්ථානයේ ස්ථාපනය කර ඇත. ඒ අනුව මෙම කේන්ද්‍රීය මධ්‍යස්ථානයට පැමිණෙන ඕනෑම පොල් වගාකරුවෙකුට පොල් වගාවට අවශ්‍ය සියලු අවශ්‍යතාවයන් ඉටුකර ගතහැකි සේවාවක් මේ මගින් සපයනු ලැබේ.









2012 වසරේ කප්තුරුපාය මධ්‍යස්ථානයේ ආදායම් හා වියදම් පහත දක්වා ඇත.

| | | |
|---|---|---|
| අලෙවි කළ භාණ්ඩවල වටිනාකම (විකුණුම්) | | 11,833,567.16 |
| මිළදී ගැනීම් (ගැනුම්) | 12.890,917.38 | |
| අලෙවි කළ භාණ්ඩවල පිරිවැය | | 10,661,426.22 |
| දළ ලාභය | 1,172,140.94 | |
| අවන්හලේ බදු ආදායම | 360,000.00 | |
| ආයතන හා පරිපාලන වියදම් | 908,210.94 | |
| විකිණීමේ හා බෙදාහැරීමේ වැය | 34,783.80 | |
| ශුද්ධ ලාභය | | 589,146.20 |

## 3.1.8 පාරිසරික සංචාරක කර්මාන්තය

නැගෙනහිර පළාතේ පාසිකුඩා මුහුදු තීරය ආසන්නයේ පිහිටි පාසිකුඩා ආදර්ශ පොල් උයනේ පාරිසරික සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීමේ (Eco – Tourism) වැඩසටහනක් දියත් කර ඇත. ඒ අනුව 2012 වර්ෂය වනවිට සංචාරක නිවාස 03 ක් ඉදිකර ඇති අතර, පාසිකුඩා ආදර්ශ පොල් උයනේ සංචාරක නිවාස දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා විවෘතව ඇත. එමෙන්ම ඒ සඳහා විශාල ඉල්ලුමක් ද පවතී. මෙම වසරේදී දේශීය හා විදේශීය සංචාරකයන් විශාල පිරිසකට නවාතැන් පහසුකම් ද සපයා ඇත. ඉන් ඉපයූ මුදල රුපියල් 1,407,585කි. .

ආදායමේ වාර්ෂික ව්‍යාප්තිය




බෝපිටිය ආදර්ශ පොල් උයනේ සංචාරක බංගලාවක් පවත්වාගෙන යන අතර, ඒ සඳහා ද ප්‍රදේශයේ විශාල ඉල්ලුමක් ඇත. 2012 වර්ෂයේදී රුපියල් 185,752.50ක ආදායමක් ලබා ඇත.

# 4 . මානව සම්පත් කළමනාකරණය

2012 වර්ෂය තුළදී පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපති වශයෙන් සරත් කීර්තිරත්න මහතා කටයුතු කරන ලදී. මෙම වර්ෂය තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා ඇත.

මෙම මණ්ඩලයේ වැඩ බලන සාමාන්‍යාධිකාරී වශයෙන් 2011.07.06 වන දින සිට පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) ඩී.එම්.එල්. බණ්ඩාරනායක මහතා සේවය කළ අතර, 2012.01.18 වෙනි දින සිට සාමාන්‍යාධිකාරී ලෙස ටී.වී.ඩී.ඩී.එස්. කරුණාරත්න මහත්මිය සේවය කරන ලදී.

## 4.1 කාර්ය මණ්ඩල ව්‍යුහය

2012 වර්ෂය තුලදී මණ්ඩලයේ ඉලක්ක සපුරාගැනීම සඳහා පහත සඳහන් කාර්ය මණ්ඩලය දායක වී ඇත.

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකාර | - | 03 |
| කළමනාකාර | - | 16 |
| කණිෂ්ඨ කළමනාකාර | - | 40 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණ) | - | 222 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) | - | 155 |
| ප්‍රාථමික ශ්‍රේණිය (ශිල්පීය) | - | 27 |
| ප්‍රාථමික ශ්‍රේණිය (ශිල්පීය නොවන) | - | 80 |
| දැනට තනතුර දරන්නාට පමණක් පෞද්ගලික වන සේ පවතින තනතුරු | - | 11 |
| වතු පාලන සේවයේ සේවකයින් | - | 980 |
| එකතුව | - | 1534 |

### 4.1.1. සාමාන්‍ය පරිපාලන කටයුතු

වසර ගණනාවක උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස මෙම වසරේ දී මණ්ඩලයේ බඳවා ගැනීම් පරිපාටිය අනුමත කර ගන්නා ලදී. එසේම වතු අංශය සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට හැකිවිය. ඒ අනුව මණ්ඩලයේ සියලු සේවකයන් නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව අන්තර්ග්‍රහණය කර අවසන් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට සෘජු දායකත්වයක් ලබාදෙන පොල් වගාව සංවර්ධනය සඳහා අදාල ව්‍යාප්ති කටයුතු ග්‍රාමීය මට්ටමින් ඉටුකරනු ලබන්නේ පොල් සංවර්ධන නිලධාරීන් විසින් ය. එසේහෙයින් කාර්යක්ෂම හා ඵලදායී

ව්‍යාප්ති සේවාවක් පවත්වාගෙන යාම සඳහා පොල් සංවර්ධන නිලධාරී තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කරන ලදී. මේ අනුව බඳවා ගැනීමේ පටිපාටි ප්‍රකාරව විධිමත් හා විනිවිද භාවයෙන් යුක්තව නවක පොල් සංවර්ධන නිලධාරීන් 104 දෙනෙකු 2012 වසර තුල බඳවා ගන්නා ලදී.



2012 වසරේ පො.සං.ජ.ව.සං. අමාත්‍යතුමා සුරතින් පත්වීම් ලැබීම

ස්ථාන මාරු ලබාගැනීමට කැමැත්තක් දක්වන හා එකම සේවා ස්ථානයක දීර්ඝ කාලයක් සේවය කරනු ලබන නිලධාරීන් / සේවකයින් හට අවස්ථාවක් ලබාදීමේ අරමුණු පෙරදැරිව පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය විසින් අනුගමනය කරන ක්‍රියාපටිපාටියට අනුව 2012 වසරේ දී ද ස්ථානමාරු මණ්ඩල කමිටුව මගින් අදාල කටයුතු කරන ලදී. ඒ අනුව වාර්ෂික ස්ථානමාරු මණ්ඩල කමිටුව ගන්නා ලද තීරණ මෙන්ම සේවා අවශ්‍යතාවයන් හා සේවක අභියාචනා මත ප්‍රාදේශීය කළමනාකරුවන් 06 දෙනෙකුට, පොල් සංවර්ධන නිලධාරීන් 08 දෙනෙකුට, එක් රියදුරෙකුට හා එක් ලිපිකරුවෙකුට 2012 වසරේ දී තම ප්‍රියමනාප ස්ථානවලට ස්ථාන මාරු ලබාදී ඇත.

## 4.1.2 විශ්‍රාම ලබාගැනීම්

මණ්ඩලයේ අභිවෘද්ධිය සඳහා තම හැකියාවන් හා දක්ෂතාවයන් කැපකරමින් කාර්යක්ෂමව මනා සේවාවක් ඉටුකර වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා නිලධාරීන් / සේවකයින් 37 දෙනෙකු මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම ලබා ඇත. මෙම නිලධාරීන්/ සේවකයින් හට හිමිවිය යුතු පාරිතෝෂික හා අනෙකුත් ප්‍රතිලාභයන් නියමිත කාලයන් තුලදී නොපමාව ඔවුන් වෙත ලබාදීමට ආයතන හා පිරිස් බල සංවර්ධන අංශය අදාල පියවර ගන්නා ලදී.

## 4.1.3 සේවක පුහුණුව

2012 වසරේ දී මණ්ඩලයේ විවිධ අංශවල සේවයේ නියුතු නිලධාරීන්ගේ අභිප්‍රේරණය හා ආකල්ප, කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් විවිධ ආයතනවලට නිලධාරීන් 43 දෙනෙකු පුහුණු පාඨමාලා / වැඩමුළු/ සම්මන්ත්‍රණ සඳහා යොමුකර ඇති අතර ඔවුන් විසින් එම පුහුණු වැඩසටහන් සාර්ථකව නිමාකර ඇත. එමෙන්ම සියලුම කළමනාකරණ සේවා ගණයේ නිලධාරීන් හට ලුණුවිල පුහුණු මධ්‍යස්ථානයේ නේවාසික පුහුණුවක් ලබාදීමට කටයුතු කරන ලදී.

විදේශ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හරහා කිසිදු විදේශ පුහුණු අවස්ථාවන් නිලධාරීන්ට නොලැබූ බැවින් ඒ සඳහා ඉල්ලුම් කරමින් විශේෂ පරිශ්‍රමයක් දරණ ලදී.

## 4.1.4 ප්‍රවාහන සංචිතය

2012 වසරේ ක්‍රියාත්මක වූ ප්‍රවාහන සංචිතය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| මෝටර් රථ | - | 03 |
| ඩබල් කැබ් | - | 34 |
| ජීප් රථ | - | 05 |
| වෑන් රථ | - | 01 |
| ලොරි රථ | - | 17 |
| ත්‍රී රෝද රථ | - | 01 |
| ට්‍රැක්ටර් (රෝද 04) | - | 47 |
| ට්‍රැක්ටර් (රෝද 02) | - | 25 |
| ට්‍රැක්ටර් ටේලර් | - | 78 |
| යතුරු පැදි | - | 92 |
| බස් රථ | - | 04 |
| බැකෝ යන්ත්‍ර | - | 02 |
| එකතුව | - | 309 |

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් හා මගපෙන්වීම මත පොල් පැළ ලක්ෂ අනූවක් වගාකිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන හා කප්රුක පුරවර වැනි පොල් වගාව හා සම්බන්ධ දැවැන්ත කඩිනම් සංවර්ධන වැඩසටහන් මෙම වසර තුල ආරම්භ කළ බැවින් ප්‍රවාහන සංචිතයේ ඇති වාහනවලට අමතර ලෙස අමාත්‍යාංශය වෙතින් කැබ් රථ 02 ක් ද පොල් සංවර්ධන අධිකාරිය වෙතින් ලොරි රථයක් ද තාවකාලික පදනම මත මණ්ඩලය වෙත ලබාදීමට කටයුතු කරන ලදී. එසේම මාතර වැලිගම පොල්කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දනය ව්‍යාප්තියේ වැඩ කඩිනමින් අවසන් කිරීම සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් තාවකාලිකව කැබ් රථයක් මණ්ඩලය වෙත ලබාදී ඇත.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සංවර්ධන කාර්යයන් සපුරා ගැනීම සඳහා ඉහත සඳහන් ප්‍රවාහන සංචිතය සතු සම්පත් අඩු පිරිවැයකින් පවත්වාගෙන යාමට පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය කටයුතුකර ඇත.

එමෙන්ම අඩුපාඩුව පැවතුනු උතුරු මැද පලාතේ නිලධාරී නිල නිවාසය අනුරාධපුර කටුකැලියාවේ ඉදිකිරීම්කර 2012 වර්ෂයේදී සාර්ථකව අවසන්කර විවෘත කරන ලදී.

මේ අනුව පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය 2012 වර්ෂය තුල පවතින අවම සම්පත් උපරිම ලෙස කළමනාකරණය කරමින් මණ්ඩලයේ ප්‍රමුඛ කාර්යභාරය වන පොල් වගාව ව්‍යාප්ත කරලීමේ කටයුත්ත සඳහා මනා සහයෝගයක් ලබාදීමට කටයුතු කර ඇත.

# 05. ගිණුම්කරණය

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සමස්ථ කාර්යයන් නියමිත චක්‍රලේඛ, මුදල් රෙගුලාසි සහ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සැලසුම් කිරීම, මෙහෙයවීම හා ලේඛණගත කිරීම සහ අදාළ අංශ වෙත වාර්තා කිරීම මූල්‍ය කළමනාකරණ ක්‍රියාදාමයයි.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය කළමනාකරණ) ගේ මෙහෙයවීමෙන් මූල්‍ය අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) සහ ගිණුම් නිලධාරීන් වශයෙන් සහායක කාර්ය මණ්ඩලය සමඟ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල තුළ මූල්‍ය කටයුතු මෙහෙයවීම සහ වාර්තා කිරීම සිදු වේ.

2012 වර්ෂය තුළ මණ්ඩලයේ පුනරාවර්ථන වියදම් සහ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 270.198ක ප්‍රමාණයක් ද, පොල් සංවර්ධන කාර්යන් ඇතුළු අනෙකුත් සංවර්ධන කාර්යයන් සඳහා රුපියල් මිලියන 259.000ක් මණ්ඩලය වෙත ලැබී ඇති අතර, වැලිගම කොළ මැලවීමේ රෝගය මැඩපැවැත්වීමේ කාර්යය සඳහා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 6.308ක් මණ්ඩලය වෙත මෙම වර්ෂය තුළ ලැබී ඇත. මෙයට අමතරව මණ්ඩලයේ ආදර්ශ බීජ පොල් උයන් පාලනය මඟින් රුපියල් මිලියන 124.352ක ශුද්ධ ලාභයක් උපයා ඇති අතර, තවාන් පාලනයෙන් ලැබුණු ශුද්ධ ලාභය රුපියල් මිලියන 67.863ක් සහ විවිධ ආදායම් රුපියල් මිලියන 26.361ක් ද මණ්ඩලයේ සමස්ථ ලැබීම්වලට ඇතුළත්ය.

මණ්ඩලයේ 2012 වර්ෂය තුළ දරණ ලද පුනරාවර්ථන වියදම රුපියල් මිලියන 358.272ක් වූ අතර, පොල් සංවර්ධන කටයුතු සඳහා ලබාදෙන සහනාධාර වටිනාකම රුපියල් මිලියන 570.576කි. මෙම වර්ෂයේ ව්‍යාප්ති වැඩසටහන් සඳහා දරණ ලද මුළු මුදල රුපියල් මිලියන 32.674ක් වූ අතර, කප්රුක ආයෝජන ණය ක්‍රමය යටතේ වගාකරුවන් වෙත ගෙවන ලද පොලී සහන මුදල රුපියල් මිලියන 6.847ක් විය. වර්ෂය අවසානයට මණ්ඩලයේ මුළු වත්කම්වල වටිනාකම රුපියල් මිලියන 1,752.486කි.

## පොල් වගාකිරීමේ මණ්ඩලය
### 2012.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන | 2012 | 2012 | 2011 | 2011 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත හා උපකරණ | 2 | 318,600,359.12 | | 255,266,486.07 | |
| නොනිමි වැඩ | 3 | 9,603,346.06 | | 1,549,690.32 | |
| ආයෝජන ( කෙටිකාලීන ) | 4 | 10,560,867.16 | | 9,776,596.36 | |
| කප්රුක ප්‍රතිමූල්‍ය ආයෝජන (කෙටි) | 4 | 501,225,132.44 | | 467,291,582.35 | |
| විලම්භිත වියදම් | 5 | 208,832,536.77 | | 157,820,419.08 | |
| | | | 1,048,822,241.55 | | 891,704,774.18 |
| කල්බදු ඉඩම් | 6 | 5,580,257.68 | 5,580,257.68 | 5,727,106.57 | 5,727,106.57 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 7 | 401,759,494.94 | | 264,926,559.77 | |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 8 | 204,518,007.69 | | 75,239,315.32 | |
| ඉදිරියට කල ගෙවීම් | 9 | 1,609,134.68 | | 92,266,404.08 | |
| තැන්පත් ( කෙටිකාලීන ) | 10 | 1,940,902.98 | | 1,940,902.98 | |
| ආයෝජන ( කෙටිකාලීන ) | 11 | 403,733.36 | | 384,028.24 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 12 | 91,890,712.23 | | 360,620,803.35 | |
| ජංගම ගිණුම | 13 | (4,038,177.53) | | 1,906,888.45 | |
| | | | 698,083,808.35 | | 797,284,902.19 |
| | | | 1,752,486,307.58 | | 1,694,716,782.94 |
| **මුලු වත්කම්** | | | | | |
| **අඩු කලා : වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු දෑ | 14 | 29,152,496.17 | | 16,224,300.31 | |
| උපචිත වියදම් | 15 | 27,066,414.80 | | 7,634,321.46 | |
| කෙටිකාලීන වෙන්කිරීම | 16 | 3,264,237.20 | | 3,512,182.00 | |
| | | 59,483,148.17 | | 27,370,803.77 | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| දිගුකාලීන වෙන් කිරීම් | 16 | 184,921,384.51 | | 184,157,605.28 | |
| | | 184,921,384.51 | | 184,157,605.28 | |
| මුලු වගකීම් | | | 244,404,532.68 | | 211,528,409.05 |
| මුලු ශුද්ධ වත්කම් | | | 1,508,081,774.90 | | 1,483,188,373.89 |
| **ශුද්ධ වත්කම් / ද්‍රවශීලතාවය** | | | | | |
| **ඒකාබද්ධ අරමුදල** | | | | | |
| ප්‍රාග්ධන අරමුදල | 17 | 320,935,189.75 | | 293,207,160.45 | |
| පොදු අරමුදල | 18 | 439,484,464.20 | | 489,134,128.16 | |
| ප්‍රාග්ධන අරමුදල ( කප්රුක ) | 19 | 439,302,677.32 | | 393,144,586.00 | |
| කප්රුක ආයෝජන | 20 | 67,572,395.25 | 1,267,294,726.52 | 66,915,450.90 | 1,242,401,325.51 |
| සංචිත | | | | | |
| ප්‍රාග්ධන සංචිත | 21 | 67,545,410.98 | | 67,545,410.98 | |
| අයභාර සංචිත ( ආ.පො.උ ) | 22 | 173,241,637.40 | | 173,241,637.40 | |
| | | | 240,787,048.38 | | 240,787,048.38 |
| මුලු ශුද්ධ වත්කම් / ද්‍රවශීලතාවය | | | 1,508,081,774.90 | | 1,483,188,373.89 |

..................................................

සරත් කීර්තිරත්න
සභාපති
පොල් වගාකිරීමේ මණ්ඩලය

..................................................

කේ.ඩී.එල්. ධර්මසිරි
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මූල්‍ය කළමණාකරන)
පොල් වගාකිරීමේ මණ්ඩලය

## පොල් වගාකිරීමේ මණ්ඩලය
2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| | සටහන | 2012 | 2012 රු. ශත | 2011 | 2011 රු. ශත |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | | | | |
| පුනරාවර්ථන ප්‍රධානය | | | 270,198,000.00 | | 261,741,000.00 |
| සෙස් ප්‍රධානය | | | 214,620,000.00 | | 311,150,000.00 |
| වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | | | 6,308,476.10 | | 66,876,699.58 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | | | 215,461,620.00 | | - |
| UNDP ව්‍යාපෘතිය | | | 239,640.00 | | - |
| | | | **706,827,736.10** | | **639,767,699.58** |
| **වෙනත් ආදායම්** | | | | | |
| පොහොර ව්‍යාපෘති ආදායම් | 23 | 1,236,868.36 | | (2,172,796.61) | |
| තවාන් අංශයේ ආදායම් | 24 | 67,863,491.12 | | 45,090,963.73 | |
| විවිධ ආදායම් | 25 | 26,361,334.38 | | 16,889,410.86 | |
| ස්ථාවර වත්කම් විකුණුම් ලාභ | 26 | - | | 545,706.99 | |
| ආදර්ශ පොල් උයන් ආදායම | 27 | 124,352,387.23 | **219,814,081.09** | 95,888,041.03 | **156,241,326.00** |
| | | | **926,641,817.19** | | **796,009,025.58** |
| අඩුකළා :- සහනාධාර ගෙවීම් | 28 | | 570,576,760.14 | | 293,136,364.54 |
| | | | **356,065,057.05** | | **502,872,661.04** |
| **අඩුකළා :- මෙහෙයුම් ගෙවීම්** | | | | | |
| පුද්ගල පඩිනඩි | 29 | 217,876,094.73 | | 202,251,942.16 | |
| ගමන් වියදම් | 29 | 1,948,625.07 | | 1,484,925.95 | |
| සැපයුම් සහ පාරිභෝජ්‍ය වියදම් | 29 | 20,222,476.70 | | 13,374,887.26 | |
| නඩත්තු වියදම් | 29 | 15,162,359.77 | | 14,475,195.76 | |
| සැපයුම් වියදම් | 29 | 11,140,548.06 | | 9,749,259.77 | |
| ක්ෂය කිරීම් සහ වෙන්කිරීම් | 29 | 41,663,343.57 | | 19,028,032.54 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | 29 | 50,258,977.19 | **358,272,425.09** | 55,997,168.15 | **316,361,411.59** |
| මූල්‍ය මෙහෙයුම් වියදම් මෙහෙයුම් කටයුතු වලින් | | | | | |
| අතිරික්තය / ( ඌණතාවය ) | | | **(2,207,368.04)** | | **186,511,249.45** |

## පොල් වගාකිරීමේ මණ්ඩලය
### 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2012 | | 2011 |
|---|---|---|---|---|
| | | රු. ශත | | රු. ශත |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය** | | | | |
| වර්ෂයේ අතිරික්තය | | (2,207,368) | | 186,511,249 |
| **මුදල් නොවන ගණුදෙනු ගැලපීම්** | | | | |
| වර්ෂයේ ක්ෂය වෙන්කිරීම් | 27,563,548 | | 25,758,210 | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 35,253,280 | | 45,124,332 | |
| විගණන ගාස්තු වෙන්කිරීම් | 500,000 | | 350,000 | |
| ස්ථාවර වත්කම් විකුණුම් ලාභ | 500,000 | | 500,000 | |
| විලම්භිත වියදම් ලියා හැරීම | - | | (545,707) | |
| කල්බදු ඉඩම් ලියාහැරීම | 2,045,658 | | 1,667,423 | |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා බදු වෙන්කිරීම | 146,849 | | 146,849 | |
| Privision for L.R.C. Tax Bonus | 278,500 | | 279,781 | |
| | | 66,287,835 | | 73,280,888 |
| | | 64,080,467 | | 259,792,137 |
| පසුකාලීන අයිතමයන් ගැලපීම - පොදු ලෙජරය | (47,542,296) | | (3,602,570) | |
| කප්රුක ලෙජරය | 14,083 | (47,528,213) | 364,567 | (3,238,003) |
| **ගැලපීම** | | | | |
| මෙහෙයුම් ගිණුම කප්රුක (ඌණතාවය ) | 38,744,009 | | 10,209,457 | |
| ඇප ආවරණ අරමුදල ( කප්රුක ) | 656,944 | 39,400,953 | 41,410,184 | 51,619,641 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | | 55,953,207 | | 308,173,775 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | | |
| තොග ( වැඩිවීම ) / අඩුවීම | (136,832,935) | | (122,962,691) | |
| ණයගැතියෝ ( වැඩිවීම ) / අඩුවීම | (38,621,423) | | (38,370,758) | |
| තැන්පත් ( වැඩිවීම ) / අඩුවීම | - | | 187,197,746 | |
| ජංගම ගිණුම් ( වැඩිවීම ) / අඩුවීම | 5,945,066 | | 10,333,513 | |
| ආයෝජන ( වැඩිවීම ) / අඩුවීම | (19,705) | | (18,640) | |
| බොල් ණය වෙන්කිරීම් ( අඩුවීම ) | - | | - | |
| ණයහිමියෝ ( වැඩිවීම ) / අඩුවීම | 32,360,289 | (137,168,708) | (44,588,056) | (8,408,886) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | (81,215,501) | | 299,764,889 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය** | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම ( වැඩිවීම ) | (81,777,629) | | (33,709,870) | |
| ආයෝජන - දිගුකාලීන අඩුවීම / වැඩිවීම | (34,717,821) | | (130,300,477) | |
| ස්ථාවර වත්කම් විකිනීම | - | | 597,166 | |
| විලම්භිත වියදම් | (69,924,210) | | (55,244,927) | |
| නොනිමි වැඩ | (9,603,346) | (196,023,006) | 1,549,690 | (217,108,418) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (277,238,507) | | 82,656,471 |
| ඉඩම් ප්‍රතිසංස්කරණ බදු ගෙවීම | - | | (1,287) | |
| විගණන ගාස්තු ගෙවීම | (1,036,836) | | (335,866) | |
| පාරිතෝෂික ගෙවීම් | (34,234,748) | (35,271,584) | (22,276,731) | (22,613,884) |
| | | (312,510,091) | | 60,042,587 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය** | | | | |
| ප්‍රාග්ධන ප්‍රධාන - භාණ්ඩාගාර ( කප්රුක ) | 7,400,000 | | 75,236,825 | |
| ප්‍රාග්ධන ප්‍රධාන - භාණ්ඩාගාර | 36,380,000 | | 144,924,000 | |
| වෙනත් අරමුදල් | - | 43,780,000 | 2,641,745 | 222,802,570 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | | | |
| ශුද්ධ අඩුවීම් / වැඩිවීම් මුදල් හා මුදල් සමාන දෑ | | (268,730,091) | | 282,845,157 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 360,620,803 | | 77,775,646 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | 91,890,712 | | 360,620,803 |

# පොල් වගාකිරීමේ මණ්ඩලය

2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**වත්කම් වෙනස්වීම් පිළිබඳ වාර්තාව**

| | ඒකාබද්ධ අරමුදල | ප්‍රාග්ධන සංචිත | මාරුකල සංචිත | එකතුව |
|---|---|---|---|---|
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 782,472,811 | 240,787,048 | - | 1,023,259,859 |
| | 782,472,811 | 240,787,048 | | 1,023,259,859 |
| ගිණුම් ප්‍රතිපත්තියේ වෙනස්වීම් | | | | |
| සංශෝධිත ශේෂය | | | | |
| දේපල ප්‍රත්‍යාගණනය කිරීමෙන් අතිරික්තය | | | | |
| ආයෝජන ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඌණතාවය මුදල් | | | | |
| පරිවර්තනයේ වෙනස්කම් | | | | |
| | 782,472,811 | 240,787,048 | - | 1,023,259,859 |
| | | | | - |
| | | | | - |
| මුදල් කාර්යසාධන ප්‍රකාශයේ හඳුනා නොගත් ශුද්ධ ප්‍රතිලාභ හා පාඩු | 273,417,266 | - | - | 273,417,266 |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / ඌණතාවය | 186,511,249 | - | - | 186,511,249 |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,242,401,326 | 240,787,048 | - | 1,483,188,374 |
| දේපල ප්‍රත්‍යාගණනය කිරීමේ ඌණතාවය | - | | | |
| ආයෝජන ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය | - | | | |
| මුදල් පරිවර්තනයේ වෙනස්කම් | - | | | |
| | 1,242,401,326 | 240,787,048 | - | 1,483,188,374 |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හඳුනා නොගත් ශුද්ධ ප්‍රතිලාභ හා පාඩු | 24,164,450 | - | - | 24,164,450 |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / ඌණතාවය | (2,207,368) | - | - | (2,207,368) |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,264,358,408 | 240,787,048 | - | 1,505,145,456 |

# 06. අභ්‍යන්තර විගණනය

## 6.1 අභ්‍යන්තර විගණනයේ අරමුණ

පොල් වගාකිරීමේ මණ්ඩලය ළඟාකර ගැනීමට අපේක්ෂිත දැක්ම, මෙහෙවර, පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා සංවිධානයේ කටයුතු කර තිබේද යන්න සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය වර්ෂය පුරා කාර්යක්ෂමව හා ඵලදායීව තිබේද යන්න හා වත්කම් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදමින් ප්‍රාදේශීය ඒකක අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යන්නේදැයි පිළිබඳව සිදුකරනු ලබන ඇගයීමකි.

## 6.2 මෙම වර්ෂය තුළ සිදුකරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණ

අභ්‍යන්තර විගණන විෂය පථයට අදාල කාර්යභාරය හා රාජකාරී ඉතාමත් ගුණාත්මක තත්වයකින් අඛණ්ඩ පදනමක් මත 2012 වර්ෂය තුළ ඉටුකර ඇත.

### 6.2.1 ප්‍රධාන කාර්යාලයේ සිදුකරන ලද විගණන පරීක්ෂණ

- කළමනාකරණ සේවා චක්‍ර ලේඛන අංක 43 (1) අනුව වැටුප් පරිවර්තනය කිරීම පිළිබඳ විගණන පරීක්ෂණය.
- මුදල් පරීක්ෂාව - තවාන් ගිණුම (988) පිළිබඳ විගණන පරීක්ෂණය.
- මුදල් පරීක්ෂණය - වතු ගිණුම (995) පිළිබඳ විගණන පරීක්ෂණය.
- 2012 වර්ෂයේ පළමු කාර්තුවේ ප්‍රගතිය පිළිබඳ විගණන පරීක්ෂණය.
- විශේෂ වැටුප් සංශෝධන වාර්තාව පිළිබඳ විගණන පරීක්ෂණය.
- සහකාර ප්‍රාදේශීය කළමනාකරු වැටුප් සකස් කිරීම පිළිබඳ විගණන පරීක්ෂණය.
- විශේෂ වාහන සත්‍යාපන වාර්තාව.
- අර්ථ සාධක අරමුදල් නිදහස් කිරීම පිළිබඳ විගණන පරීක්ෂණ (පරීක්ෂණ - 100)

## 6.3 සාමාන්‍ය විගණන පරීක්ෂණ

### 6.3.1 ප්‍රාදේශීය කාර්යාල

කෑගල්ල, කළුතර, ගම්පහ සහ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල

### 6.3.2 ආදර්ශ පොල් උයන්

බෝපිටිය, නාගන්සෝල, රන්දෙණිය සහ මහයාය ආදර්ශ පොල් උයන්

## 6.3.3 පොල්පැළ තවාන්

එරමිණිගොල්ල තවාන, කොරොසේදුව තවාන, කිරිදිවැල තවාන, වල්පිට තවාන සහ කලාවැව තවාන

## 6.3.4. පොල් සංවර්ධන නිලධාරී කාර්යාල සහ ක්ෂේත්‍ර පරික්ෂාව

කළුතර , පානදුර, බණ්ඩාරගම, හෝමාගම, කොස්ගම, වල්පිට, මීරිගම සහ පදවිය සංවර්ධන නිලධාරී කාර්යාල සහ ක්ෂේත්‍ර පරික්ෂාව.

ඉහත සඳහන් ඒකකවල සිදුකරන ලද විගණන කටයුතුවලදී මූල්‍ය වංචා හෝ බරපතල ගණයේ විෂමාචාර ක්‍රියාවන් හෙළිදරවු නොවූ අතර, අනාවරණය වූ සාමාන්‍ය වැරදි හා අඩුපාඩු සභාපතිතුමා වෙත වාර්තා කර ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

## 6.4 එසේ අනාවරණය වූ පොදු වැරදි හා අඩුපාඩු

- ප්‍රමාණවත් වැඩ බෙදීමක් නොමැතිවීම.
- මණ්ඩලීය වාහනවල ධාවන සටහන් නඩත්තුවේ අඩුපාඩු.
- සමහර ආදර්ශ පොල් උයන්වල සහ තවාන්වල දැවමය වටිනාකමක් සහිත ගස් අංක කර සංගණන ලේඛණ නඩත්තු කර නොමැතිවීම.
- සමහර ප්‍රාදේශීය කාර්යාල හා ආදර්ශ පොල් උයන්වල අභ්‍යන්තර පාලනයට අදාළ ලේඛණ නඩත්තු කර නොතිබීම.
- ආදර්ශ පොල් උයන්වල සිදුකරන සමහර බාහිර මිලදී ගැනීම් සඳහා ප්‍රධාන කාර්යාලයේ පූර්ව ලිඛිත අනුමැතිය නොගෙන මිලදී ගැනීමෙන් පසුව ආවරණ අනුමැතිය ලබාගෙන තිබීම.
- ප්‍රාදේශීය කාර්යාල විසින් සිදුකරන වාහන අලුත්වැඩියා සහ වෙනත් වියදම් ප්‍රතිපූර්ණය කිරීමේදී එම බිල්පත් ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් නොකිරීම.
- තවාන්වල පොල්පැල බෙදාහැරීමේදී බලපත්‍ර නොමැතිව දුරකථන ඇමතුම් මත පමණක් පොල් පැළ සමහර අවස්ථාවල බෙදාහැර තිබීම.

## 6.5 විශේෂ විගණන පරීක්ෂණයන්

| සේවා ස්ථානය | හේතු වූ කරුණ | ප්‍රතිඵලය |
|---|---|---|
| ඩේසිවැලි ආදර්ශ පොල් උයනේ කොප්පරා නිෂ්පාදනය පිළිබඳ විශේෂ විගණන පරීක්ෂණය | කොප්පරා නිෂ්පාදනය, ගබඩා කිරීම සහ කොප්පරා අලෙවිය සම්බන්ධ ක්‍රියාවලිය මණ්ඩලයේ පිළිගත් ක්‍රියාපාටිවලින් බැහැරවීම. | කොප්පරා නිෂ්පාදනය, ගබඩා කිරීම සහ අලෙවිය විධිමත් ආකාරයට සිදු කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම. |
| පාසිකුඩා ආදර්ශ පොල් උයනෙහි 2011 වර්ෂයේ ප්‍රගතිය පිළිබඳ විශේෂ විගණන පරීක්ෂණය | පාසිකුඩා ආදර්ශ පොල් උයනේ ප්‍රගතිය | 2005 සිට 2010 දක්වා ප්‍රගතිය සැසඳීම. |
| කප්රුක පුරවර බීජපොල් සඳහා ගෙවීම් කිරීම පිළිබඳ විශේෂ විගණන පරීක්ෂණය - තිරුක්කෝවිල් හා අක්කරෙයිපත්තු පොල් සංවර්ධන නිලධාරී කොට්ඨාශ | තිරුක්කෝවිල් හා අක්කරෙයිපත්තු යන පොල් සංවර්ධන නිලධාරී කොට්ඨාශවල බීජ පොල් සපයන පෞද්ගලික වතු හිමියන්ගෙන් බීජපොල් ලබා නොගෙන මුදල් ලබා ගැනීමට අදාළ පොල් සංවර්ධන නිලධාරීන්- කප්රුක පුරවර බීජපොල් සඳහා ගෙවීම් වවුචර් ඉදිරිපත් කිරීම. | ඒ සම්බන්ධ ගෙවීම් අත්හිටවා අදාළ නිලධාරීන් සම්බන්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගන්නා ලදී. |
| කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලයේ කප්රුක පුරවර ප්‍රජා සහභාගීත්ව බීජපොල් තවාන් පිළිබඳ විශේෂ විගණන පරීක්ෂණය | කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලයට අයත් රඹුක්කන පොල් සංවර්ධන නිලධාරී කොට්ඨාශයේ පෞද්ගලික බීජ පොල් තවාන් පරීක්ෂා කිරීම. | එම බීජ පොල් තවාන්වල අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු යෙදීම. |

## 6.6 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

### මෙහි අරමුණ

අභ්‍යන්තර හා බාහිර විගණනය මඟින් හෙළිදරව් වන වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීමට කළමනාකාරීත්වය වෙත මඟපෙන්වීමක් සිදුකිරීම සහ මණ්ඩලයේ අභ්‍යන්තර විගණනය කාර්යක්ෂම හා ශක්තිමත් කිරීම විගණන කමිටු රැස්වීම් පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වේ.

PED 55 චක්‍ර ලේඛණයට අනුව විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් පැවැත්විය යුතු අතර, ඊට අනුකූලව මෙම වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 06ක් පවත්වා ඇත.

## 6.6.1. කමිටු සංයුතිය

| | |
|---|---|
| සභාපති | මුදිතා අන්ද්‍රාහැන්නදි මහත්මිය, සහකාර ලේකම්, බැංකු අංශය, මුදල් අමාත්‍යාංශය. |
| ලේකම් | ටී.වී.ඩී.ඩී.එස්. කරුණාරත්න මහත්මිය, සාමාන්‍යාධිකාරී, පොල් වගාකිරීමේ මණ්ඩලය. |
| සාමාජික | ඩී.එම්.එල්. බණ්ඩාරනායක මහතා, අතිරේක ලේකම්, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය. |
| සාමාජික | සී.ඒ. ගුරුගේ මහතා, ප්‍රධාන ගණකාධිකාරී, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය. |
| සාමාජික | මොන්ටේගු සරත්චන්ද්‍ර මහතා, අධ්‍යක්ෂ, පොල් වගාකිරීමේ මණ්ඩලය. |
| නිරීක්ෂක | ලලනි ගුණතිලක මහත්මිය, විගණන අධිකාරී, රජයේ විගණන දෙපාර්තමේන්තුව |
| කැඳවුම්කරු | බී.ඒ.ඩබ්ලිව්.බමුණුආරච්චි මහතා, අභ්‍යන්තර විගණක, පොල් වගාකිරීමේ මණ්ඩලය. |

අභ්‍යන්තර විගණන පරීක්ෂණවලින් හෙළිදරව් වන වැරදි අඩුපාඩු හා රජයේ විගණන අංශයේ විගණන විමසුම් ද විගණන හා කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡා කර අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර, එම අනුමැතියෙන් පසු එම වාර්තාව අමාත්‍යාංශ ලේකම්තුමා වෙත යැවෙනු ඇත.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / துலைவா / My No : වයිඑස්/එෆ්/සීසීබී/එෆ්ඒ/2012
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / jpfjp / Date : 2013 සැප්තැම්බර් 30 දින

සභාපති,
පොල් වගා කිරීමේ මණ්ඩලය.

**පොල් වගා කිරීමේ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

පොල් වගා කිරීමේ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2013 ජූනි 05 දින නිකුත් කරන ලදි.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>.

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone : 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. : oaggov@sltnet.lk

2

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2 මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට පොල් වගා කිරීමේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1 <u>ගිණුම්කරන අඩුපාඩු</u>

ගනුදෙනුවල නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ රු.109,810,459 ක ගිණුම්කරන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර එම අඩුපාඩු සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීම් කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2013 ජූනි 05 දින නැවත ඉදිරිපත් කරන ලදි. මේ අනුව නියැදියට පරිබාහිරව තවදුරටත් ගිණුම්කරන අඩුපාඩු නොතිබේය යන්න විගණනයේ දී බැහැර කළ නොහැකි විය.

3

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, එකතුව රු.484,818,000 ක් වූ රජයේ පුනරාවර්තන හා සෙස් ප්‍රදානයන් ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.2,207,368 ක ඌනතාවයක් වූ අතර, එයට එරෙහිව ඉකුත් වර්ෂයේ එකතුව රු.572,891,000 ක් වූ රජයේ පුනරාවර්තන හා සෙස් ප්‍රදානයන් ඇතුළු අනෙකුත් ප්‍රදානයන් ගණන් ගැනීමෙන් පසු අතිරික්තය රු.186,511,249 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 188,718,617 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට වඩා සෙස් ප්‍රදානය රු. මිලියන 96.5 කින් අඩුවීම හා සහනාධාර ගෙවීම් රු. මිලියන 277 කින් වැඩිවීම, මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදර්ශ පොල් උයන්වල මෙහෙයුම් ප්‍රතිඵලය රු.124,352,387 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූපී ශුද්ධ ලාභය රු.95,888,041 ක් හා සසඳන විට ලාභයේ වැඩිවීම රු.28,464,346 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පොහොර ඒකකය රු.1,236,868 ක අතිරික්තයක් ලබා තිබූ අතර ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,172,797 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ කප්රුක ව්‍යාපෘතියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.38,744,009 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,209,457 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 28,534,552 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට වඩා ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.මිලියන 26.7 කින් වැඩිවීම හා පොලී ප්‍රතිදාන රු. මිලියන 3.6 කින් අඩුවීම, මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4

3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බාහිර පුද්ගලයන් 06 දෙනෙකු විසින් එකතුව රු.12,328,805 ක වන්දි ඉල්ලා මණ්ඩලයට එරෙහිව අධිකරණ වල නඩු 07 ක් ගොනුකර තිබුණි.

(ආ) මණ්ඩලය විසින් බාහිර ආයතන හා පුද්ගලයන් 04 දෙනෙකුට එරෙහිව එකතුව රු.3,144,651 ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු 04 ක් ගොනුකර තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 සහනාධාර ගෙවීම්

මණ්ඩලය විසින් සමාලෝචිත වර්පයේදී සහනාධාර ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කර තිබූ අතර, වර්ෂය අවසානයේදී සහනාධාර වැඩ සටහන් වල ඉලක්කය හා ප්‍රගතිය පහත පරිදි විය.

| සහනාධාර වැඩ සටහන | ඒකකය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පොල් නව / නැවත / යටි වගා සහනාධාර ක්‍රමය | පොල් පැල | 1,152,000 | 1,284,886 | 112 |
| පොල් ඉඩම් පුනරුත්ථාපනය | පොල් පැල | 400,000 | 236,631 | 59 |
| දිවිනැගුම වැඩ සටහන | පොල් පැල | 3,939,618 | 2,764,777 | 70 |
| කප්රුකයි සිප්නැණයි | පොල් පැල | 300,000 | 343,881 | 115 |
| සම්බුද්ධත්ව ජයන්ති වැඩ සටහන | පොල් පැල | 25,000 | 25,887 | 104 |
| ගවගාල් සහනාධාර වැඩ සටහන | ගවගාල් | 240 | 141 | 59 |
| වාරිමාර්ග සහනාධාර වැඩ සටහන | අක්කර | 750 | 507.5 | 68 |
| කප්රුක පුරවර වැඩ සටහන (ගෙවතු වගා සහනාධාරය) | පොල් පැල | 3,000,000 | 1,599,679 | 53 |
| කප්රුක ආයෝජන වැඩ සටහන | අක්කර | 3,100 | 2,169 | 70 |

5

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරුත්ථාපන සහනාධාර වැඩසටහන යටතේ පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් පොල් ඉඩම් වල පාළු සිටුවීම සඳහා පොල් පැල 400,000 ක් ලබා දීමට ඉලක්ක කර තිබුණත්, ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂය තුල පාළු සිටුවීම සඳහා පොල් පැල 236,631 ක් ලබා දී තිබුණි. ඒ අනුව, එහි භෞතික කාර්යසාධනය සියයට 59 ක් විය.

(ආ) පවතින පොල් ඉඩම් වලින් වැඩි නිෂ්පාදනයක් ලබාගැනීම, පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ අරමුණ වූ අතර ඒ වෙනුවෙන් පාංශු ඛාදනය අඩු කිරීම, තෙතමන සංරක්ෂණය කිරීම, පාළු සිටුවීම වැනි කෘෂි විද්‍යාත්මක කටයුතු සිදුකරයි. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂයේ දි පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් පාළු සිටුවීම සඳහා පොල් පැල ලබාදීම පමණක් සිදුකර තිබුණි. මෙසේ පොල් පැල ලබාදීම තුළින් පමණක් පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම ප්‍රමාණවත් වි නොතිබුණි.

(ඇ) කප්රුක පුරවර ගෙවතු වගා සහනාධාර වැඩ සටහන යටතේ පොල් පැළ 3,000,000 ක් බෙදා දීමට ඉලක්ක කර තිබූ අතර, මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසාන වන විට පොල් පැළ 1,599,679 ක් බෙදා දී තිබුණි. එහි භෞතික කාර්යසාධනය සියයට 53 ක් විය. නමුත් ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදි ප්‍රාදේශීය කාර්යාල 10 ක් සියයට 25 ත් සියයට 49 ත් අතර පරාසයක අවම කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ පොල් ඉඩම් අක්කර 750 ක් වෙනුවෙන් වාරිමාර්ග සහනාධාරය ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබුණ ද මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසාන වන විට අක්කර 507.5 ක් සඳහා මෙම සහනාධාරය ලබා දි තිබුණි. ඒ අනුව එහි භෞතික කාර්යසාධනය සියයට 68 ක් විය. නමුත් ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදි මාතලේ ප්‍රාදේශීය කාර්යාලයේ කිසිදු කාර්ය සාධනයක් නොවූ අතර තවත් ප්‍රාදේශීය කාර්යාල 4 ක කාර්ය සාධනය සියයට 35 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඉ) පොල් ඉඩම් වල කාබනික පොහොර භාවිතය වැඩි කිරීම අරමුණු කර ගෙන සමාලෝචිත වර්ෂය තුල ගව ගාල් 240 ක් ඉදිකිරීම සඳහා සහනාධාර ලබාදීමට ඉලක්ක කර තිබුණත්, මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසන් වනවිට ගව ගාල් 141 ක් ඉදිකිරීම සඳහා සහනාධාර ලබා දි තිබුණි. එහි භෞතික කාර්යසාධනය සියයට 59 ක් විය. නමුත් ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදි මාතර හා මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලවල කිසිදු කාර්ය සාධනයක් වාර්තා වී නොතිබුණු අතර තවත් ප්‍රාදේශීය කාර්යාල 6 ක කාර්ය සාධනය සියයට 35 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

6

## 4.1.2 ආදර්ශ පොල් උයන්

2012 වර්ෂයේදී ආදර්ශ පොල් උයන් ලෙස වතු 12 ක් මණ්ඩලය විසින් කළමනාකරණය කර තිබුණි. උක්ත පොල් උයන් පිළිබඳ දත්තයන් කිහිපයක් පහත දැක්වේ.

| ආදර්ශ පොල් උයන | වගා කර ඇති භූමි ප්‍රමාණය | ඵල දරන ගස් සංඛ්‍යාව | කඩන ලද පොල් | වැටුණු පොල් | වාර්ෂික අස්වැන්න | වැටුණු පොල් | ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න | අක්කරයකට ඵලදාව |
|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර | | ගෙඩි | ගෙඩි | ගෙඩි | % | ගෙඩි | ගෙඩි |
| නාගන්සෝල | 347 | 15,274 | 528,319 | 293,232 | 821,551 | 36 | 54 | 2,368 |
| රත්දෙණිය | 311 | 13,519 | 470,932 | 309,168 | 780,100 | 40 | 58 | 2,508 |
| ලේනව | 481 | 20,975 | 829,064 | 131,586 | 960,650 | 14 | 46 | 1,997 |
| බෝපිටිය | 104 | 4,717 | 234,957 | 140,004 | 374,961 | 37 | 79 | 3,605 |
| ගර්ට්ලන්ඩ් | 388 | 14,385 | 606,716 | 396,873 | 1,003,589 | 40 | 70 | 2,587 |
| කොරෙයි | 173 | 5,423 | 262,235 | 40,448 | 302,683 | 13 | 56 | 1,750 |
| පාසිකුඩා | 47 | 3,123 | 281,583 | 27,745 | 309,328 | 9 | 99 | 6,595 |
| මහයාය | 290 | 11,448 | 679,393 | 385,011 | 1,064,404 | 36 | 93 | 3,670 |
| ඩේසිවැලි | 299 | 14,219 | 667,617 | 488,166 | 1,155,783 | 42 | 81 | 3,868 |
| මුන්දලම | 14 | 710 | 60,917 | 9,646 | 70,563 | 14 | 99 | 4,952 |
| කොහොඹාන | 82 | 3,776 | 297,309 | 105,205 | 402,514 | 26 | 107 | 4,909 |
| පලෙයි | 86 | 5,522 | 132,160 | 18,484 | 150,644 | 12 | 27 | 1,752 |
| එකතුව | 2,622 | 113,091 | 5,051,202 | 2,345,568 | 7,396,770 | 32 | 65 | 2,821 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ මුළු පොල් ඵලදාව ගෙඩි මිලියන 7.39 ක් විය. එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 17 ක වර්ධනයකි.

(ආ) පොල් පර්යේෂණ මණ්ඩලය විසින් නිකුත් කරන ලද "පොල් වගාව සඳහා පොහොර භාවිතය හා ඉඩම් යෝග්‍යතාවය "උපදේශක සහරා අංක 1 හි පරිදි පොල් වගාව සඳහා ඉඩම් යෝග්‍යතාව එස් 1 සිට එන් 2 දක්වා යෝග්‍යතා පන්ති 7 කට වර්ගීකරණය කර තිබුණි. එහි තුන්වන පන්තිය වන "එස් 3- යෝග්‍ය " නමැති යෝග්‍යතා පන්තියට අනුව වසරකට පොල් වගා අක්කරයකින් ගෙඩි 4,048 - 5,060 අතර ප්‍රමාණයක පොල් ඵලදාවක් ලබාගත හැකි වුවත්, මණ්ඩලය මඟින් නඩත්තු කරන ආදර්ශ පොල් උයන් 12 න් පාසිකුඩා, මුන්දලම, කොහොඹාන වතු හැර අනෙක් වතු මෙම මට්ටම ළඟාකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) ලේනව ආදර්ශ පොල් උයනේ ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න ගෙඩි 50 කට වඩා අඩුවෙන් පැවතුණි.

7

(ඇ) මහයාය, නාගන්සෝල, බෝපිටිය, රත්දෙණිය, ගර්ට්ලන්ඩ් හා ඩේසිවැලි යන ආදර්ශ පොල් උයන් 6 ක වැටුණු පොල් ප්‍රතිශතය සියයට 36 ත් සියයට 42 ත් අතර පරාසයක ඉතා ඉහල අගයක් ගෙන තිබූ බැවින් ඵලදාව නෙලීම නියි කලට සිදුවී නොතිබුණි.

## 4.1.3 රෝග පාලනය

වැලිගම කොළ කුණුවීමේ හා කොළ මැලවීමේ රෝගය පාලනය කිරීම සඳහා හඳුනාගෙන තිබූ එකම ක්‍රමවේදය වන රෝගී ගස් ගලවා ඉවත් කිරීමට අදාල කටයුතු වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනතේ 4 (2) උපවගන්තිය යටතේ කරනු ලබන විධාන පත්‍රය අනුව රෝගය හඳුනාගත් දින සිට දින 14 ක් තුළ රෝගී ගස් ගලවා විනාශ කිරීමට නිර්දේශ කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එසේ ගලවා ඉවත් කිරීමට නොහැකිව ප්‍රමාද වූ රෝගී ගස් ගණන 26,449 ක් වී තිබුණි.

රෝගී ගස් රෝගී කාලය තුළ මේ ආකාරයට ගලවා ඉවත් නොකර සිටීමෙන්, රෝග පාලනය සම්බන්ධයෙන් ගන්නා ලද මෙම ක්‍රියාමාර්ගයට අදාලව අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට නොහැකි වීමේ අවදානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.1.4 කප්රුක පුරවර වැඩ සටහන යටතේ ප්‍රජා තවාන් පිහිටුවීම

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගාල්ල සිට තංගල්ල දක්වා වූ රෝගී කලාපය තුළ වැලිගම කොළ කුණුවීමේ හා කොළ මැලවීමේ රෝගී තත්ත්වය පැවතුණි. අදාල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුළ තව දුරටත් එම රෝග නොපවතින බවට අංක 1623/11 දරන 2009 ඔක්තෝබර් 14 දිනැති ගැසට් නිවේදනය පරිදි දන්වා නොතිබුණි. එම තත්ත්වයක් තුළ මණ්ඩලය විසින් එම ප්‍රදේශයේ පොල් වගාකරුවන් තෝරා ප්‍රජා තවාන් 14 ක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 4 ක පිහිටුවා තිබුණි. ඒ අනුව උක්ත ගැසට් පත්‍රයේ 11 වන හා 12 වන නියෝගවලට පටහැනිව රෝගී කලාපය තුළ පොල් පැල නිෂ්පාදනය සිදුවීම තුළින් මෙම රෝග පාලන ක්‍රියාදාමයේ අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. එමෙන්ම ප්‍රජා තවාන්වලට ලබාදෙන බීජ පොල් ප්‍රමාණයෙන් සියයට 70 ක පැල ලබාගත් පසු ප්‍රජා තවාන්වල ඉතිරි වන පොල් පැල සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබීමෙන් රෝගී කලාපය තුළ පිහිටි මෙම ප්‍රජා තවාන්වලින් ඉතිරිවන පොල් පැල රෝගී කලාපය හා ආරක්ෂිත කලාපයෙන් පිටතට යාමේ අවදානමක් ද පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

8

### 4.1.5 පොල් සංවර්ධන පුහුණු වැඩ සටහන්

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් එම මධ්‍යස්ථානය තුළ හා මධ්‍යස්ථානයේ මැදිහත්වීමෙන් හා අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය කාර්යාල හරහා පුහුණු වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දී පුහුණු මධ්‍යස්ථානය තුළ පවත්වන ලද වැඩසටහන් 15 කින් වැඩසටහන 3 ක කාර්ය සාධනය සියයට 60 ක් වූ අතර මධ්‍යස්ථානයේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය කාර්යාල මඟින් ක්‍රියාත්මක කර තිබූ දැනුවත් කිරීමේ වැඩ සටහන් 3 අතුරෙන් පාසල් හා ග්‍රාමීය සංවිධාන සඳහා වූ දැනුවත් කිරීමේ වැඩ සටහන් 2 ක ප්‍රගතිය පිළිවෙළින් සියයට 55 හා සියයට 62 ක් විය.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 03 | 02 |
| තෘතියික මට්ටම | 44 | 16 | 28 |
| ද්විතියික මට්ටම | 725 | 417 | 308 |
| ප්‍රාථමික මට්ටම | 151 | 107 | 44 |
| | 925 | 543 | 382 |

මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාලවන තනතුරු 382 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩුව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය පාලනය

2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවල ආදර්ශ පොල් උයන් ඒකකය, තවාන් ඒකකය, බීජ නිෂ්පාදන ඒකකය යන ඒකක ස්වයං මූල්‍ය ඒකක ලෙස හඳුනා ගෙන තිබූ අතර එමඟින් සමාලෝචිත වර්ෂය තුළ රු.995,603,000 ක ආදායමක් උපයා ගැනීමට ඉලක්ක කර තිබුණි. එසේ එක් එක් ඒකක විසින් උපයා ගැනීමට සැලසුම් කර තිබූ ආදායම වෙන වෙනම දක්වා තිබුණද එම ආදායම් උපයා ගන්නා ආකාරය පිළිබඳ විස්තරාත්මක තොරතුරු අයවැය ඇස්තමේන්තු තුළ අන්තර්ගත වී නොතිබුණි.

9

6. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මානව සම්පත් කළමනාකරණය

(ඇ) පොල් සංවර්ධන පුහුණු වැඩ සටහන

(ඈ) ගබඩා කාර්ය පරිපාටිය

(ඉ) නවාත් කළමනාකරණය

(ඊ) වත්තු කළමනාකරණය

එච්. ඒ. එස් . සමරවීර
විගණකාධිපති

# පොල් වගාකිරීමේ මණ්ඩයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පණතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා මණ්ඩලයේ කරුණු පැහැදිලි කිරීම.

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

2012 වර්ෂයේ අනුමත ඇස්තමේන්තු අනුව මණ්ඩලය විසින් සැලසුම් කරන ලද පොල් වගා සංවර්ධනය, ප්‍රාග්ධන භාණ්ඩ මිළදී ගැනීම හා ප්‍රාග්ධන ඉදිකිරීම් සඳහා වූ කාර්යයන් වල වටිනාකම රුපියල් මිලියන 700.00 ක් විය. මෙම සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය භාණ්ඩාරයෙන් වර්ෂය තුළදී මණ්ඩලය වෙත ලැබේය යන බලාපොරොත්තුව මත අමාත්‍යාංශය මඟින් සකස් කරන ලද ක්‍රමෝපායන සැලැස්ම අනුව මණ්ඩලයේ 2012 වර්ෂයට සකස් කරන ලද ක්‍රියාත්මක සැලැස්ම අනුව සියළු සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරිම ආරම්භ කරන ලදී. ඒ අනුව බීජ පොල් පැල ලක්ෂ 90 ක් වගාකිරිම, කප්රුක පුරවර ආරම්භ කිරිම හා අනෙකුත් ප්‍රාග්ධන සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව වර්ෂ අවසානයේ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ලද පොල් වගා සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 570.57 ක් ද කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය යටතේ වගාකරුවන්ගේ පොලී සහන ලෙස රුපියල් මිලිය 6.84 ක් ද ප්‍රාග්ධන වැය වශයෙන් රුපියල් මිලියන 41.40 ක් ද වශයෙන් රුපියල් මිලියන 618.81 ක සංවර්ධන වැයක් දරන ලදී.

මේ සඳහා වර්ෂයේ ඒකාබද්ධ අරමුදලින් වෙන් කර තිබුණු රුපියල් මිලියන 700 ක මුදල මණ්ඩලය විසින් ලබා දෙන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව ලබා දෙන ලෙස භාණ්ඩාගාරය වෙතින් ඉල්ලුම් කර තිබූ නමුත් මණ්ඩලය වෙත වර්ෂය තුළ ලැබී ඇති සංවර්ධන මුදල රුපියල් මිලියන 259.00 ක් පමණක් විය.

ඒ අනුව හිඟය රුපියල් මිලියන 359.81 ක් විය. මෙම මුදල 2011 වර්ෂ අවසානයේ ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් ද පෙර වර්ෂයේ මණ්ඩලය විසින් උපයා ගෙන තිබූ රුපියල් මිලියන 156.24 ක් වූ ශුද්ධ ආදායම 2012 වර්ෂයේ රුපියල් මිලියන 219.81 දක්වා රුපියල් මිලියන 63.57 කින් වැඩි කර ගත් මුදලහා බීජ පොල් පැල සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ලබා දී තිබුණු රුපියල් මිලියන 215.46 ක මුදලින් පියවා ගෙන තිබුණු නමුත්, රුපියල් මිලියන 2.20 ක මුදලක් හිඟ ලෙස ගිණුම් වාර්තා වල පෙන්නුම් කරයි. මණ්ඩලයේ සැලසුම් අනුව වෙන් කර තිබුණු ප්‍රතිපාදන නියමිත පරිදි ලැබුනේ නම් මෙම වටිනාකම් ඌනතාවයක් ලෙස ගිණුම් වාර්තා වල පෙන්නුම් නොවනු ඇත.

## 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතන විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

- මණ්ඩලයට විරුද්ධව පවරා ඇති නඩු

### 1. නඩු අංක 3010M - බලපිටිය

මණ්ඩලයට අයත් අංක GH-2885 දරණ බස් රථය පුහුණු වැඩ මුළුවක් සඳහා ගොස් ආපසු පැමිණීමේ දී තවත් බස් රථයක ගැටීමේදී අනතුරට ලක්වූ තුන්වන පාර්ශවකරුවෙකු වූ නිහාල් රංජිත් තැමැත්තකු විසින් මණ්ඩලයෙන් වන්දි ඉල්ලා පවරා ඇති නඩුවකි. මේ අනතුර සම්බන්ධව මණ්ඩලය විසින් විනය පරීක්ෂණ පවත්වා අවශ්‍ය කටයුතු කර ඇත. නඩුව දැනට බලපිටිය දිසා අධිකරණයේ විභාග වෙමින් පවති.

### 2. නඩු අංක 128/2011 - මාතලේ 8040/17

රාජකාරී සඳහා යාමේදී අංක GH-0803 දරණ ලොරි රථය කාර්මික දෝෂයක් හේතුවෙන් ගලේවෙල ඕමාරගොල්ල ප්‍රදේශයේ දී අනතුරට පත්වී ඇත. එහිදි බාහිර පාර්ශවකරුවන් දෙදෙනෙකු මරණයට පත්වී ඇති අතර ඒ වෙනුවෙන් මාතලේ දිසා අධිකරණයේ දී පවරා තිබුනු අංක 8040/17 දරණ වන්දි නඩුව නිෂ්ප්‍රභාවී ඇත. නමුත් නැවත මහනුවර අභියාචනා අධිකරණයේ අංක 128/2011 යටතේ අභියාචනයක් ඉදිරිපත්කර ඇති අතර එය දැනට විභාග වෙමින් පවතී. මෙයට අදාල විනය කටයුතු මණ්ඩලය විසින් සිදුකර ඇත.

### 3. බදුල්ල මහාධිකරණය - LTS/18759/2001

පොල් වගාකරුවන්ගෙන් වංචනික ලෙස මුදල් ලබාගැනීමේ චෝදනාවක් මත මූලික පරීක්ෂණ හා විනය පරීක්ෂණයක් පවත්වා එම තීරණයට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි පොල් සංවර්ධන නිලධාරියෙකු වශයෙන් සේවය කල එල්. හපුහින්න නමැති අය සේවයෙන් පහකර ඇත. එයට එරෙහිව එල්. හපුහින්න මහතා විසින් පවරන ලද නඩුවකි.

### 4. මාරවිල දිසා අධිකරණය - 2928/M

පොල් වගාකිරීමේ මණ්ඩලයේ එවකට සිටි සභාපතිවරයා විසින් එවන ලද ලිපියකින් අපහාසයක් සිදුවූ බව පවසමින් ජේ.ඒ.ආර්.සී. ප්‍රනාන්දුපුල්ලේ නැමැති හිටපු මණ්ඩලීය සේවකයෙකු විසින් වන්දි ඉල්ලා පවරා ඇති නඩුවකි. දැනට මෙම නඩුව මාරවිල දිසා අධිකරණයේ විභාග වෙමින් පවති.

## 5. කුරුණෑගල මහාධිකරණය - HCALT/9/2012

පරිවාස කාලය තුලදී සේවය අසතුටුදායක නිසා පොල් වගාකිරීමේ මණ්ඩලයේ සේවයෙන් පහ කරන ලද අයි.කේ.ජ්. ජයවර්ධන නැමති පොල් සංවර්ධන නිලධාරී විසින් නැවත රැකියාව ලබාගැනීම හා වෙනත් සහන ලබා ගැනීමට ඉල්ලා නඩු පවරන ලද අතර එය කම්කරු විනිශ්වය සභාවේ දී නිෂ්ප්‍රභා විය. නැවත ඔහු විසින් කුරුණෑගල මහා අධිකරණය වෙත අභියාචනා කර නඩු පවරා ඇති අතර මෙම නඩුව දැනට විභාග වෙමින් පවතී.

## 6 I. කම්කරු වන්දි නඩුව - හලාවත -කව/C30/180/2010(COL)

රාජකාරියේ යෙදී සිටිය දී වෙනත් සේවකයෙකු විසින් පහර දීමක් සිදුකර ශාරිරික හානියක් සිදුකළ බවට සඳහන් වන්දි නඩුවකි. මෙම පහරදීම අදාලව මූලික පරීක්ෂණ පවත්වා පහර දුන් සේවකයා වෙත දඬුවම් ලබා දී ඇත. මෙම නඩුව පවරා ඇති එස්.එම්.එන්.පී. වර්ණකීර්ති නැමැත්තා මණ්ඩලයෙන් වන්දි මුදලක් ඉල්ලා ඇත. මෙම නඩුව දැනට විභාග වෙමින් පවතී.

### II.කුරුණෑගල කම්කරු විනිශ්වය සභාව - 23KU/9799/200

ස්ථාන මාරුවීමක් හේතුවෙන් සේවයට වාර්තා නොකිරීම මත විනය පරීක්ෂණයක් පවත්වා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව සේවයෙන් පහකිරීම හේතුවෙන් නැවත රැකියාව ලබාගැනීම සඳහා කම්කරු විනිශ්වය සභාවේ මෙම නඩුව පවරා ඇත්තේ එස්.එම්.එන්.පී. වර්ණකිර්ති නැමැත්තෙකු විසිනි. මෙම නඩුව දැනට විභාගවෙමින් පවතී.

## 7. උපරිමාධිකරණ නඩු අංක - SC/HC/LA/81/2012

සේවයෙන් ඉල්ලා අස්වී ඇති ජ්.එස්.එම්. ගුණසේකර යන මණ්ඩලයේ සේවකයෙකු විසින් ඔහුට සිදුවූවායැයි සඳහන් අසාධාරණකම් සඳහා මණ්ඩලයෙන් වන්දි ඉල්ලා පවරන ලද නඩුවකි. මෙම නඩුව සඳහා කම්කරු උසාවියේ ලබාදෙන ලද තීන්දුව සඳහා මණ්ඩලය මගින් දැනට උපරිමාධිකරණයේ අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනය දැනට විභාග වෙමින් පවතී.

# මණ්ඩල විසින් පවරා ඇති නඩු

## 1. කඩුවෙල දිසා අධිකරණය 82/M

විදේශ රැකියාවකට යාම සඳහා නිවාඩු ලබාගෙන විදේශගත වී ගිවිසුම් ප්‍රකාර නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් ගිවිසුමේ සඳහන් වන්දි මුදල ලබා ගැනීම සඳහා මණ්ඩලය විසින් එන්.එස්.කේ. විජේනායක නැමැත්තෙකු වෙත පවරා ඇති මෙම නඩුව දැනට කඩුවෙල දිසා අධිකරණයේ දී විභාග වෙමින් පවතී.

## 2. කොළඹ දිසා අධිකරණය නඩු අංක 26624 MR - ඩබ්ලිව්.ජේ.වාස් සහ සමාගම

මණ්ඩලීය ආදර්ශ බීජ පොල් උයන් වලින් ලබා ගන්නා ලද පොල් සඳහා ලබාදුන් චෙක්පත් අගරුවීම හේතුවෙන් අය විය යුතු රුපියල් 1,335,600 ක මුදල අය කර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ පොල් වගාකිරිමේ මණ්ඩලය විසින් ගොනු කරන ලද නඩුවකි. මෙම මුදල ගෙවීම සඳහා අධිකරණය විසින් නියම කර ඇති අතර, විත්තිකරුවන් විසින් එම තීන්දුව අභියාචනාධිකරණයට ඉදිරිපත් කර දැනට විභාග වෙමින් පවතී.

## 3. කොළඹ දිසා අධිකරණය නඩු අංක 25030 - වෙස්ටන් බ්‍රෝකර්ස් සමාගම.

මණ්ඩලීය ආදර්ශ බීජ පොල් උයන් වලින් චෙක්පත් මත නිකුත් කරන ලද පොල් ගෙඩි සඳහා ලබාදුන් චෙක්පත් අගරුවීම නිසා වෙස්ටන් බ්‍රෝකර්ස් සමාගමෙන් අය විය යුතු මුදලකි. මෙම මුදල ලබා ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇති නමුත් අදාල සමාගමේ හිමිකරුවන් ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් ද සමඟ රට හැර ගොස් ඇති බැවින් සිතාසි භාරදීමට අංක සොයා ගත නොහැකි බව වාර්තා කර ඇති නඩුවකි. මේ සමඟ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර ඇත.

## 4.1.1 සහනාධාර ගෙවීම්.

අ) පොල් ඉඩම්වල පුනරුත්ථාපන කටයුතුවල දී ඉඩමේ තිබෙන පාළු පැළ සිටුවීම වැදගත් අංගයකි. මේ සඳහා අයදුම්පත් කැඳවා ඒ අනුව පැළ ලබා දෙනු ලැබේ. එහෙත් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන වෙනත් පැළ සිටුවීමේ වැඩසටහන් මඟින්, විශේෂයෙන්ම දිවිනැඟුම හා කප්රුක පුරවර වැඩසටහන යටතේ මෙවැනි බාධාවකින් තොරවම මෙම ඉඩම්වලට පොල් පැළ ලබාදේ. එමනිසා

පුනරුත්ථාපන නම යටතේ පාළුපැළ නොසිට වූවත් එම ඉඩමේ විවිධාකාරයෙන් පැළ සිටුවා අරමුණට ලඟාවේ. එසේම 2010 වනවිට වසරකට නිෂ්පාදනය වූ පොල් පැළ මිලියන 2.5 ක ප්‍රමාණය 2012 වර්ෂයේ දි මිලියන 9 දක්වා ඉහළ යාමෙන් පෙනෙන්නේ කිනම් ආකාරයකට හෝ විශාල පොල් පැළ සංඛ්‍යාවක් සිටුවන බවය.

ආ) පුනරුත්ථාපන සහනාධාරය ලබා ගැනීමේ දී එය ප්‍රයෝජනයට ගන්නා පොල් ඉඩම්හිමියන්ගේ ආර්ථික හැකියාව පිළිබඳ අධ්‍යයනය කිරිමෙන් පසු පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මඟින් ගත් ප්‍රතිපත්තිමය තීරණයකට අනුව පුනරුත්ථාපන සහනාධාරය යටතේ පොල් පැළ ලබාදීම හැර වෙනත් ක්‍රියාමාර්ගයකට සහනාධාර ලබාදීමත් මෙම වර්ෂයේ දී සිදු නොකෙරිණි.

ඇ) කප්රුක පුරවර ගෙවතු පොල් පැළ බෙදාදිමට ද රජය මඟින් අපගේ සහයෝගය මත ක්‍රියාත්මක කළ දිවිනැඟුම වැනි ගෙවතු වගා වැඩසටහන්වල බලපෑම ඇතිවිය. කෙසේ වූවද ප්‍රාදේශීය කාර්යාල 10 ක පමණ කාර්ය සාධනය අවම මට්ටමක ප්‍රධාන වශයෙන් හේතු වූයේ වසරේ අවසාන භාගයේ ඇති වූ මාස 08 ක පමණ නියං තත්ත්වය නිසා පොල් පැළ සිටුවීම ජනතාව දැක් වූ පසුගාමී තත්ත්වයයි.

ඈ) වාරිමාර්ග සහනාධාරය ලබා දෙනුයේ වියළි කලාපය දිස්ත්‍රික්කයන් අයත් ප්‍රාදේශීය කාර්යලයන් මඟින් පමණකි. මෙහිදී ළිඳ, ළිදෙහි ජලය තිබිම, ජලය බෙදා හැරීමේ පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක විම වැනි කරුණු පාදක කර ගෙන ඒවා සක්‍රිය තත්ත්වයේ තිබේ නම් සහනාධාර ලබාදිම සිදු කෙරේ. එහෙත් වසරේ මාස 08 ක් පමණ තිබූ දැඩි නියඟය නිසා එය පරීක්ෂා කිරීම අපහසු වූ බැවින් සමහර ප්‍රාදේශීය කාර්යාලවල අඩු කාර්ය සාධනයක් වාර්තා විය.

එසේම මාතලේ ප්‍රාදේශීය කාර්යාලයට මාතලේ, මහනුවර සහ නුවරඑළිය යන තෙත් කලාපීය දිස්ත්‍රික්ක අයත් වන බැවින් හා වියළි ප්‍රදේශ අයත් වන්නේ මාතලේ දිස්ත්‍රික්කයේ ඉතා අඩු කොටසකට බැවින් මෙම වැඩසටහන එහි ක්‍රියාත්මක නොවිය.

ඉ) ගවගාල් සහනාධාරය යටතේ එක් ගවගාලකට පොල් වගාකරුවකුට ලබාදුන් සහනාධාරය රු. 25,000/- කි. මෙහි අරමුණ වූයේ පොල් ගසට කාබනික පොහොර ලබාදීමයි. නමුත් රජයේ වෙනත් ආයතනයක් වන සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මෙවැනි ගවගාල් සඳහා කිරි නිෂ්පාදනය අරමුණු කර ගනිමින් රු. 35,000/- සහනාධාරයක් වගාකරුවනට ලබා දෙන ලදී. මෙම තත්ත්වය යටතේ අපගේ සහනාධාරය ආකර්ෂණීය නොවූ අතර මේ හේතුවෙන් 59% ක ප්‍රගතියක් මෙන්ම ප්‍රාදේශීය කාර්යාල 06 ක අඩු කාර්ය සාධනයක් වාර්තා විය. මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ගවගාල් ඉදිකළ හැකි සියළුම පහත් ප්‍රදේශවල

වැලිගම රෝගය පවතින බැවින් ඉතිරි වී ඇති කඳු සහිත ප්‍රාදේශවල මේ සහනාධාරයට ඉල්ලුමක් නොවිය.

## 4.1.2. ආදර්ශ පොල් උයන්.

(අ) 2012 වර්ෂයේදී මුළු පොල් එලදාව ගෙඩි මිලියන 7.39 ක්ය. එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 17% ක වර්ධනයකි. පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් පාලනය කරනු ලබන ආදර්ශ පොල් උයන් සඳහා විධිමත් කෘෂිකාර්මික ක්‍රමවේද අනුගමනය කිරීමත්, නව තාක්ෂණික ක්‍රමවේද අනුගමනය කිරීමත්, මනා කළමණාකරණයත් නිසා, මේ ආකාරයේ පොල් අස්වැන්නේ වර්ධනයක් ලබාගත හැකිය.

(ආ) පොල් පර්යේෂණ ආයතනයේ ප්‍රකාශන සහ පර්යේෂණ මතය අනුව පොල් ඉඩම්වල පාංශු තත්ත්වය අනුව $S_1$ සිට $N_2$ දක්වා කලාප 7ට වර්ග කර ඇත. පොල් වගාකිරීමේ මණ්ඩලයේ පොල් ඉඩම් වලින් 75% ට වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ $S_4$ කලාපයේ වේ.

$S_4$ කලාපයේ විභව පොල් අස්වැන්න අක්කරයකට ගෙඩි 2024 සිට 4048 ක් දක්වා වූ ප්‍රමාණයක පවතින බව පොල් පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනය අනුව පැහැදිලි කර ඇත. මේ අනුව මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් අතරින් බහුතරයක් මෙම විභව අස්වැන්න ලහා කරගෙන ඇත. $S_4$ කලාපයේ වාර්ෂිකව අක්කරයට පොල් 4000 ක අස්වැන්නක් ලබා ගත හැක්කේ, පොල් වගාව සඳහා සුදුසු පසක්, සහ යහපත් කාලගුණික තත්වයක් තුළිනි. ඒ අනුව මණ්ඩලීය වතුවලින් උතුරු ප්‍රදේශයේ වතු කිහිපයක් හැර ඉතිරි වතු $S_4$ කලාපය තුළ ලැබිය හැකි සාමාන්‍ය පොල් අස්වැන්න ලබා ඇත.

ඊට අමතරව මණ්ඩලය මගින් පාලනය කරන පලෙයි ආදර්ශ පොල් උයන, කොරෙයි ආදර්ශ පොල් උයන යන ආදර්ශ පොල් උයන් දෙක උතුරු නැගෙනහිර පළාත්වල පිහිටා ඇති ඉඩම් දෙකකි. පසුගිය වකවානුවේ රටේ පැවති යුධමය වාතාවරණය තුළ මෙම ඉඩම් නිසි කළමණාකරණයකින් තොරවීමේ හේතුව මත නිසි සංවර්ධන කටයුතු ඉටු වී නැත. නැවත සාමය උදාවීමත් සමඟ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත. ඒ හේතුවෙන් මෙම ආදර්ශ පොල් උයන්වල පොල් අස්වැන්න ඉදිරියේදී අපේක්ෂිත මට්ටම කරා ඉහළ මට්ටමකට පත්වේ.
ලේනව ආදර්ශ පොල් උයනේ එළදාව අඩුවීමට හේතුව 4.1.2 (ඇ) යටතේ දක්වා ඇත.

(ඇ) ලේනව ආදර්ශ පොල් උයනේ 2012 වර්ෂයේ වාර්ෂික පොල් අස්වැන්න පොල් ගෙඩි 960,650 ක් විය. මෙම ආදර්ශ පොල් උයනේ සමස්ත පොල් ගස් ප්‍රමාණය 22,510 කි. එම ගස් පහත සඳහන් වයස් කාණ්ඩ වලට අයත් වේ.

| වයස් කාණ්ඩය අවුරුදු | පොල් ගස් ප්‍රමාණය |
|---|---|
| 0 - 4 - ඵල නොදරණ | 2,477 |
| 5- 9 - ඵලදැරීම ආරම්භක අවස්ථාව | 3,000 |
| 10-19 - සාර්ථක ඵලදාව ලැබෙන | 4,881 |
| 20–49 - සාර්ථක ඵලදාව ලැබෙන | 8,253 |
| 50 ට වැඩි - ඵලදාව අඩුවන | 3,899 |
| **එකතුව** | **22,510** |

ඒ අනුව මෙම ආ.පො.උ. සාර්ථක ඵලදාවක් ලැබෙන පොල් ගස් ප්‍රමාණය 13,134 කි. (4881 + 8253 = 13,134 ) මෙම ප්‍රමාණයට ඵලදාව අඩුවීමට පත්ව ඇති වයස අවුරුදු 50 ඉක්මවූ ගස් 3,899 ඇතුළුව සමස්ත ඵලදරණ ගස් ප්‍රමාණය 17,033 කි.

ඒ අනුව වත්තේ සාමාන්‍ය වාර්ෂික පොල් ඵළදාව ගසකට ගෙඩි 56.4 කි. ( 960,650 / 17,033 = 56.4) කෙසේ වෙතත් ඵලදරණ ගස් 2162 ක් ඇති ක්ෂේත්‍ර අංක 02 කොටසේ පොල් ඵළදාව ගෙඩි 171,774 ක් ලබා ගෙන ඇති අතර, එහි ගසක ඵලදාව සාමාන්‍යයෙන් 79.5 ක් පමණ වන අතර, ඵලදරණ ගස් 4,849 ක් ඇති ක්ෂේත්‍ර අංක 03 කොටසේ වාර්ෂික ඵලදාව ගෙඩි 338,562 ක් වන අතර, එහි සාමාන්‍ය ගසක ඵලදාව 69.8 ක් පමණ ඉහළ ප්‍රමාණයක් ගනී. ඒ අනුව වත්තේ වැඩි ප්‍රමාණය නව වගා ඇති කිරීම හේතුවෙන් ඵලදරණ ගස් විවිධ වයස් කාණ්ඩවලට ඇතුලත් වීම නිසා ගසක සාමාන්‍ය ඵලදාව අඩු මට්ටමක් දැනට පැවතියත් ඉදිරියේදී දැනට ආරම්භ කර ඇති පැළ වගාව ඵලදරණ මට්ටමට පත්වීමත් සමඟ ගසක සාමාන්‍ය ඵලදා මට්ටම ඉහළ යාම සිදු වේ.

(ඈ) පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන්වල සමහර ක්ෂේත්‍රවල පැරණි වගාව තුළ යටි වගාව යොදා ඇත. එම නව වගාව ඇති ක්ෂේත්‍රවල උසින් වැඩි ගස්වල පොල් නෙලීම සඳහා උස කෙකි යොදා ගැනීම අපහසුය. එයට අමතරව මෙම උස ගස්වල ඵළදාවද අඩු මට්ටමක පවතින බැවින්, ගස් නැගුම්කරුවන් යොදා අස්වැන්න නෙලීමට අධික වියදමක් දැරීමට සිදුවේ. එබැවින් එම ගස්වල ඵලදාව නෙලීම සිදු නොකරයි. එනිසා වැටුන පොල් ප්‍රතිශතය අධික වීමට එය හේතු වී ඇත. මෙවැනි වතුවල පොල් ඵලදාව වැටීමට ඉඩහැර දිනපතා නියමිත ක්‍රමවේදයකට සමීප අධීෂණයකින් යුතුව පොල් අස්වැන්නට එකතු කරන බැවින් වැටුණු පොල් ප්‍රමාණය ඉහළ අගයක් ගෙන ඇත.

4.1.3 වැලිගම පොල් කුණුවීමේ හා මැලවීමේ රෝගයේ ගස් ඉවත් කිරීම සඳහා තිබෙන ජනතා ප්‍රතික්ෂේපය මීට හේතු වේ. ජනතාව කලබල නොවන ආකාරයට මෙය සිදු කළ යුතුය.

1999 ශාක ආරක්ෂණ පනතට අනුව ගස් ඉවත් නොකරන වගාකරුවන්ට විරුද්ධව නීති ප්‍රකාර කටයුතු කළ යුතු වුවත්, මෙතෙක් මෙම පනත හරහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නඩු පවරා නැති බැවින්, නීතිපති දෙපාර්තමේන්තුව ද මෙම පනතේ අඩුලුහුඩුකම් දක්වා නීතිමය ක්‍රියාමර්ග ගැනීම බැහැර කරන ලදි.

කෙසේ වුවද, පනත ප්‍රකාරව පොල් ගස් විනාශ කිරිමේ බලය අප සතු බැවින් පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශ පරිදි ගස් එන්නත් කර විනාශ කිරිම ආරම්භ කර ඇත.

එහෙත් මෙම වසර තුල 2008 සිට මේ දක්වා ගස් ඉවත් කිරිම් ඉහළම ප්‍රගතිය වාර්තා කරමින් ගස් 79,156 ක් ඉවත් කර ඇත.

4.1.4 ප්‍රජා පොල් පැළ තවාන් කිහිපයක් පිහිටුවා තිබුනේ පොල් පර්යේෂණ ආයතනයේ ප්‍රකාශිත රෝග කලාපයට පිටින් තිබෙන ආරක්ෂිත කලාපයට ද පිටින් පිහිටි නිරෝගී පොල් ගස් තිබෙන ග්‍රාම සේවා කොට්ඨාශවල වේ. මෙය ආරක්ෂක මුර කපොලුවලට ද පිටින් පිහිටි ප්‍රදේශයකි. එමනිසා අවදානම් නැත යන්න අපගේ අදහසයි. එසේ වුවද එම ප්‍රදේශයේ නැවත ප්‍රජා තවාන් ඇති නොකරන ලෙස මේ වනවිට උපදෙස් ලබා දී ඇත. (උදාහරණයක් ලෙස අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය රෝගය සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇතත්, රෝගී කලාපයට අයත් වන්නේ එක් ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශයක් පමණි. ආරක්ෂිත කලාපයට අයත් වන ග්‍රාම සේවා වසම් ගණන 16 කී. රෝගය කොහෙත්ම නොවන ආරක්ෂිත කලාපයෙන් ද පිටත පිහිටි ග්‍රාම සේවා වසම් ගණන 11 කී.)

4.1.5 60% ක් කාර්ය සාධනයක් දක්වා ඇති එක් වැඩසටහන වනුයේ ව්‍යාප්ති සේවා කාර්යාල මණ්ඩලය සඳහා පරිගණක භාවිතය පිළිබඳ පුහුණුවයි. මේ සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ සම්පත් සීමිත බැවින් කුළියාපිටිය බහු තාක්ෂණික ආයතනයේ සේවාව ලබා ගැනීමට කටයුතු කළ ද එම ආයතනය විසින් එම පහසුකම් ලබා දෙනු ලැබුවේ 2012 දෙසැම්බර් මාසයේදිය. ඒ අනුව ප්‍රගතිය 60% ක් විය.

මේ වනවිට 2012 මහ කන්නයේ පොල් පැළ උපරිම සීමාවට ලඟා වී තිබූ බැවින්, පොල් සංවර්ධන නිලධාරීන් ඊට ලබා ගත නොහැකිවීම ද මෙයට බලපාන ලදී.

60% ක් වූ දෙවැනි වැඩසටහන වනුයේ වගාකරුවන්ට තාක්ෂණික කරුණු සම්ප්‍රේෂණය කරනු ලබන දෙදින වැඩසටහනයි. මෙහිදි වගාකරුවන්ගේ ඉල්ලීම පරිදි දින දෙකක වැඩසටහන ගණන සීමාවීම එහි ප්‍රගතිය 60% ක් විය. එහෙත් ඔවුන්ගේ ඉල්ලීම පරිදි එක් දින පුහුණු වැඩසටහන පැවැත් වූ අතර, එහි ප්‍රගතිය 190% දක්වා වැඩිවී ඇත.

60% ක් වූ ඊළඟ ප්‍රගතිය වාර්තා වනුයේ කප්රුක පුරවර වැඩසටහනෙහි රෝග හා පලිබෝධ මර්දන කළමනාකරණ වැඩ මුළුවේය. මේ සඳහා විශේෂඥ නිලධාරීන් සිටිනුයේ එක් අයෙකු බැවින් මෙම වැඩසටහනේ ප්‍රගතිය 60% කට සීමා කිරීමට සිදු විය. නිලධාරීන් බඳවා ගැනිමට මේ වනවිට කටයුතු කරමින් පවතී.

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය කළමනාකරුවන් විසින් මෙහෙයවනු ලබන පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන 55% කට සීමා වී ඇත්තේ පොල් සංවර්ධන නිලධාරීන් පොල් පැළ බෙදිමේ මිලියන 09 ක ඉහළ ඉලක්කයකට යැම හේතුව නිසා ක්ෂේත්‍ර කටයුතු බහුලවීමයි.

62% ක් වූ ඊළඟ ප්‍රගතිය වාර්තා වනුයේ ග්‍රාමීය සංවිධානවල සාමාජික පුහුණු වැඩසටහන්වල වේ. මෙහි ප්‍රගතිය අඩුවීමට හේතුව වනුයේ ද මෙම වැඩසටහන මෙහෙයවනු ලබන පොල් සංවර්ධන නිලධාරීන්ගේ කාර්ය බහුලතාවයි.

5.1 ආදර්ශ පොල් උයන් ඇතුළු සමස්ත ස්වයං මූල්‍ය ඒකකය සඳහා සවිස්තරාත්මක අයවැය වාර්තා සකස් කර ඇති නමුත්, එහි ඇති සංකීර්ණ තත්ත්වය නිසා එම අයවැය වාර්තාව සහ සාරාංශ වාර්තාව පමණක් මණ්ඩලීය අයවැය වාර්තාවට ඇතුලත් කිරීම මෙතෙක් සිදු කර ඇත. ඉදිරියේදී අදාළ සවිස්තරාත්මක වාර්තාව ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.



(සරත් කීර්තිරත්න),
සභාපති,
පොල් වගාකිරීමේ මණ්ඩලය.